# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2006 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත | I |
| 2. | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත | XI |
| 3. | 2006 අංක 9 දරන මුදල් නීති (සංශෝධන) පනත | XXX |
| 4. | 2006 අංක 11 දරන මුදල් පනත | XXXI |
| 5. | 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත | XXXV |
| 6. | 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත | XXXVII |
| 7. | 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත | XLVI |

# 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 06 වන දින]

**ශ්‍රී ලංකාවෙහි මුදල් විශුද්ධිකරණය තහනම් කිරීම සඳහා ද; මුදල් විශුද්ධිකරණ මර්දනය කිරීම සහ වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර සැලැස්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1. මේ පනත 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ පනතේ විධිවිධාන-

(අ) ශ්‍රී ලංකාවේ වාසිකව සිටිය දී මේ පනතේ විධිවිධාන යටතේ වරදක් කරන තැනැත්තකු;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ වූ වරදක් සිදුකිරීම සඳහා යොදාගන්නා ආයතනයක් වන ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරගෙන යන හා ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ නැතහොත් ලියාපදිංචි කළ ආයතනයක් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ බැංකුවක ශාඛාවක් ලෙස සංස්ථාගත කළ නැතහොත් ලියාපදිංචි කළ ශාඛාවක්;

(ඇ) මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද වරදක් සංයුක්තවන ක්‍රියාවක් හා,

සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

## I වන කොටස

## මුදල් විශුද්ධිකරණය

3. (1) යම් දේපළක් ඍජුවම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ බව දැනුවත්ව හෝ දැනගනු ලැබීමට හේතු ඇතිව-

(අ) එසේ ඍජුවම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් නැතහොත් යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ හෝ යම් දේපළක් පිළිබඳ ගනුදෙනුවක ඍජුවම හෝ වක්‍රව යෙදෙන;

(ආ) ඍජුවම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමින් නැතහොත් යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ යම් දේපළක් භාරගන්නා, සන්තකයේ තබා ගන්නා, සඟවා ගන්නා, බැහැර කරන හෝ ශ්‍රී ලංකාවට ගෙන එන, ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යනු ලබන හෝ ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන,

යම් තැනැත්තෙක් මුදල් විශුද්ධිකරණ වරදට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, ඒ වරද කරන ලද්දේ යම් දේපළක් පිළිබඳව ද ඒ දේපළෙහි වටිනාකමට නොඅඩු හා ඒ වරද කරන ලද්දේ යම් දේපළක් පිළිබඳව ද ඒ දේපළෙහි වටිනාකම මෙන් තුන් ගුණයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොඅඩු හා අවුරුදු විස්සක් නොඉක්මවන කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය. මුදල් විශුද්ධිකරණ වරදට මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තකුගේ වත්කම්, මේ පනතේ II වන කොටස ප්‍රකාරව රජය සතු කරනු ලැබීමට යටත් වන්නේය.

(2) මුදල් විශුද්ධිකරණ වරද සිදු කිරීමට තැත් කරන හෝ කුමන්ත්‍රණය කරන හෝ එම වරද කිරීමට ආධාර හෝ අනුබල දෙන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාග යකින් පසු වරදරු කරනු ලැබූ විට, මුදල් විශුද්ධීකරණ වරද සඳහා නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයටම යටත් වන්නේ ය.

මේ උපවගන්තියේ, "අනුබලදීම", යන්නට, දණ්ඩනීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(3) නීති විරෝධී ක්‍රියාකරකම චූදිතයා කර තිබීම සඳහා වරදකරු කිරීමත් මේ පනතේ විධිවිධාන යටතේ වන වරද ඔප්පු කිරීම සඳහා අවශ්‍ය නොවන බව, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

4. යම් තැනැත්තකු විසින් අත්කර ගෙන තිබෙන යම් චංචල හෝ නිශ්චල දේපළක්-

(අ) ඒ දේපළ මුදල් නම්, එය-

(i) ඒ තැනැත්තාගේ ප්‍රකට ආදායමේ හෝ ලැබීම්වල කොටසක් නොවන්නේ නම් හෝ කොටසක් විය නොහැකි නම්; හෝ

(ii) ඒ තැනැත්තාගේ ප්‍රකට ආදායම හෝ ලැබීම් පරිවර්තනය කර තිබෙන මුදල් හෝ පරිවර්තනය කරනු ලැබූ මුදල් නොවන්නේ නම් හෝ විය නොහැකි නම්; හෝ

(ආ) ඒ දේපළ මුදල් නොවන වෙනත් යම් දේපළක් නම්, එය-

(i) ඔහුගේ ප්‍රකට ආදායමේ හෝ ලැබීම්වල යම් කොටසකින් අත්කරගන්නා ලද දේපළක් නොවන්නේ නම් හෝ විය නොහැකි නම්; හෝ

(ii) ඔහුගේ ප්‍රකට ආදායමේ හෝ ලැබීම්වල කොටසක් නොවන්නේ නම් හෝ කොටසක් විය හැකි දේපළක් නොවන්නේ නම්; සහ

(iii) ඔහුගේ ප්‍රකට ආදායමේ හෝ ලැබීම්වල යම් කොටසක් පරිවර්තනය කර තිබෙන හෝ පරිවර්තනය කරනු ලැබූ දේපළක් නොවන්නේ නම් හෝ විය නොහැකි නම්,

මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරන තෙක්, ඒ චංචල හෝ නිශ්චල දේපළ සෘජුවම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලක් ව්‍යුත්පන්න වී හෝ උපලබ්ධි වී ඇති බවට මේ පනත යටතේ යම් නඩු කටයුත්තක කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

5\. (1) යම් දේපළක් යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්නව හෝ උපලබ්ධිව තිබෙන බවට තමා විසින් කරගෙන යන යම් කර්මාන්තයක, වෘත්තියක, ව්‍යාපාරයක හෝ සේවා නියුක්තියක ක්‍රියාවලියේ දී තමා විසින් ලබාගන්නා තොරතුරුවලින් හෝ වෙනත් කාරණාවකින් හෝ දන්නා වූ හෝ විශ්වාස කිරීමට හේතු තිබෙන්නා වූ හෝ කවර හෝ තැනැත්තකු විසින්, ප්‍රායෝගිව හැකිතාක් ඉක්මණින් ඔහු දැනගත් කරුණ හෝ ඔහු විශ්වාස කරන කරුණු මූල්‍ය බුද්ධි ඒකකය වෙත හෙළිදරව් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින කවර හෝ තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකින් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(3) යම් දේපළක් යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්නව හෝ උපලබ්ධිව තිබෙන බවට තමාගේ දැනීම සහ විශ්වාසය 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව යම් ආයතනයක අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ සේවකයකු විසින් හෙළිදරව් කිරීම, (1) වන උපවගන්තියෙන් ඔහු වෙත පැනවී ඇති කාර්යය සඳහා ප්‍රමාණවත්ව හෙළිදරව් කිරීමක් වන්නේ ය.

(4) යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරව තොරතුරු හෙළිදරව් කිරීම කෙරෙහි පැනවී තිබෙන, රහස්‍යභාවය පිළිබඳව හෝ වෙනත් සීමා කිරීමක් හෝ යම් බැඳීමක් පැවතුන ද ඒ නොතකා (1) වන උපවගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර ක්‍රියාකරමින් කරන යම් හෙළිදරව් කිරීමක්, එකී බැඳීම හෝ සීමාකිරීම උල්ලංඝනය කිරීමක් ලෙස නොසැලකිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ වරදක් පිළිබඳ නඩු පැවරීමක දී තමාගේ දැනීම හෝ විශ්වාසය හෙළිදරව් නොකිරීමට තමාට සාධාරණ හේතු තිබුණු බව චූදිතයකු විසින් අධිකරණයට සම්භාව්‍යතා වැඩිබර මත ඔප්පු කිරීම චූදිතයා සඳහා විත්තිවාචකයක් වන්නේ ය.

6\. මුදල් විශුද්ධිකරණ වරදක් කිරීම පිළිබඳ විමර්ශනයක් කර තිබෙන බව, කරගෙන යන බව හෝ කිරීමට ආසන්නව තිබෙන බව දන්නා වූ හෝ විශ්වාස කිරීමට හේතු තිබෙන්නා වූ සහ-

(අ) මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටු කිරීමේ දී හැර එම කාරණය හෝ එම විමර්ශනයට අදාළ වෙනත් යම් තොරතුරක්, හෙළිකිරීමෙන් එම විමර්ශනයට අගතියක් වීමට ඉඩ තිබෙන බව දැන දැනම, එම කාරණය හෝ තොරතුරු යම් අධිකරණයකට හෝ වෙනත් යම් තැනැත්තකුට හෙළිකරන; හෝ

(ආ) මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටුකිරීමේ දී හැර, එම විමර්ශනය කරන ලද්දේ හෝ කරගෙන යනු ලබන්නේ හෝ කිරීමට ආසන්නව පවතින්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තාගේ අනන්‍යතාව හෙළිකරන ; හෝ

(ඇ) එම විමර්ශනයට අදාළ වන හෝ අදාළ වීමට ඉඩ තිබෙන යම් ලේඛනයක් හෝ දෙයක් දැන දැනම වරදවා පෙන්වන, වසන් කරන, විනාශ කරන හෝ අන්‍යාකාරව බැහැර කරන හෝ වරදවා පෙන්වීමට, වසන් කිරීමට, විනාශ කිරීමට හෝ බැහැර කිරීමට සලස්වන හෝ අවසර දෙන,

කවර හෝ තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාග යකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකින් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

## II වන කොටස

## මුදල් විශුද්ධිකරණ වරද හා සම්බන්ධ වත්කම් ක්‍රියා විරහිත කිරීම සහ රාජ සන්තක කිරීම

7. (1) යම් තැනැත්තෙක් මුදල් විශුද්ධිකරණ වරදට සම්බන්ධ යම් ක්‍රියාකාරකමක යෙදී සිටින බව විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු පවතින සහ එම ක්‍රියාකාරකමට අදාළව තවත් ක්‍රියා සිදු කිරීම වැළැක්වීම පිණිස අවශ්‍ය වන අවස්ථාවක, එම වරද කිරීම සඳහා උපයෝගී කරගෙන තිබිය හැකි හෝ උපයෝගී කර ගැනීමට අරමුණු කරගත් යම් ගිණුමකට, දේපළකට හෝ ආයෝජනයකට අදාළ කවර හෝ ගනුදෙනු කිරීම් තහනම් කරන (මෙහි මින් මතු ''ක්‍රියා විරහිත කිරීමේ නියමය'', යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක්, පොලිස් අධිකාරී නිලයට පහත් නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ එවැනි නිලධරයකු නොමැති අවස්ථාවක සහකාර පොලිස් අධිකාරවරයකු විසින් හෝ කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබාගන්නා ක්‍රියා විරහිත කිරීමේ නියමයක්-

(අ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ක්‍රියාකාරකමට සම්බන්ධ බවට විශ්වාස කරන තැනැත්තා වෙත ; සහ

(ආ) ඒ නියමය ක්‍රියාත්මක කිරීමට නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙත,

නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අත්හිටුවීමේ නියමයක්, 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම නියමය කල දින සිට දින හතක කාලසීමාවක් බලාත්මකව පැවතිය යුතු ය.

(4) තමා වෙත නිකුත් කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකක් නැතහොත් ක්‍රියා විරහිත කිරීමේ නියමය උල්ලංඝනය කරමින් කළ ගනුදෙනුවලට විෂයය වී තිබෙන ගිණුමේ, දේපළෙහි හෝ ආයෝජනයේ වටිනාකමින් එක හමාරක කොටසක් යන මෙයින් වඩා වැඩි මුදල නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

8. (1) 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියාවිරහිත කිරීමේ නියමයක් නිකුත් කරන පොලිස් නිලධරයා විසින් ඒ නියමය බලාත්මකව පවතින දින හත ඇතුළත එම ක්‍රියා විරහිත කිරීමේ නියමය තහවුරු කරවා ගැනීම සඳහා සහ අවස්ථාගත තත්ත්වය අනුව අවශ්‍ය වන්නේ නම් එම දවස් හතක මුල් කාලසීමාව දීර්ඝ කරවා ගැනීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) එම ක්‍රියා විරහිත කිරීමේ නියමය කිරීම සඳහා ප්‍රමාණවත් හේතු පවතින බවට මහාධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක-

(අ) 12 වන වගන්තිය යටතේ කරනු ලැබියහැකි යම් නියමයන්ට යටත්ව; සහ

(ආ) එසේ දීර්ඝ කිරීමක උපරිම කාලසීමාව පොලිස් නිලධරයා ඒ නියමය කළ දිනයේ සිට එක් අවුරුද්දක් නොඉක්මවිය යුතු ය යන නියමයට යටත්ව, අධිකරණය විසින් ඒ නියමය තහවුරු කර අවශ්‍ය යයි අධිකරණය සලකන යම් කාලසීමා සඳහා එය දීර්ඝකිරීම සඳහා කර තිබෙන ඉල්ලීමට ද ඉඩ දිය හැකි ය:

එසේ වුව ද, අත්හිටුවීමේ නියමයට යටත් ගිණුමට, දේපළට හෝ ආයෝජනයට අදාළව, අයථා ලෙස ඉපයූ මුදල් විශුද්ධිකරණය කිරීමේ වරදක් සම්බන්ධයෙන් අධිචෝදනා ගොනු කර තිබෙන අවස්ථාවක, එම අත්හිටුවීමේ නියමය අධිකරණය විසින් ඊට හේතු වාර්තාගත කොට අවලංගු කළහොත් මිස, එම අත්හිටුවීමේ නියමය, ඒ වරද සම්බන්ධ නඩු විභාගය නිම වන තෙක් හෝ එම වරදකරු කිරීමට විරුද්ධව අභියාචනයක් කරනු ලැබූ අවස්ථාවක එම අභියාචන විභාගය නිම වන තෙක් හෝ බලාත්මකව පැවතිය යුතු ය.

(3) අත්හිටුවීමේ නියමයක් මහාධිකරණය විසින් (2) වන උපවගන්තිය යටතේ තහවුරු කරනු ලැබූ අවස්ථාවක එම අත්හිටුවීමේ නියමයට විෂයය වී තිබෙන ගිණුමට, දේපළට හෝ ආයෝජනයට තමන්ගේ හිමිකම්පෑම් අධිකරණයෙහි සනාථ කිරීමට සද්භාවී තුන්වන පාර්ශ්වවලට පහසුකම් සලසනු පිණිස, ඒ පිළිබඳ දැන්වීමක් සිංහල භාෂාවෙන්, දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළ කෙරෙන යටත් පිරිසෙයින් එක් එක් පුවත්පතක පළකිරීමට සැලැස්විය යුතු ය.

9. ක්‍රියා විරහිත කිරීමේ නියමයක් බලාත්මකව පවතින අතරතුර එවැනි ගිණුමකට, දේපළකට හෝ ආයෝජනයකට අදාළව කිසිදු ගනුදෙනුවක් සිදු නොකළ යුතු අතර, එසේ සිදු කරන යම් ගනුදෙනුවක් ශුන්‍ය හා බලරහිත වන්නේ ය.

10. 7 වන වගන්තිය යටතේ කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමයක් තහවුරු කිරීමේ දී, එවැනි නියමයක් බලපාන්නා වූ යම් තැනැත්තකුගේ නීත්‍යානුකූල ව්‍යාපාරයකට හෝ වෙනත් වාසියකට එයින් හානියක් විය හැකි බව සහ එම ගිණුමට, දේපළට හෝ ආයෝජනයට අදාළ හා ඒ ක්‍රියා විරහිත කිරීමේ නියමයෙන් තහනම්ව තිබිය හැකි අත්‍යවශ්‍ය ගනුදෙනු නීත්‍යානුකූලව සිදු කළ හැකි බව අධිකරණයේ මතය වේ නම්, තත් කාර්යය සඳහා අධිකරණය පත්කරන තැනැත්තකුගේ හෝ 11 වන වගන්තිය යටතේ

ඒ සඳහා පත් කරනු ලබන ප්‍රතිග්‍රාහකයකුගේ අධීක්ෂණයට යටත්ව හා විධානය යටතේ ඒ ගනුදෙනු කරගෙන යාමට අවසර දෙන ආඥාවක්, තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

11. ක්‍රියා විරහිත කිරීමේ නියමයකට විෂයය වී තිබෙන එම ගිණුම් දේපළ හෝ ආයෝජන සම්බන්ධව අධිකරණය විසින් තත් කාර්යය සඳහා දෙනු ලැබිය හැකි විධානවලට අනුකූලව ගිණුම්, දේපළ හෝ ආයෝජනවල සන්තකය භාර ගැනීමට සහ ඒ සම්බන්ධ අන්‍යාකාරව කටයුතු කිරීම සඳහා, පොලිස් අධිකාරීවරයකුගේ නිලයට පහත් නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ එවැනි නිලධරයකු නොමැති විටක සහකාර පොලිස් අධිකාරීවරයකු විසින් හෝ කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් ප්‍රතිග්‍රාහකයකු පත්කළ හැකි ය.

12. (1) පොලිස් අධිකාරීවරයකුගේ නිලයට පහත් නොවන නිලයක් දරන කවර හෝ පොලිස් නිලධරයකු විසින්, ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් යම් ගිණුමක්, දේපලක් හෝ ආයෝජනයක් සන්තකයට ගතයුතු සහ ඒවා පිළිබඳව අන්‍යාකාරව කටයුතු කළයුතු අතර, ඒ පොලිස් නිලධරයාගේ ඉල්ලීම මත සහ ක්‍රියා විරහිත කිරීමේ නියමයට සම්බන්ධ දේපළ පවතින්නේ කවරකුගේ හිමිකාරත්වය, සන්තකය හෝ පාලනය යටතේ ද යන වග නිශ්චය කරගැනීමේ කාර්යය සඳහා අධිකරණය විසින්-

(අ) (i) ඒ දේපළ හඳුනාගැනීම, තිබෙන ස්ථානය සොයාගැනීම හෝ ප්‍රමාණීකරණය;

(ii) ඒ දේපළෙහි අයිතිය, සන්තකය හෝ පාලනය තහවුරු කර දැනගැනීම,

සඳහා අදාළ වන යම් ලේඛන ඒ පොලිස් නිලධරයා වෙත අප්‍රමාදව භාර දෙන ලෙස; සහ

(ආ) නියමයේ නම් කළ ආයතනයක් සමග ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා සඳහා හෝ නියමයේ දිනයට පූර්ව හෝ පසු යම් කාලසීමාවක් තුළ පවත්වන ලද යම් ව්‍යාපාරික ගනුදෙනු පිළිබඳව එම ආයතනය ලබාගත් සියලු තොරතුරු එම ආයතනය විසින් ප්‍රතිග්‍රාහක වෙත සැපයිය යුතු බවට

අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරින බවට, ප්‍රමාද කරන බවට හෝ අන්‍යාකාරයෙන් ඊට බාධා කරන බවට සෑහීමට පත් වූ විටක, (1) වන උපවගන්තිය යටතේ ආඥාව කළ අධිකරණය විසින් එම තැනැත්තාගේ යම් පරිශ්‍රයට ඇතුළු වී පරිශ්‍රය සෝදිසි කිරීම සහ ඒ නියමය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වැදගත්වන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉවත් කර ගැනීම සඳහා එම පොලිස් නිලධරයාට බලය දෙන ආඥාවක් කළ හැකි ය.

(3) ක්‍රියා විරහිත කිරීමේ නියමය අදාළවන යම් දේපළක හිමිකාරත්වය, සන්තකය හෝ පාලනය ඇත්තේ කවර තැනැත්තකුට ද යන වග නිශ්චය කළ පසුව එම පොලිස් නිලධරයා විසින්, ඒ බව අවස්ථාවෝචිත පරිදි, එකී හිමිකාරත්වය, සන්තකය හෝ පාලනය තහවුරු කරන සහ සනාථ කරන සියලු ලේඛන ද සමග ක්‍රියා විරහිත කිරීමේ නියමය කරන අධිකරණය වෙත වාර්තා කළ යුතු ය.

13. (1) මුදල් විශුද්ධිකරණ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් සෘජුවම හෝ වක්‍රව හෝ ව්‍යුත්පන්නව හෝ උපලබ්ධිව ඇති ඒ තැනැත්තාගේ යම් චංචල හෝ නිශ්චල දේපළ, සියලු බැඳීම්වලින් නිදහස්ව, රජය සතු කළ යුතු බවට ඒ තැනැත්තා වරදකරු කරන අධිකරණය විසින් (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ආඥා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රාජසන්තක කිරීමේ තීරණයක් කළ යුතු ද යන වග නිශ්චය කිරීමේ දී, එම දේපළ ප්‍රතිෂ්ඨාවක් මත සද්භාවයෙන් මිල දී ගත්තකුගේ අයිතිවාසිකම්වලට හෝ ඒ දේපළ කෙරෙහි සද්භාවී ස්වාර්ථ සම්බන්ධතාවක් ප්‍රතිෂ්ඨාවක් මත අත්කරගත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට එවැනි ආඥාවකින් අගතියක් වීමට ඉඩ තිබේද යන කාරණය සලකා බැලීමට අධිකරණයට හිමිකම තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක්-

(අ) එම රාජ සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කර තිබෙන අවස්ථාවක එම රාජ සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරන හෝ තහවුරු කරන තීරණයක් කරනු ලැබූ විට;

(ආ) රාජ සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කිරීම සඳහා අවසර ඇති කාලසීමාව ඇතුළත ඊට විරුද්ධව අභියාචනයක් කරනු නොලැබූ අවස්ථාවක, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කිරීමට අවසර ඇති කාලසීමාව ඉකුත් වූ විට,

බලාත්මක වන්නේ ය.

(4) මුදල් විශුද්ධිකරණ වරදට වරදකරු කරනු ලැබූ තැනැත්තාට අයිති යම් චංචල හෝ නිශ්චල දේපළ, අධිකරණය සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තාගේ ප්‍රකට ආදායම් ප්‍රභවයන්ට සමාන නොවන්නේ නම් සහ එම දේපළ ඇරීම සම්භාවිතාවයේ වැඩි බර අනුව පැහැදිලි කළ නොහැකි නම්, එම දේපළ සෘජුවම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්නව

හෝ උපලබ්ධව ඇති බවට, රජය සන්තකය කිරීමේ ආඥාව කරන අධිකරණය විසින්, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා පූර්ව නිගමනය කරනු ලැබිය හැකි ය.

14. (1) මේ පනතේ 13 වන වගන්තිය යටතේ කරන ලද රාජසන්තක කිරීමේ ආඥාවකින් බලපෑමක් ඇති වී තිබෙන යම් තැනැත්තකු විසින්, ඒ ආඥාවේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට අලාභ විඳින්නට සිදු වී තිබෙන බව ප්‍රකාශ කරමින් ඒ ආඥාව කිරීමේ සිට දවස් තිහක කාලසීමාවක් ඇතුළත, ඒ රාජසන්තක කිරීමේ ආඥාව කළ අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) රාජසන්තක කිරීමේ ආඥාව කළ අධිකරණය වෙත (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ආඥාවේ ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම්කරුට අලාභ විඳින්නට සිදු වී තිබෙන බවට සෑහීමට පත්වීමෙන් පසුව, ඒ තැනැත්තාට රාජ සන්තක කළ දේපළින් වන්දි ගෙවන ලෙස එම අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

15. මේ පනතේ 13 වන වගන්තිය යටතේ යම් දේපළක් රජය සතු කර තිබෙන අවස්ථාවක, එසේ රජය සතු කරනු ලැබූ දේපළවල භාරකාරත්වය දැරීම සඳහා, එම රාජසන්තක කිරීමේ ආඥාව කරන අධිකරණය විසින් ප්‍රතිග්‍රාහකයකු පත් කළ හැකි ය.

16. තොරතුරු හෙළිදරව් කිරීම කෙරෙහි යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරව පැනවී තිබෙන, රහස්‍යභාවය පිළිබඳව හෝ වෙනත් යම් බැඳීමක් හෝ වෙනත් සීමා කිරීමක් පැවතුන ද, ඒ නොතකා, මේ පනතේ මේ කොටසේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව යම් තැනැත්තකු විසින් මේ පනතේ මේ කොටස් විධිවිධාන ප්‍රකාර ක්‍රියා කිරීමේ දී කරන යම් හෙළිදරව් කිරීමක් එකී බැඳීම හෝ සීමා කිරීම උල්ලංඝනය කිරීමක් නොවන්නේය.

## III වන කොටස

## පොදු විධිවිධාන

17. මේ පනත යටතට ගැනෙන වරදක්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කාර්ය සඳහා සංඥ්‍ය හා ඇපදිය නොහැකි වරදක් වන්නේ ය.

18. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කළ විට ඒ පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් නම් එහි සෑම අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු ද ; සහ

(ආ) ව්‍යාපාර ආයතනයක් නම්, එහි සෑම හවුල්කරුවකු ද ; සහ

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන, සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් නම් ඒ පුද්ගල මණ්ඩලයේ සෑම සාමාජිකයකු වන සෑම පුද්ගලයකු සහ ඒ පුද්ගල මණ්ඩලයේ කළමනාකරණය හා පාලනය පිළිබඳ වගකීම දරන සෑම තැනැත්තකු ද

වරදක් කරන්නේ ය :

එසේ වුව ද, එම වරද තමාගේ අනුදැනුම නොමැතිව සිදු කරන ලද බව සහ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියාකළ බව ඒ යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා ඒ වරදට වරදකරු නොවන ලෙස සැලකිය යුතු ය.

19. (1) (අ) මූල්‍ය බුද්ධි ඒකකය විසින් හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බලය දෙනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් නීත්‍යනුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකයට හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට හෝ විරුද්ධව;

(ආ) යම් ආයතනයක් විසින් හෝ ඒ යම් ආයතනයක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සිය සේවා නියුක්තියේ දී හෝ අනුයෝජිත තත්ත්වයෙන් හෝ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ මේ පනතින් නියම වී තිබෙන යම් කාර්යයක් හෝ අධිකාරියේ විධානය පරිදි වූ යම් කාර්යයක් කරගෙන යාමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් නීත්‍යනුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ ආයතනයට, අධ්‍යක්ෂවරයාට, නිලධරයාට, සේවකයාට, අනුයෝජිතයාට හෝ තැනැත්තාට විරුද්ධව

යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොහැකි විය යුතු ය.

(2) මූල්‍ය බුද්ධි ඒකකය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් සද්භාවයෙන් සපයන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් එකී මූල්‍ය බුද්ධි ඒකකයට හෝ එකී තැනැත්තාට විරුද්ධව මේ පනත යටතේ කිසි අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(3) මූල්‍ය බුද්ධි ඒකකය විසින් හෝ එකී මූල්‍ය බුද්ධි ඒකකය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් නීත්‍යනුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ ඒ මූල්‍ය බුද්ධි ඒකකය, හෝ මේ පනත යටතේ එකී ඒකකය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා

බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ එකී මූල්‍ය බුද්ධි ඒකකයට හෝ ඒ ඒකකය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බලය දෙන ලද තැනැත්තකුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් දරන ලද යම් වියදමක් සහ එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එකී මූල්‍ය බුද්ධි ඒකකයට හෝ එකී තැනැත්තාට ගෙවනු ලැබූ යම් ගාස්තු එම ඒකකය හෝ තැනැත්තා විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු, අවස්ථාවෝචිත පරිදි එකී මූල්‍ය බුද්ධි ඒකකයේ ගිණුමෙන් ගෙවනු ලැබිය යුතු ය; නැතහොත් එම ඒකකයේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ආයතනයක් විසින් හෝ එහි නිලධරයකු, සේවකයකු, අනුයෝජිතයකු හෝ තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මූල්‍ය බුද්ධි ඒකකයේ විධානය පරිදි කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ ආයතනය හෝ ඒ නිලධරයා, සේවකයා, අනුයෝජිතයා හෝ තැනැත්තා විසින් හෝ ආයතනයට, නිලධරයාට, සේවකයාට, අනුයෝජිතයාට හෝ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බවට එම අධිකරණය හෝ විනිශ්චය අධිකාරය තීරණය කළහොත්, ඒ වියදම ඒ ආයතනය හෝ නිලධරයා, සේවකයා, අනුයෝජිතයා හෝ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකරගනු ලැබුවහොත් මිස, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ගෙවිය යුතු ය.

20. (1) මේ පනත යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාවේ යෙදීම, කිරීම හෝ ඉටුකිරීම සඳහා අදාළ වන හෝ අදාළ වීමට ඉඩ තිබෙන කවර හෝ ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් කිසිම තැනැත්තකු විසින් ව්‍යාජනය කිරීම, වසන් කිරීම, නීතිවිරෝධී ලෙස විනාශ කිරීම හෝ අන්‍යාකාරව බැහැර කිරීම හෝ ව්‍යාජනය කිරීමට වසන් කිරීමට, නීති විරෝධී ලෙස විනාශ කිරීමට හෝ අන්‍යාකාරව බැහැර කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකින් හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

21. (1) කිසිම තැනැත්තකු විසින්-

(අ) පනතේ විධිවිධානවලට අනුකූලව කරන ලද යම් ආඥාවක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන හෝ අදාළවීමට ඉඩ තිබෙන යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් ව්‍යාජනය කිරීම, වසන් කිරීම, විනාශ කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ව්‍යාජනය කිරීමට, වසන් කිරීමට, විනාශ කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සැලැස්වීම ;

(ආ) මුදල් විශුද්ධිකරණ වරද හෝ විදේශ රටක නීතිය යටතේ මුදල් විශුද්ධිකරණ වරදට අනුරූප යම් වරදක් හෝ පිළිබඳ විමර්ශනයක් කරගෙන යන බව හෝ කිරීමට ආසන්න බව හෙළි කිරීම හෝ ඒ විමර්ශනයට අගතිදායක විය හැකි වෙනත් යම් තොරතුරක් අන් තැනැත්තකුට හෙළි කිරීම,

නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන දඩයකින් හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකෙන්ම හෝ දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

22. අන්තර්ජාතික වැඩපිළිවෙලක් අනුව අවශ්‍ය වන හෝ අවසර ඇති නිසා හෝ අන්‍යෝන්‍ය මිත්‍රත්වයේ යහපත් පිණිස උචිත යයි මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා සලකන අවස්ථාවක මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ රාජසන්තක කරන ලද යම් දේපළක් සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හෝ එහි වටිනාකම ඉල්ලීම කරන රජයට දෙන ලෙස හෝ එම රජය වෙත ප්‍රේෂණය කරන ලෙස අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය.

23. යම් දේපළක් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්න වී තිබෙන බව හෝ උපලබ්ධි කරගෙන ඇති බවට තමාගේ දැනීම හෝ විශ්වාසය ආයතනයක්, නිලධරයකු හෝ සේවකයකු විසින් හෙළිදරව් කරන ලද අවස්ථාවක ඒ ආයතනය, නිලධරයා හෝ සේවකයා විසින් ඉන් පසුව ඒ දේපළෙහි අයිතිකරු සමග කරනු ලබන ගණුදෙනු කිරීමකින් මේ පනත යටතේ වරදකට ඒ ආයතනය, නිලධරයා හෝ සේවකයා විසින් ආධාර හෝ අනුබල දීමක් සංයුක්ත නොවන්නේ ය.

## IV වන කොටස

## මුදල් විශුද්ධිකරණ වරද හා සම්බන්ධව උදර්පණය සහ අන්‍යෝන්‍යව සහාය වීම පිළිබඳ විධිවිධාන

24. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ උපලේඛනය එහි 'ආ' කොටසට පෙරාතුවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(47) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ අර්ථානුකූලව මුදල් විශුද්ධිකරණ වරදක්".

25. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරණ පනතේ කුමක් සඳහන්ව තිබුණ ද මේ පනතට අනුකූල වරදක් ඒ පනත යටතේ උද්දරණය කිරීමේ කාර්යය සඳහා පමණක්, පිස්කල් වරදක්, හෝ දේශපාලනීය ස්වභාවයේ වරදක් හෝ දේශපාලන වරදක් හා සම්බන්ධ වරදක් හෝ දේශපාලන හේතු වලින් පොළඹවනු ලැබූ වරදක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

26. මේ පනත යටතේ කර තිබෙන වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ හෝ වරදකරු කරනු ලැබ ඇති තැනැත්තකු උද්දරණය කරන ලෙස වෙනත් රටක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම පිණිස හෝ ඔහු උද්දරණය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ගෙන ඇති හෝ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග කවරේදැයි ඉල්ලීම කරන රජයේ ආණ්ඩුව වෙත ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නොපමාවම දැනුම් දිය යුතු ය.

27. (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම හා නඩු පැවරීම සඳහා අවශ්‍ය කවර විටක දී වුව ද 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ විධිවිධාන ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් අතර හෝ ඉහත කී පනත ප්‍රකාර ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වූ, පොදු රාජ්‍ය මණ්ඩලයේ නොවන රටවල් අතර ආධාර සපයා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් හෝ ඉහත කී පනත ප්‍රකාර ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් නොවන රටක් සම්බන්ධයෙන් වන විට, 3 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධව විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ ස්වකීය බැඳීම් ඉටුකිරීම පිණිස අවශ්‍ය වන තාක් දුරට, (සාක්ෂි හා ප්‍රකාශ ලබාගැනීම, සිතාසි භාරදීම හා සෝදිසි කිරීම් පැවැත්වීම සම්බන්ධයෙන් ආධාර වීම ඇතුළුව) සියලු ආධාර සම්මුතිගත රටකට ලබාදීම සහ එවැනි රටකින් අමාත්‍යවරයා මගින් සියලු ආධාර ඉල්ලා සිටීම ආණ්ඩුවේ කාර්යය විය යුතු ය.

(3) සම්මුතිගත රටකට ආධාර ලබාදීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

28. (1) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක, ඔහු ජාතිකත්වය දරන්නේ යම් රාජ්‍යයක ද ඒ රාජ්‍යයේ ආසන්නතම ව සිටින නිසි නියෝජිතයා සමග හෝ ඔහු අදේශික තැනැත්තකු නම්, ඔහු සාමාන්‍යයෙන් වාසය කරන රාජ්‍යයේ ආසන්නතමව සිටින නිසි නියෝජිතයා සමග හෝ අප්‍රමාදව සංදේශනය කිරීමට ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

(2) 26 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි 27 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රමාණවත්ව ක්‍රියාකර තිබෙන බවට මූල්‍ය බුද්ධි ඒකකය සෑහීමට පත්වන්නේ නම්, 27 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියාකිරීම පැහැර හැරීමක් හේතුවෙන් 26 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් යම් නීති කෘත්‍යයක කාර්ය සඳහා නිර්බල වී නොමැති ලෙස සැලකිය යුතු ය.

29. (1) මුදල් විශුද්ධිකරණ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකු සිරභාරයට ගත් අවස්ථාවක, 26 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා පිළිබඳව ඉල්ලීමක් කර තිබෙන වෙනත් යම් රාජ්‍යයක අදාළ බලධරයන් වෙත ඒ තැනැත්තා පිළිබඳව දැනුම් දෙන ලෙස, මේ පනතේ අද්මිනිස්ත්‍රාසි කටයුතු පවරනු ලැබ තිබෙන අමාත්‍යවරයා විසින් විදේශ කටයුතු භාර අමාත්‍යවරයා ගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) මුදල් විශුද්ධිකරණ වරදට අනුරූප වරදකට චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබ තිබෙන යම් තැනැත්තකු උද්දරණය කිරීම පිණිස යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට හෝ ඒ තැනැත්තා උද්දරණය කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙන තිබෙන හෝ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව, ඉල්ලීම කළ රාජ්‍යයේ ආණ්ඩුව වෙත, විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අප්‍රමාදව දැනුම් දීමක් කළ යුතු ය.

(3) මුදල් විශුද්ධිකරණ වරදට අනුරූප වරදකට චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උද්දරණය කරවා ගැනීම සඳහා ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දරණ පනත යටතේ යම් රාජ්‍යයක් විසින් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර ඒ තැනැත්තා උද්දරණය කිරීම සඳහා එම පනත යටතේ නියමයක් නොකළ යුතු බවට තීරණය කරන ලද අවස්ථාවක, එම කාරණය ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ඒ වරද සම්බන්ධයෙන් නඩු පැවරීමට හෝ වෙනත් නිසි ක්‍රියා මාර්ග යක් ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

30. (1) 27 වන වගන්තිය යටතේ ආධාර සඳහා කරන ඉල්ලීමක-

(අ) ඉල්ලීම කරන රාජ්‍යයේ නීතිය යටතේ මුදල් විශුද්ධිකරණ වරදට අනුරූප වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් හෝ නඩුවක් පවත්වාගෙන යන බව හෝ ඒ වරදට තැනැත්තකු වරදකරු කර තිබෙන බව තහවුරු කළ යුතු ය ;

(ආ) ඒ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකු පිළිබඳව විමර්ශනයක් හෝ නඩුවක් පවත්වාගෙන යන්නේ කවර හේතු මත ද යන වග නැතහොත් ඒ තැනැත්තා වරදකරු කිරීම පිළිබඳ විස්තර ප්‍රකාශ කළ යුතු ය ;

(ඇ) ඉල්ලීමෙහි සඳහන් තැනැත්තා හඳුනා ගැනීමට ප්‍රමාණවත් විස්තර තොරතුරු දැක්විය යුතු ය ;

(ඈ) (අ) ඡේදයේ සඳහන් විමර්ශනයට හෝ නඩුවට අදාළ තොරතුරු, ලේඛන හෝ ද්‍රව්‍ය හෝ දෙයක් සතුව ඇතැයි විශ්වාස කරන ආයතනයක් හෝ වෙනත් තැනැත්තකු හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් විස්තර තොරතුරු දැක්විය යුතු ය ;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් තොරතුරු ලේඛන හෝ ද්‍රව්‍ය හෝ දේවල් සියල්ලම හෝ ඉන් කිසිවක් (ඈ) ඡේදයේ සඳහන් ආයතනයෙන් හෝ වෙනත් තැනැත්තකුගෙන් ලබාගන්නා ලෙස, එම ඉල්ලීම යොමුකරන බලධරයාගෙන් ඉල්ලීමක් කළ යුතු ය ;

(ඊ) එම ඉල්ලීම ප්‍රකාර ලබාගන්නා යම් තොරතුරු, ලේඛන, ද්‍රව්‍ය හෝ දේවල් ප්‍රේෂණය කළ යුත්තේ කවර ආකාරයකින් ද හා කවරකුට ද යනවග නිශ්චිතව දැක්විය යුතු ය ;

(උ) ක්‍රියාවිරහිත කිරීමේ නියමයක් හෝ රාජසන්තක කිරීමේ නියමයක් හෝ කළ යුතු ද නැද්ද යනවග ප්‍රකාශ කළ යුතු ය ;

(ඌ) එම ඉල්ලීම ක්‍රියාත්මක කිරීමට උපකාර විය හැකි වෙනත් යම් තොරතුරු ඇතුළත් විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කරන ලද නියමයක් ප්‍රකාර මූල්‍ය බුද්ධි ඒකකය විසින් තහනමට ගත් හෝ ඊට භාර දෙන ලද හෝ ඉදිරිපත් කරන ලද යම් තොරතුරක්, ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් තැනැත්තා වෙත භාරදීමට සැලැස්විය යුතු ය.

31. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුව අතර උදර්පණ වැඩපිළිවෙලක් බලාත්මක පවතින අවස්ථාවක, ඒ වැඩපිළිවෙලට, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්යය සඳහා මේ පනතේ අර්ථකථනය කර ඇති පරිදි මුදල් විශුද්ධිකරණ වරද සහ ඒ වරද සිදු කිරීමට උත්සාහ කිරීමට හා කුමන්ත්‍රණය කිරීමට ආධාර හා අනුබල දීම හෝ ඒ වරද සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සම්බන්ධයෙන් උදර්පණය කිරීම සඳහා වූ විධිවිධාන ඒ වැඩපිළිවෙලට ඇතුළත් ලෙස සැලකිය යුතු ය.

32. යම් විදේශීය රාජ්‍යයක යම් තැනැත්තකුට විරුද්ධව මුදල් විශුද්ධිකරන වරදට අනුරූප ඒ රාජ්‍යයේ නීතිය යටතේ වූ වරදකට පවරා තිබෙන අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධව (තමන් වෙත ඇති යම් අදාළ සාක්ෂි ලබාදීම ඇතුළුව) අවශ්‍ය විය හැකි ආධාර, ආණ්ඩුව විසින් ඒ විදේශීය රාජ්‍යයේ බලධාරීන්ට ලබා දිය යුතු ය.

33. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත හෝ බලය දී ඇති යම් කාරණයක් සඳහා හෝ මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට එම නියෝග ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝග යක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

34. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්වියයුතු ය.

35. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස-

''මූල්‍යකරණය නොවන නාමෝද්දිෂ්ට ව්‍යාපාර'' යන්නට-

(අ) තනි පුද්ගල හෝ සාමූහික පෝට්ෆෝලියෝ කළමනාකරණය ;

(ආ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදල් ආයෝජනය, පරිපාලනය හෝ කළමනාකරණය ;

(ඇ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් මුදල් හෝ ද්‍රවශීල සුරැකුම්පත් ආරක්ෂණය සහ පරිපාලනය ;

(ඈ) ආරක්ෂක සුරැකුම් සේවා ;

(ඉ) රක්ෂණ ප්‍රාරක්ෂණය කිරීම සහ ස්ථානගත කිරීම මෙන්ම රක්ෂණ නියෝජිතයන් සහ තැරැව්කරුවන් මගින් රක්ෂණයේ අතරමැදි කටයුතු ;

(ඊ) භාරකාරත්ව පරිපාලනය හෝ ආයෝජන කළමනාකරණය හෝ අධිවෙශ්‍රාමික යෝජනාක්‍රම ;

(උ) කැසිනෝ ශාලා, සූදුහල් හෝ ලොතරැයි පැවැත්වීම. මෙයට තමන්ගේ ගනුදෙනුකරුවන්, නියමිත පර්යන්ත අගයට සමාන හෝ ඊට වැඩි මූල්‍ය ගනුදෙනුවල අන්තර්ජාලය හරහා යෙදෙන එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙක් ඇතුළත් වේ ;

(ඌ) නිශ්චල දේපළ මිල දී ගැනීම සහ විකිණීම හා සම්බන්ධව තමන්ගේ ගනුදෙනුකරුවන් සඳහා ගනුදෙනුවල යෙදී සිටින විටදී, නිශ්චල දේපළ අනුයෝජිතයන් ;

(එ) නියමිත පර්යන්ත අගයට සමාන හෝ ඊට වැඩි ගනුදෙනුවක, මුදල් ගනුදෙනුවක තමන්ගේ ගනුදෙනුකරුවකු සමග යෙදී සිටිනවිට දී 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ පනතින් ආවරණය වන ලෝහ සහ පාෂාණ ඇතුළත්වන එහෙත් ඊට සීමා නොවන අගනා ලෝහ අලෙවිකරුවන් සහ අගනා සහ අර්ධ අගනා පාෂාණ අලෙවිකරුවන්;

(ඒ) තමන්ගේ සේවාදායකයන් සඳහා මෙහි පහත සඳහන් කවර හෝ ක්‍රියාකාරකමකට අදාළව ගනුදෙනු සිදු කිරීමට සූදානම් වන හෝ සිදු කරන නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනස් ස්වාධීන නීති වෘත්තිකයන් සහ ගණකාධිකාරීවරුන්-

(i) නිශ්චල දේපල මිල දී ගැනීම සහ විකිණීම;

(ii) සේවාදායකයාගේ මුදල්, සුරැකුම්පත් හෝ වෙනත් වත්කම් කළමනාකරණය;

(iii) බැංකු ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් හෝ සුරැකුම්පත් ගිණුම් කළමනාකරණය;

(iv) සමාගම් නිර්මාණය කිරීම, ඒවායේ කටයුතු කරගෙන යාම සහ කළමනාකරණය සඳහා දායකත්වය සංවිධානය කිරීම; සහ

(v) නෛතික පුද්ගලයන් හෝ වැඩපිළිවෙලවල් නිර්මාණය කිරීම, ඒවායේ කටයුතු කරගෙන යාම හෝ කළමනාකරණය සහ ව්‍යාපාරික අස්තිත්ව විකිණීම;

(ඔ) මෙම අර්ථකථනයෙන් අන්‍යාකාරව ආවරණය වී නොමැත්තා වූ ද ව්‍යාපාරයක් වශයෙන් මෙහි පහත සඳහන් සේවා එකක් හෝ වැඩි ගණනක් තුන්වන පාර්ශ්වයන්ට සපයන්නා වූ ද භාරයක් හෝ සමාගම් සේවා සැපයුම්කරුවෙක්-

(i) නෛතික පුද්ගලයන් නිර්මාණය හෝ කළමනාකරණය;

(ii) සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු ලෙස හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ලෙස වෙනත් නෛතික පුද්ගලයන් හා සම්බන්ධව ඒ හා සමාන තරාතිරමකින් ක්‍රියා කිරීම හෝ වෙනත් තැනැත්තකුට එසේ ක්‍රියා කිරීම සඳහා පිළියෙල කර දීම;

(iii) සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් සඳහා හෝ වෙනත් යම් නෛතික පුද්ගලයකු හෝ වැඩපිළිවෙළක් සඳහා හෝ ලියාපදිංචි කාර්යාලයක්, ව්‍යාපාරික ලිපිනයක් හෝ ඉඩපහසුකම්, තැපැල් ලිපිනයක් හෝ පරිපාලන ලිපිනයක් සැපයීම;

(iv) යම් ප්‍රකාශිත භාරයක භාරකරු ලෙස ක්‍රියා කිරීම හෝ වෙනත් තැනැත්තකුට එසේ ක්‍රියා කිරීම සඳහා පිළියෙලකර දීම;

(v) වෙනත් තැනැත්තකු වෙනුවෙන් නාමික කොටස්කරුවකු ලෙස ක්‍රියා කිරීම හෝ අන් තැනැත්තකු වෙනත් තැනැත්තකු වෙනුවෙන් එසේ ක්‍රියා කිරීම සඳහා පිළියෙල කර දීම;

(ඕ) ''අක්වෙරළ'' යන්නට වෙනත් ලිඛිත නීතිවල විධිවිධාන ඇතුළත් අර්ථ නිරූපණයට අනුකූලව අක්වෙරළ අර්ථකථනය කිරීම;

(ක) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාර;

''මූල්‍ය බුද්ධි ඒකකය'' යන්නෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්තියෙන් සංස්ථාපිත මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ;

''මූල්‍ය ව්‍යාපාර'' යන්නට මෙහි පහත සඳහන් කවර හෝ ව්‍යාපාර හෝ ක්‍රියාකාරකම් ඇතුළත් වේ:-

(අ) මහජනයාගේ තැන්පතු හෝ ආපසු ගෙවිය යුතු අරමුදල් භාර ගැනීම ඇතුළුව, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථ කථනය කර තිබෙන බැංකු කටයුතු;

(ආ) (අදාළ පුද්ගලයා 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ බලපත්‍ර ලැබ හෝ ලියාපදිංචි වී තිබේද යන්න නොතකා) එම පනතේ අර්ථකථනය කර තිබෙන පරිදි වූ මූල්‍ය ව්‍යාපාර;

(ඇ) පාරිභෝගික ණය, උකස් ණය, (වගකීම් සහිතව හෝ රහිත) වෙළඳ නියෝජිතත්වය ඇතුළුව ණයදීම සහ වාණිජ ගනුදෙනු මූල්‍යකරණය;

(ඈ) පාරිභෝගික නිෂ්පාදන පිළිබඳ ගනුදෙනු හැර මූල්‍ය කල්බදුකරණය;

(ඉ) මුදල් හෝ අගය පැවරීම;

(ඊ) මුදල් හා ව්‍යාවාර මුදල් මාරුකිරීම් සේවා;

(උ) ගෙවීම් කිරීමේ ක්‍රමෝපාය එනම් ක්‍රෙඩිට් කාඩ් (ණය පත්), සංචාරක චෙක්පත් (ට්‍රැවලර්ස් චෙක්පත්), මුදල් ඇණවුම් හා බැංකු අණකර හා ඉලෙක්ට්‍රොනික මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය;

(ඌ) පාරිභෝගික ණය, වගකීම සහිතව හෝ රහිතව වෙළෙඳ නියෝජිතත්වය ඇතුළුව එහෙත් එයට සීමා නොවී මූල්‍ය ඇපකර සහ පොරොන්දු නිකුත් කිරීම සහ ධනදණ්ඩන ඇතුළත්ව මූල්‍ය ගනුදෙනු මූල්‍යකරණය;

(එ) තමා වෙනුවෙන් හෝ ගණුදෙනු කරුවන් වෙනුවෙන් මුදල් වෙළෙඳපල සාධනපත්‍ර (එනම් චෙක්පත්, විනිමය බිල්පත්, තැන්පතු සහතික සහ ඒවායින් ව්‍යුත්පන්න වන නීත්‍යානුකූල ලේඛන) ගණුදෙනු, විදේශ විනිමය ගණුදෙනු, භුවමාරු පොලී අනුපාතික සහ දර්ශන සාධන පත්‍ර, ඉදිරි වෙළෙඳ ද්‍රව්‍ය අලෙවිය සහ පැවරිය හැකි සුරැකුම්පත් ගනුදෙනු;

(ඒ) සුරැකුම්පත් නිකුතුවලට සහභාගිවීම සහ එම නිකුතු හා සම්බන්ධ මූල්‍ය සේවා සැපයීම;

(ඔ) ජාතික ආර්ථිකයේ යහපත සලකා අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාර.

''ආයතනය'' යන්නෙන් යම් මූල්‍ය ව්‍යාපාරයක් හෝ නාමෝද්දිෂ්ට මේ පනතේ අර්ථානුකූල මූල්‍යමය නොවන, ව්‍යාපාරයක යෙදී සිටින හෝ ඒ ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

''අක්වෙරළ ඒකකය'' යන්නෙන් අක්වෙරළ බැංකු ගනුදෙනු පිළිබඳ බැංකු ව්‍යාපාරය, 1988 අංක 30 දරන බැංකු පනතේ IV වන කොටසේ විධිවිධානවලට යටත්ව කරගෙන යන බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ.

''තැනැත්තා'' යන්නට පුද්ගල මණ්ඩලයක් අයත් වේ.

''දේපළ'' යන්නෙන් යම් ව්‍යවහාර මුදලක් අදහස් වන අතර ඊට ද්‍රව්‍යමය හෝ අද්‍රව්‍යමය වුව ද, චංචල හෝ නිශ්චල වුවද, ස්පර්ශනීය හෝ අස්පර්ශනීය වුවද ශ්‍රී ලංකාවේ හෝ අන් ස්ථානයක පිහිටා තිබුණද, කවර හෝ වර්ගයක වත්කම් සහ බැංකු ණය; සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර, ණයවර ලිපි, ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවන්නා වූ ද එම වත්කම් හෝ ඒවා කෙරෙහි පවත්නා ස්වාර්ථ සම්බන්ධතා පිළිබඳ සාක්ෂි වන්නා වූ ද ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් ස්වරූපයේ ලේඛන හෝ සාධන පත්‍ර ඇතුළත් වන අතර; ඒ යම් දේපළක් කෙරෙහි පවත්නා නෛතික හෝ සාධාරණීය ස්වාර්ථ සම්බන්ධතාවක් ද ඊට ඇතුලත් වේ.

''ගනුදෙනුව'' යන්නෙන් මූල්‍යකරණ ව්‍යාපාර හෝ මූල්‍යකරණය නොවන නාමෝද්දිෂ්ට ව්‍යාපාර හා සම්බන්ධ යම් ක්‍රියාකාරකමක් අදහස් වේ.

''ගනුදෙනුව'' යන්න දේපළකට අදාළව යෙදෙන විට:-

(අ) මිල දී ගැනීමක්, විකිණීමක්, ණයක්, අය භාරයක්, උකසක්, කැප අයිතියක්, ඔඩපනයක්, පැවරීමක්, භාරදීමක්, පාවාදීමක්, ප්‍රතිනිවේශනයක්, ප්‍රේෂණයක්, තෑග්ගක්, පරිත්‍යාගයක්, භාරයක්, නිර්මාණය කිරීමක්, ප්‍රදානයක් යම් භාණ්ඩයක් තැන්පත් කිරීම ඇතුළුව තැන්පතුවක්, ආපසු ගැනීමක්, වත්කම් අතර පැවරුමක්, ණයවර දීර්ඝ කිරීමක් ද;

(ආ) යම් අනුයෝජිතත්වයක් හෝ ඇටෝර්නි බලය පැවරීමක් ද;

(ඇ) එවැනි දේපළක් කෙරෙහි හෝ ඉන් යම් කොටසක් කෙරෙහි යම් වර්තමාන හෝ අනාගත වුව ද පැවරුණු හෝ සම්භාව්‍ය වුව ද අයිතිවාසිකමක්, හිමිකමක්, සම්බන්ධතාවක්, හෝ වරප්‍රසාදයක් යම් තැනැත්තකුට පිරිනැමීමේ ප්‍රතිඵලය ගෙන දෙන, කවර ආකාරයකින් වූ හෝ කවර විස්තරයකට නැතහොත් ස්වභාවයකට අයත් වූ හෝ වෙනත් යම් නියාදනයක් හෝ ගනුදෙනු කිරීමක් ද;

ඊට ඇතුළත් වේ.

''නීති විරෝධී ක්‍රියාකාරකම'' යන්නෙන් මෙහි පහත සඳහන් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන, ක්‍රියාවක් අදහස් වේ:-

(අ) (218 වන අධිකාරය වූ) විෂ ද්‍රව්‍ය, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනත;

(ආ) ත්‍රස්තවාදය වැළැක්වීමට හෝ මැඩපැවැත්වීමට අදාළව තත්කාලීනව බලපවත්නා යම් නීතියක් හෝ නියෝග යක්;

(ඇ) (26 වන අධිකාරය වූ) අල්ලස් පනත;

(ඈ) (182 වන අධිකාරය වූ) ගිනි අවි ආඥාපනත, (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත හෝ 1966 අංක 18 දරන අන්තරායදායක ආයුධ පනත;

(ඉ) (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත;

(ඊ) 1988 අංක 30 දරන බැංකු පනතේ 83ඇ වගන්තිය යටතේ වරදක්;

(උ) අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධව තත්කාලීනව බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්;

(ඌ) ''සයිබර්'' වැරදි හා සම්බන්ධ තත්කාලීනව බලපවත්නා යම් නීතියක්;

(එ) ළමයින්ට එරෙහි වැරදි හා සම්බන්ධ තත්කාලීනව බලපවත්නා යම් නීතියක්;

(ඒ) පුද්ගලයන් පිළිබඳ ජාවාරම් හා සම්බන්ධ වැරදිවලට අදාළ තත්කාලීනව බලපවත්නා යම් නීතියක්;

(ඔ) මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු හතකට හෝ හතක් ඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි තත්කාලීනව බලපවත්නා යම් නීතියක් යටතේ වූ වරදක්.

# 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 06 වන දින]

**මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීම, අනාවරණය කිරීම, විමර්ශනය කිරීම සඳහා පහසුකම් සලසනු පිණිස හා පිළිවෙළින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට එරෙහිව වැරදි සඳහා නඩු පැවරීමට අවශ්‍ය සැක කටයුතු මූල්‍ය ගණුදෙනු පිළිබඳ දත්ත එකතු කිරීම සඳහා; මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා නිසි උද්යෝගී පියවර ගැනීමට ඇතැම් ආයතනවලට නියම කිරීම සඳහා ද; මේ පනත අදාළ වන සියලු ආයතනවල කටයුතු සමීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අධිකාරියක් හඳුනාගැනීමේ විධිවිධාන සැලැස්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණ සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

1. මේ පනත 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## ආයතනවල කාර්ය

2. (1) කිසිම ආයතනයක් විසින්, නිර්නාමිකව යම් ගිණුමක් හෝ අංකයන් මගින් පමණක් හඳුන්වනු ලබන යම් ගිණුමක් හෝ ආයතනයේ දැනීම අනුව ව්‍යාජ හෝ අසත්‍ය නමකින් ක්‍රියාත්මකවන යම් ගිණුමක් ඇතුළුව, ඒ ගිණුමේ දරන්නා හඳුනාගත නොහැක්කා වූ ගිණුමක් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතුය.

(2) ආයතනය-

(අ) යම් ගනුදෙනුකරුවකු සමග යම් අඛණ්ඩ ව්‍යාපාරික සම්බන්ධතාවකට හෝ එවැනි සම්බන්ධතාවක් නොමැති විටෙක, යම් ගනුදෙනුවක් පවත්වන්නා වූ;

(ආ) යම් නිශ්චිත ගනුදෙනු කිසිවක් නොවන්නා වූ විද්‍යුත් අරමුදල් පැවරීමක් ගනුදෙනුකරුවකු විසින් කර ගෙන යන බව අනාවරණය කරගන්නා වූ;

(ඇ) යම් නීතිවිරෝධී කටයුත්තක් කිරීමට අදාළ සැකයක් පිළිගන්නා වූ; හෝ

(ඈ) කලින් ලබාගත් ගනුදෙනුකාර අනන්‍යතාව හෝ ලේඛන සත්‍යාසත්‍යතාව හෝ තොරතුරු පිළිබඳ සත්‍යවාදී බව හෝ ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් සැක ඇතිකරගන්නා වූ,

අවස්ථාවල දී, ආයතනයක් විසින්, (3) වන උපවගන්තිය යටතේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද රීති කිසිවකට යටත්ව, එක් එක් ගනුදෙනුකරු හඳුනාගැනීම හා ඔවුන්ගේ හා ඔවුන්ගේ ගනුදෙනුකාර අනන්‍යතා දත්ත හෝ තොරතුරු යම් නිල ලේඛනයක් හෝ ගනුදෙනුකරුගේ අනන්‍යතාව සත්‍යායනය කෙරෙන වෙනත් විශ්වාස කටයුතු හා ස්වාධීන ප්‍රභව ලේඛනයක් පදනම් කර ගෙන ගනුදෙනුකරුවනට අදාළ තොරතුරු සත්‍යායනය කිරීම, කරනු ලැබිය යුතු ය.

(3) මූල්‍ය බුද්ධි ඒකකය විසින්-

(අ) යම් විශේෂ ගනුදෙනුකරුවකු, හෝ ගනුදෙනුකාර පන්තියක් හඳුනාගැනීම් හෝ සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය නිල හෝ හඳුනාගැනීමේ ලේඛනය හෝ විශ්වාස කටයුතු හෝ ස්වාධීන ලේඛන ප්‍රභව, දත්ත හෝ තොරතුරු, නැතහොත් වෙනත් සාක්ෂි;

(ආ) මේ වගන්තිය යටතේ හඳුනා ගැනීමේ හා සත්‍යායනය කිරීමේ අවශ්‍යතා පිළිබඳ කාලය; සහ

(ඇ) යම් ආයතනයක ගනුදෙනුකරුවන් විසින් කරගෙන යනු ලබන ගනුදෙනුවලට, මේ වගන්තිය යටතේ විධිවිධාන පිළිබඳ සූදානම හෝ අවස්ථානුගත කරුණු අදාළ විය යුතු ආකාරය

නියම කෙරෙමින් රීති නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද රීති මගින් පනවන ලද නියම හා කොන්දේසි, විවිධ ආයතන වර්ග, විවිධ ගනුදෙනු වර්ග හෝ විවිධ වර්ගයේ ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් වෙනස් විය හැකි ය.

(5) (2) වන උපවගන්තියේ විධිවිධාන-

(අ) ගනුදෙනුව සැක කටයුතු හෝ අසාමාන්‍ය එකක් බවට සැක කිරීමට ආයතනයට හේතු ඇත්නම් මිස, ගනුදෙනුව, ඒ වන විටත් අනන්‍යතාව පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර ඇත්තා වූ තැනැත්තකු, සමග පවතින හා නිත්‍ය ව්‍යාපාරික සම්බන්ධතාවක කොටසක් වේ නම්;

(ආ) ගනුදෙනුව සැක කටයුතු හෝ අසාමාන්‍ය බවට සැකකිරීමට තරම් ආයතනයට හේතු ඇත්නම් මිස, ගනුදෙනුව නියමිත මුදල නොඉක්මවන වරින් වර සිදුවන ගනුදෙනුවක් වේ නම්;

(ඇ) අවුරුදු තුනක් නොඉක්මවන කාලස්ථිමකට යටත්ව, යම් තැනැත්තකු මේ පනත පැනවීමට පෙරාතුව, ආයතනයේ ගනුදෙනුකරුවකු වී ඇත්නම්; එසේ වුව ද ඒ කාල පරිච්ඡේදය අවසානයේ දී එක් එක් ආයතනය විසින්, ඒ සඳහා නියම කරනු ලැබිය හැකි යම් නියෝගවලට යටත්ව, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මෙහි (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ කරනු ලැබිය යුතු ය; තව ද

(ඈ) ඒ සඳහා සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් අවස්ථානුගත කරුණු යටතේ,

අදාළ නොවිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ කාර්යය සඳහා, ''වරින් වර සිදුවන ගනුදෙනු'' යන්නෙන් තැනැත්තා ගනුදෙනුකරුවන යම් තැනැත්තකුගේ ගිණුමක් මගින් නොවන තැනැත්තකු විසින් පවත්වාගනු යනු ලබන, මුදල් හා විද්‍යුත් අරමුදල් මාරුකිරීම්වලට අදාළ යම් ගනුදෙනුවක් අදහස් වේ.

3. (2) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, නියමිත පරිදි ආයතනයක් වෙත අනන්‍යතාව පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර නොමැති නම්, මේ පනත ප්‍රකාර පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය විසින් විධාන කරනු ලැබ ඇත්නම් මිස, ආයතනය විසින් ගනුදෙනුව පිළිබඳව වැඩිදුර කටයුතු කිසිවක් කරගෙන නොයා යුතු අතර සිදු කිරීමට තැත් කරන ලද ගනුදෙනුව පිළිබඳව, 7 වන වගන්තිය යටතේ සැක කටයුතු ගනුදෙනුවක් වශයෙන් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

4. (1) සෑම ආයතනයක් විසින්ම-

(අ) ගනුදෙනුවලට අදාළ ගනුදෙනු සටහන් හා ලිපිගනුදෙනු වාර්තා සහ අවස්ථාවෝචිත පරිදි, ගනුදෙනුවේ ලිපිගනුදෙනු හෝ වාර්තාව ඉදිරිපත් කළ දින පටන් අවුරුදු හයක කාලපරිච්ඡේදයක් සඳහා වූ සියලු වාර්තා සටහන් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; තවද

(ආ) අවස්ථාවෝචිත පරිදි, ගිණුම වැසූ හෝ ව්‍යාපාරික සම්බන්ධතාව අවසන් වූ දින පටන්, අවුරුදු හයක කාලපරිච්ඡේදයක් සඳහා, 2 වන වගන්තිය ප්‍රකාර ලබාගත් අනන්‍යතා සටහන්, පවත්වාගෙන යා යුතු ය.

ඒ සටහන් හෝ ලිපිගනුදෙනු වඩා දීර්ඝ කාලපරිච්ඡේදයක් සඳහා තබා ගත යුතු යයි මූල්‍ය බුද්ධි ඒකකය විසින් විධාන කරනු ලබන්නේ නම් ඒ දීර්ඝ කාලය සඳහා වාර්තා හෝ ලිපි ගනුදෙනු තබා ගත යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යාමට නියමිත වාර්තාවල-

(අ) (i) ගනුදෙනුව පවත්වාගෙන යන ලබන්නේ; සහ

(ii) අදාළ වන අවස්ථාවක, ගනුදෙනුව පවත්වාගෙන යනු ලබන්නේ

කවර තැනැත්තකු වෙනුවෙන් ද, ඒ එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය සහ රැකියාව (හෝ උචිත අවස්ථාවක දී ව්‍යාපාරය හෝ ප්‍රධාන කටයුත්ත)

(ආ) ගනුදෙනුවේ ස්වභාවය සහ දිනය;

(ඇ) යොදා ඇති මුදල් වර්ගය හා ප්‍රමාණය;

(ඈ) ගනුදෙනුවේ පාර්ශ්වකරුවන්;

(ඉ) වාර්තාව පිළියෙල කරනු ලබන සේවානියුක්තයාගේ නම සහ ලිපිනය; සහ

(ඊ) මූල්‍ය බද්ධි ඒකකය විසින් නිකුත් කරනු ලබන රීතිවල සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු,

හඳුනාගැනීම සඳහා වූ ප්‍රමාණවත් විස්තර ඇතුළත් විය යුතු ය.

(3) මේ පනත යටතේ යම් වාර්තාවන් පවත්වාගෙන යා යුතු යයි නියමිත අවස්ථාවක-

(අ) මූල්‍ය බුද්ධි ඒකකයෙන් හෝ නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකින් තොරතුරු ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම් වහාම ඉටු කිරීමට හැකිවන ආකාරයකින් හා ආකෘතියකින් එය පවත්වා ගෙන යා යුතු ය; තව ද,

(ආ) එහි පිටපතක්-

(i) එයින් කඩදාසි පිටපතක් පහසුවෙන් ගත හැකි වන පරිදි යාන්ත්‍රික ආකෘතියක; නැතහොත්,

(ii) එයින් කඩදාසි පිටපතක් පහසුවෙන් ගත හැකි වන පරිදි විද්‍යුත් ආකෘතියක තැබිය යුතු අතර, සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා වාර්තා තබන තැනැත්තාගේ විද්‍යුත් අත්සනක්,

තබා ගත හැකි ය;

(4) (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන වාර්තා, මේ පනතට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමේ කාර්ය සඳහා ඉල්ලූ විට, මූල්‍ය බුද්ධි ඒකකය වෙත ලබා දිය යුතු ය.

5. ආයතනයක් විසින්, 2 වන වගන්තිය යටතේ වූ එකී බැඳීම් සපුරාලීම හා ගනුදෙනුකරු හා ගනුදෙනුකරුගේ ව්‍යාපාර ආකෘතිය පිළිබඳව ආයතනය සතුව පවත්නා තොරතුරු සමග, කරන ලද ගනුදෙනු ගැලපීම පිළිබඳව වග බලා ගැනීම සඳහා

(අ) එහි ගනුදෙනුකරු සමග පවත්නා ව්‍යාපාරික සම්බන්ධතාව සම්බන්ධයෙන් නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය;

(ආ) ගනුදෙනුකරු, ගනුදෙනුකරුගේ ව්‍යාපාරය හා අවශ්‍ය විටෙක අරමුදල් ප්‍රභවය ද ඇතුලු අන්තරාය පැතිකඩ පිළිබඳ ආයතනයේ දැනීම සමග, කරනු ලබන යම් ගනුදෙනුවක් ගැලපේදැයි වගබලා ගැනීම සඳහා ගනුදෙනුකරුවකු සමග පවත්නා ව්‍යාපාරික සම්බන්ධතාව තුළ දී භාරගනු ලැබූ යම් ගනුදෙනුවක් පිළිබඳව නොකඩවා නිරීක්ෂණය කරනු ලැබිය යුතු ය.

6. ආයතනයක් විසින්-

(අ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය යුතු යම් මුදලක් ඉක්මවන, මුදලින් වූ මුදල් ප්‍රමාණයක් යම් ගනුදෙනුවක් හෝ විදේශ මුදල්වලින් වූ ඊට සමාන මුදලක්; සහ

(ආ) නියෝග මගින් නියම කරනු ලැබිය යුතු වූ යම් මුදලක් ඉක්මවන, මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද රීති මගින් නියම කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් ඇතුළත වූ, ගනුදෙනුකාරයකුගේ ඉල්ලීම මත සිදු කෙරෙන යම් විද්‍යුත් අරමුදල් මාරුවක්,

පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

7. (1) ආයතනයකට-

(අ) යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක්, යම් නීතිවිරෝධී කටයුත්තක් හෝ වෙනත් යම් සාපරාධී වරදක් කිරීමට අදාළ විය හැකි යයි සැක කිරීමට තරම් හේතු ඇත්තා වූ; හෝ

(ආ) එයට-

(i) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන යටතේ වරදකට සූදානම් වීමේ ක්‍රියාවකට;

(ii) නීතිවිරෝධී ක්‍රියාවක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් සම්බන්ධයෙන් තැනැත්තකු හෝ තැනැත්තන් පිළිබඳ විමර්ශනය කිරීමකට, නඩු පැවරීමකට, නැතහොත්, මේ පනත හෝ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හා 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත බලාත්මක කිරීමෙහි ලා අන්‍යාකාරයෙන් සහායවීමකට අදාළ විය හැකියයි සැක කිරීමට තරම් තොරතුරු ඇත්තා වූ අවස්ථාවක, ආයතනය විසින්, හැකි ඉක්මණින් ක්‍රියාවෙහි යෙදිය හැකිතාක් දුරට සැකය ඇතිකර ගැනීමෙන් හෝ තොරතුරු ලැබීමෙන් පසුව, එහෙත්, එතැන් පටන් වැඩකරන දින දෙකක් පසු නොවී, ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීම නැතහොත්, තොරතුරු පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තාකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක්-

(අ) ලියවිල්ලකින් විය යුතු අතර, තැපැල් මගින්, පැය විසි හතරක් ඇතුළත ලියවිල්ලක් පසුව යැවීමේ අදහසින් දුරකථනයෙන්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපැලෙන් හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින් විනිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකින් දෙනු ලැබිය හැකි ය;

(ආ) මූල්‍ය බුද්ධි ඒකකය විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක් විය යුතු අතර, යම් විස්තර ඇතුළත් විය යුතු ය;

(ඇ) ආයතනය සැකය ඇතිකරගත් හේතු පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය;

(ඈ) ආයතනය විසින් අත්සන් කළ යුතුය, නැතහොත්, සැබැවටම අන්‍යාකාරයකින් සහතික කරනු ලැබිය යුතු ය.

(3) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තාවක් කරනු ලැබූ හෝ යම් තොරතුරක් දෙනු ලැබූ තැනැත්තකු විසින්, ගනුදෙනුව හෝ ගනුදෙනුකිරීමට තැත් කිරීම හෝ ගනුදෙනුවේ පාර්ශ්වකරුවන් පිළිබඳව වැඩිදුර තොරතුරු කිසිවක් දිය යුතු යයි මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ තොරතුරු ඒකකය වෙත සපයනු ලැබිය යුතු ය.

8. සෑම ආයතනයක් විසින් ම, ඒ ආයතනය සමග ගනුදෙනු පවත්වාගෙන යන යම් තැනැත්තකුට අදාළව, පහත දැක්වෙන තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වහාම හෙළිකරනු ලැබිය යුතු ය:-

(අ) තත් කාලයේ බලපවත්නා යම් නීතියක් ප්‍රකාර, යම් ත්‍රස්තවාදී ක්‍රියාවලියක් මගින් ලැබුනු දේපළක් යයි එහි දැනීම අනුව හෝ හේතු සහගතව සැකකරන දේපළක් එහි සන්තකයේ හෝ පාලනයේ පැවතීම;

(ආ) නිශ්චිත අස්ථිත්‍යකට අයත් වූ හෝ ඒ වෙනුවෙන් පාලනය කරනු ලබන නැතහොත් නිශ්චිත අස්ථිත්‍යක් විසින් හෝ ඒ වෙනුවෙන් අයත්වන්නේ යයි හෝ පාලනය කරනු ලබඉන්නේ යයි සැක කිරීමට තරම් සාධාරණ හේතු ඇත්තා වූ යම් දේපළක් ඔහුගේ හෝ ඇයගේ සන්තකයේ හෝ පාලනයේ පැවතීම;

(ඇ) තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් ප්‍රකාර යම් ත්‍රස්තවාදී ක්‍රියාවලියක් මගින් ලැබුනු දේපළක් සම්බන්ධයෙන් වූ ගනුදෙනුවක් පිළිබඳ යම් තොරතුරක්; හෝ

(ඈ) තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් ප්‍රකාර යම් ත්‍රස්තවාදී ක්‍රියාවලියක් මගින් ලැබුණු දේපළකට යම් ගනුදෙනුවක් සම්බන්ධ වී ඇතැයි සැක කිරීමට තරම් සාධාරණ හේතු ඇත්තා වූ ගනුදෙනුවක් හෝ යෝජිත ගනුදෙනුවක් පිළිබඳ යම් තොරතුරක්.

## II වන කොටස

## ආයතන හෝ වෙනත් තැනැත්තන්ට අදළ වන විධිවිධාන

9. (1) යම් තැනැත්තකු විසින්-

(අ) මේ පනතේ විධිවිධාන කිසිවක් ප්‍රකාර මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තාවක් කරන ලදැයි හෝ තොරතුරක් සපයන ලදැයි;

(ආ) 7 වන වගන්තියේ සඳහන් පරිදි ගනුදෙනුවකට අදාළව යම් සැකයක් ඇති කර ගන්නා ලදැයි; හෝ

(ඇ) සැකයක් ඇතිකර ගන්නා ලදැයි හෝ වාර්තාවක් කරන ලදැයි හෝ කරනු ලැබිය හැකි යයි තොරතුරු හෙළිකරනු ලබන තැනැත්තාට ඇඟවීමට බලාපොරොත්තු වන තැනැත්තාගෙන් ලබාගන්නා වෙනත් යම් තොරතුරක්,

වෙනත් යම් තැනැත්තකුට හෙළිකරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන-

(අ) මේ පනත යටතේ වාර්තාවක් කරන නිලධරයාට හෝ සේවා නියුක්තයාට හෝ තැනැත්තාගේ අනුයෝජිතයාට, ඒ තැනැත්තාගේ කාර්ය කිරීම හා සම්බන්ධ වූ යම් කාර්යයක් සඳහා;

(ආ) යම් කාරණයකට අදාළව නීති උපදෙස් හෝ නියෝජන ලබාගැනීමේ කාර්යය සඳහා අධි නීතිඥවරයකුට, නීතිඥවරයකුට හෝ නීති උපදේශකයකුට; හෝ

(ඇ) අධීක්ෂණ අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා එය බලපානතාක් දුරට අදාළ ආයතනයේ අධීක්ෂණ අධිකාරියට,

කරන ලද හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) තොරතුරු පිළිබඳ යම් හෙළිදරව් කිරීමක් කරන ලද්දා වූ, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කිසිම තැනැත්තකු විසින්, එහි සඳහන් නොවන තැනැත්තකු වෙත, එය-

(අ) පළමු සඳහන් තැනැත්තාගේ කාර්ය කිරීමෙහි ලා; හෝ

(ආ) කාරණයට අදාළව නීති උපදෙස් හෝ නියෝජන ලබාගැනීම සඳහා,

අවශ්‍ය වන තාක් දුරට මිස හෙළිදරව් නොකළ යුතු ය.

(4) යම් තොරතුරු හෙළිදරව් කිරීමක් කරන ලද්දේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු වෙත ද ඒ කිසිම තැනැත්තකු විසින්, ඒ තොරතුරු, ඒ උපවගන්තියේ සඳහන් කාර්යය හෝ කාරණයට අදාළව නීති උපදෙස් ලබා ගැනීමේ කාර්යය සඳහා හෝ මූල්‍ය බුද්ධි ඒකකය නියෝජන කිරීම සඳහා හැර, හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

10. (1) තැනැත්තකු විසින්-

(i) පිළිවෙලින් 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වූ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් තැනැත්තෙක් හෝ තැනැත්තන් විමර්ශනය කිරීමේ හෝ ඔවුනට විරුද්ධව නඩු පැවරීමේ; නැතහොත්

(ii) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ,

කාර්යය සඳහා නොවන,

(අ) මේ පනත යටතේ සැක කටයුතු වාර්තාවක් කරනු ලැබ ඇත්තා වූ ගනුදෙනුවක් කළ යම් තැනැත්තකු;

(ආ) එවැනි යම් සැක කටයුතු වාර්තාවක් කරනු ලැබූ යම තැනැත්තකු;

(ඇ) එවැනි යම් සැක කටයුතු ගනුදෙනුවක් වාර්තා කරනු ලැබූ යම් තැනැත්තකු; හෝ

(ඈ) 7 වන වගන්තියට අනුව සපයන සැක කටයුතු ගනුදෙනු වාර්තාවක හෝ තොරතුරක ඇතුළත් යම් තොරතුරක්,

හඳුනාගනු ලබන හෝ හඳුනාගැනීමේ හැකියාව ඇති යම් තොරතුරක් එළිදරව් කරනු නොලැබිය යුතු ය.

(2) 7 වන වගන්තියේ විධිවිධාන කිසිවක් කඩකිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීමේ කාර්යය සඳහා වූ යම් තොරතුරක් හෙළිදරව් කිරීම තහනම් කෙරෙන කිසිවක් මේ වගන්තියේ ඇතැයි නොසැලකිය යුතු ය.

11. මේ පනතේ විධිවිධානවලට සහ ඒ හෙළිදරව් කිරීම තහනම් කෙරෙන, තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, 9 වන හෝ 10 වන වගන්තියෙහි ඇතුළත්, කිසිවකින් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය හා සම්බන්ධයෙන් හෝ නීති කෘත්‍යවල දී යම් තොරතුරක් හෙළිදරව් කිරීම නොවැළැක්විය යුතු අතර, අධිකරණ කෘත්‍ය කිසිවක දී මේ වගන්තිය බලපාන යම් තොරතුරක් හෙළිදරව් කළ යුතු යයි එම තොරතුරු එළිදරව් කිරීම යුක්තිය පසිඳලීමෙහි ලා අවශ්‍ය යයි විනිශ්චයකාරවරයා හෝ වෙනත් මූලික නිලධරයකු සෑහීමට පත්වන්නේ නම් මිස, කිසිම තැනැත්තකුට නියම කරනු නොලැබිය යුතු ය.

12. (1) මේ පනත ප්‍රකාර සද්භාවයෙන් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ මේ පනත ප්‍රකාර මූල්‍ය බුද්ධි ඒකකය විසින් දෙනු ලබන විධානවලට අනුකූලව, ආයතනය විසින් විගණක ව්‍යාපාරික ආයතනය හෝ අධීක්ෂණ අධිකාරිය හෝ ඒ ආයතනයේ, ව්‍යාපාරික ආයතනයේ හෝ අධිකාරියේ අධ්‍යක්ෂවරයකු, කොටස්කරුවකු, නිලධරයකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් කරන ලද යම් ක්‍රියාවකට අදාළව,

(අ) ඒ ආයතනයට, ආයතනයක විගණකවරයකු හෝ අධීක්ෂකවරයකු අධිකාරියට විරුද්ධව; නැතහොත්

(ආ) ආයතනයක, විගණක ව්‍යාපාරික ආයතනයක හෝ අධීක්ෂණ අධිකාරියක ඒ තැනැත්තකුගේ සේවානියුක්තියෙහි යෙදී ක්‍රියා කරන අතරතුර අධ්‍යක්ෂවරයකුට, කොටස්කරුවකුට, නිලධරයකුට, සේවානියුක්තයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව,

සිවිල් අපරාධ හෝ විනයානුකූල නීති කෘත්‍ය කිසිවක් නොගත යුතු ය.

(2) මේ පනතේ 8 වන වගන්තිය යටතේ විස්තර කර ඇති වරදක් සඳහා වූ නීති කෘත්‍ය කිසිවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) ආයතනයක්, විගණක ව්‍යාපාරික ආයතනයක් හෝ අධීක්ෂණ අධිකාරියක් නැතහොත් යම් ආයතනයක, ව්‍යාපාරික ආයතනයක හෝ අධිකාරියක යම් අධ්‍යක්ෂවරයෙක්, කොටස්කරුවෙක්, නිලධරයෙක්, සේවානියුක්තයෙක් හෝ අනුයෝජිතයෙක් විසින්, මේ පනතේ විධිවිධාන යටතේ වාර්තාවක් කරන්නේ නම්, මුදල් විශුද්ධිකරණ වරදට නඩු පැවරීමේ කාර්ය සඳහා, යම් විටෙක දී ඒ තොරතුරු සන්තකයේ නොතිබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

13\. (1) මේ පනතේ 4 වන, 5 වන, 6 වන, 7 වන හෝ 8 වන වගන්තිවල ඇතුළත් කිසිවක් යම් වරප්‍රසාදලත් දැනුම්දීමක් හෙළිදරව් කිරීම සඳහා අධි නීතිඥවරයකුට නියම කෙරෙන පරිද්දෙන් තේරුම් නොගත යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, දැනුම්දීමක්-

(අ) (i) අධි නීතිඥවරයකු හෝ නීති උපදේශකයකු, ඔහුගේ හෝ ඇයගේ වෘත්තීය තත්ත්වයන් සහ වෙනත් බැරිස්ටර්වරයකු, සොලිසිටර්වරයකු, නීතිඥවරයකු, හෝ නීති උපදේශකවරයකු නැතහොත්;

(ii) අධි නීතිඥවරයකු හෝ නීති උපදේශකයකු, ඔහුගේ හෝ ඇයගේ වෘත්තීය තත්ත්වයන් හෝ ඔහුගේ හෝ ඇයගේ සේවාදායකයා විසින් කෙළින්ම හෝ ඔවුන් අතරින් කෙනකුගේ අනුයෝජිතයා මගින් වාචිකව හෝ ලියවිල්ලකින් කෙරෙන රහස්‍ය දැනුම් දීමක්; සහ

(ආ) කරන ලද්දේ හෝ ඇති කරන ලද්දේ නීති උපදේශ හෝ සහාය ලබාගැනීමේ හෝ දීමේ කාර්යය සඳහා; සහ

(ඇ) නොකරන ලද්දේ හෝ ඇති නොකරන ලද්දේ නීති විරෝධී හෝ නීත්‍යනුකූල නොවන කිසියම් ක්‍රියාවක් කිරීමේ හෝ වැඩිදුරටත් කිරීමේ කාර්යය සඳහා,

පමණක් වේ නම්, එය වරප්‍රසාද ලත් දැනුම් දීමක් වන්නේය.

(3) තොරතුරෙහි තැනැත්තකුගේ (අධි නීතිඥවරයකු, ඔහුගේ හෝ ඇයගේ සේවාදායකයා හෝ වෙනත් යම් තැනැත්තකු) ලැබීම්, ගෙවීම්, ආදායම, වියදම හෝ මුදල් ගනුදෙනු පිළිබඳව සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් අදාළ වන්නා වූ අවස්ථාවක, එය අධි නීතිඥවරයාගේ භාර ගිණුම සම්බන්ධයෙන් පිළියෙළකරන ලද හෝ තබන ලද යම් පොතක, ගිණුමක, ප්‍රකාශයක හෝ වෙනත් වාර්තාවක් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ඇතුළත් වේ නම් හෝ අඩංගු වේ නම්, එය වරප්‍රසාද ලත් දැනුම්දීමක් නොවිය යුතු ය.

14\. (1) සෑම ආයතනයකටම-

(අ) මේ පනතේ නියමවලට අනුකූලව ආයතනය විසින් කටයුතු කිරීම සහතික කිරීම සඳහා වගකිවයුතු අනුකූලතා නිලධරයකු පත්කළ යුතු යයි;

(ආ) (i) 2 වන වගන්තිය යටතේ වූ ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ නියමයන් ක්‍රියාත්මක කිරීම;

(ii) 4 වන වගන්තිය යටතේ වූ වාර්තා සකස් කිරීමේ හා තබාගැනීමේ කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීම;

(iii) 5 වන වගන්තිය යටතේ නියමිත කාර්යාවලිය ක්‍රියාත්මක කිරීම;

(iv) විගණකවරුන්ට අදාළ, 6 වන, 7 වන, 8 වන හා 22 වන වගන්ති යටතේ වාර්තා කිරීමේ නියමයක් ක්‍රියාත්මක කිරීම;

(v) මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ නීති සම්බන්ධයෙන් එහි නිලධරයන් හා සේවානියුක්තකයන් දැනුවත් කිරීම; සහ

(vi) සේවා නියුක්තයන් වශයෙන් ගැනීමට පෙර සියලුම තැනැත්තන් ආරක්ෂා කිරීම,

සඳහා වූ කාර්ය පටිපාටි හා ක්‍රම ඇති කිරීම හා පවත්වාගෙන යාම කළ යුතු යයි;

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම සඳහා එහි කාර්ය පටිපාටිය හා ක්‍රම පරීක්ෂා කිරීමේ විගණන කර්තව්‍යයක් ඇති කළ යුතු යයි;

(ඈ) සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම සඳහා එහි නිලධරයන්, සේවා නියුක්තයන් හා අනුයෝජිතයන් පුහුණු කළ යුතු යයි,

නියම කරනු ලැබිය යුතු ය.

(2) ඔහුගේ හෝ ඇයගේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ දී වෙනත් යම් තැනැත්තකු සේවයෙහි නියුක්ත නොකරවන හෝ ඔහු සමග එකතු වී ක්‍රියා නොකරන පුද්ගලයකුට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) ආයතනයක් විසින්, ස්වකීය විදේශීය සමාගම් හා පාලිත සමාගම් විසින්, ප්‍රාදේශීය නීති හා නියෝග මගින් අවසර ලැබෙන තාක් දුරට, මේ පනතේ I වන, II වන හා III වන කොටස්වලට ගැලපෙන නියමයන් පිළිගෙන පිළිපැදිය යුතු බවට වගබලාගත යුතු අතර, ඒ නියමයන් පිළිගෙන පිළිපැදීමට විදේශීය ශාඛාවකට හෝ පාලිත සමාගමකට නොහැකිවන අවස්ථාවක, කාරණය පිළිබඳව අදාළ අධීක්ෂණ අධිකාරිය වෙත හෝ අධීක්ෂණ අධිකාරියක් නොමැති විටෙක මූල්‍ය බුද්ධි ඒකකය වෙත හෝ වාර්තා කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මූල්‍ය බුද්ධි ඒකකයේ බලතල හා කර්තව්‍ය

15. (1) මූල්‍ය බුද්ධි ඒකකය විසින්-

(අ) මේ පනතේ විධිවිධාන ප්‍රකාර කරන ලද වාර්තා හා වෙනත් රටක යම් නියෝජ්‍යායතනයක් විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත සපයනු ලබන තොරතුරු, නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් හෝ ආණ්ඩුවේ ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත සපයනු ලබන තොරතුරු හා නීති විරෝධී ක්‍රියාවලියක් සංස්ථාපනය කරන ක්‍රියාවක් ගැන සැක පිළිබඳව, මූල්‍ය බුද්ධි ඒකකය වෙත සිය කැමැත්තෙන් සපයනු ලබන වෙනත් යම් තොරතුරු ලබාගත යුතු ය;

(ආ) ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන දත්ත ආධාරකවල ගබඩා කර ඇති තොරතුරු ද ඇතුළත් එකතු කර ගන්නා වූ හෝ පවත්වාගෙන යන ලද්දා වූ, වාණිජමය වශයෙන් ඇති දත්ත ආධාරක හෝ තොරතුරු ද ඇතුළුව ප්‍රසිද්ධියේ පවත්නා හෝ එසේ නොමැති, නීති විරෝධී කටයුත්තක් හෝ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය හෝ ත්‍රස්තවාදී කටයුත්තක් වෙනුවෙන් මුදල් සැපයීමට අදාළ වරදක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවකට අදාළ යයි මූල්‍ය බුද්ධි ඒකකය විසින් සලකනු ලබන යම් තොරතුරක් එකතු කිරීම හෝ ආයතනයක අධිකරණ අධිකාරියට නියම කිරීම් කරනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනතේ කාර්ය සඳහා ආණ්ඩුවේ යම් නියෝජ්‍යායතනයකින් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකින් හා අධීක්ෂණ නියෝජ්‍යායතනයකින් තොරතුරු ඉල්ලනු ලැබිය හැකි ය;

(ඈ) සියලු වාර්තා හා තොරතුරු විශ්ලේෂනය කර තක්සේරු කරනු ලැබිය හැකි ය;

(ඉ) 18 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි සියලු ආයතන පිළිබඳව පරීක්ෂණ කරගෙන යා යුතුය;

(ඊ) යම් වාර්තාවකින් හෝ තොරතුරකින් ලැබෙන යම් කාරණයක් හෝ යම් තොරතුරක්, ගනුදෙනුව මේ පනත යටතේ විමර්ශනයට හෝ නඩු පැවරීමට අදාළ වන බවට හෝ නීති විරෝධී ක්‍රියාවක් සංස්ථාපනය කරන බවට සැක කිරීමට තරම් මූල්‍ය බුද්ධි ඒකකයට සාධාරණ හේතු ඇත්තේ නම්, එහි විශ්ලේෂනය හා තක්සේරු කිරීමේ පදනම මත, උචිත නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයේ යොමු කරනු ලැබිය යුතු අතර, ඒ හා සම්බන්ධයෙන් ඒ යොමුවේ හෝ තොරතුරේ පිටපතක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් අදාළ අධීක්ෂණ අධිකාරිය වෙත යවනු ලැබිය හැකි ය;

(උ) සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ලැබීමේ හෝ එකතු කර ගැනීමේ දින සිට අවුරුදු හයක් ඉකුත්වීමේ දී වාර්තාව සම්බන්ධව හෝ වාර්තාවේ නම සඳහන් තැනැත්තා සම්බන්ධව හෝ තවදුරටත් වූ ක්‍රියාකාරකමක් හෝ තොරතුරක් හෝ නොමැත්තේ නම් ඒ අවුරුදු හය ඉකුත්වීමේ දී හෝ, වාර්තාව හෝ තැනැත්තා සම්බන්ධ වූ අවසාන ක්‍රියාකාරකමේ දින සිට අවුරුදු හයක් ඉකුත්වීමේ දී හෝ, ඒ වාර්තාව විනාශ කරනු ලැබිය යුතු ය;

(ඌ) මේ පනතට අනුකූලව ක්‍රියාකිරීම බලාත්මක කිරීම හෝ මූල්‍ය බුද්ධි ඒකකය හෝ නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් විසින් අපේක්ෂිත යම් විමර්ශනයක් පහසුකරලීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලබාගත්

යම් තොරතුරකට හෝ වාර්තාවකට අදාළ ව උචිත වන යම් පියවර ගත යුතු යම් ආයතනයක අධීක්ෂණ අධිකාරියට උපදෙස් දෙනු ලැබිය යුතු ය; නැතහොත්, නියම කරනු ලැබිය යුතු ය;

(එ) සංඛ්‍යාලේඛන හා වාර්තා එකතු කරනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකාව ඇතුළත හෝ අන් තැනක තොරතුරු පතුරුවාලීම හා ලැබී ඇති යම් තොරතුරකින් උද්ගත වන නිර්දේශ කරනු ලැබිය හැකි ය;

(ඒ) ගනුදෙනුකරුවන් හඳුනාගැනීම, වාර්තා තැබීම, බැඳීම් වාර්තා කිරීම, සැකකටයුතු ගනුදෙනු හඳුනාගැනීම හා මූල්‍ය බුද්ධි ඒකකයට මේ පනත මගින් රීති හෝ මාර්ගෝපදේශ නිකුත් කිරීමේ බලය පවරා ඇති වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් රීති හා මාර්ගෝපදේශ නිකුත් කිරීම හෝ ආයතනයක අධීක්ෂණ අධිකාරිය ලවා රීති හා මාර්ගෝපදේශ නිකුත් කිරීම, කරනු ලැබිය යුතු ය;

(ඔ) පනත යටතේ දෙන ලද වාර්තා හෝ තොරතුරුවලින් ලැබූ ප්‍රතිඵලය පිළිබඳව, සියලු ආයතනවලට හා වෙනත් නියෝජ්‍යායතනවලට කලින් කල වාර්තා කරනු ලැබිය යුතු ය;

(ඕ) මේ පනත යටතේ එයට යොමු කරන ලද වාර්තාවක සඳහන් පාර්ශ්වකරුවන් හෝ ගනුදෙනු පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගත හැකි ය;

(ක) ගනුදෙනුකරුවන් හඳුනාගැනීම, වාර්තා තැබීම සහ බැඳීම් වාර්තා කිරීම හා සැකකටයුතු ගනුදෙනු හඳුනා ගැනීමට අදාළව ආයතන සඳහා පුහුණුවීමේ වැඩ සටහන් පවත්වාගෙන යා හැකි ය;

(ග) මේ පනත යටතේ ස්වකීය කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිසි උද්යෝගී පිරික්සුම් හා වෙනත් විමසීම් භාරගනු ලැබිය හැකි ය;

(ච) මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවකාශයට නැඹුරුවීම් හා වැඩිදියුණුවීම් සහ නීත්‍යනුකූල බවක් පෙන්නුම් කිරීමෙන් මුදල් මාරුකිරීම හා ත්‍රස්තවාදී කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම අනාවරණය කර ගැනීමේ, වළක්වාලීමේ, නිවාරණය කිරීමේ දියුණු ක්‍රම පිළිබඳව පර්යේෂණ කරනු ලැබිය හැකි ය;

(ජ) මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට අදාළ කාරණා පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා හැඟීමක් ඇති කරනු ලැබිය හැකි ය;

(ට) 16 වන හා 17 වන වගන්තිවල දක්වා ඇති පරිදි යම් වාර්තාවක්, ඒ වාර්තාවෙන් ලැබෙන යම් තොරතුරක් හෝ එයට ලැබෙන වෙනත් යම් තොරතුරක්, එහි විශ්ලේෂණය හෝ තක්සේරුව පදනම් කරගෙන, මුදල් විශුද්ධිකරණ වරදක් හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ වරදක් සංස්ථාපනය කෙරෙන යම් ක්‍රියාවක් විමර්ශනය කිරීමට හෝ ඒ පිළිබඳ නඩු පැවරීමකට අදාළ වන්නේ යයි සැකකිරීමට තරම් සාධාරණ හේතු මූල්‍ය බුද්ධි ඒකකයට ඇත්තේ නම්, ආයතනයකට හෝ විදේශ රාජ්‍යයක නියෝජ්‍යායතනයකට හෝ මූල්‍ය බුද්ධි ඒකකයේ බලතලවලට සමාන බලතල හා කාර්ය ඇත්තා වූ විදේශ රාජ්‍යවල ආණ්ඩු මගින් පිහිටුවන ලද ජාත්‍යන්තර ආයතනයකට හෙළිකරනු ලැබිය හැකි ය; තව ද

(ඩ) යම් දේශීය රාජ්‍ය ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් සමග තොරතුරු හුවමාරු කරගැනීම පිළිබඳව යම් ගිවිසුමකට හෝ වැඩපිළිවෙලකට ඇතුළත් විය හැකි ය.

(2) ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක්-

(අ) යම් නීතිවිරෝධී කටයුත්තක් ආරෝපණය කෙරෙන මුදල් යෙදවීමක්; හෝ

(ආ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත යටතේ මුදල් විශුද්ධිකරණ වරදක් කිරීමට සම්බන්ධවීමක්; හෝ

(ඇ) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වරදක් කිරීම සඳහා සූදානම්වීමක්,

යයි සැකකිරීමට තරම් හේතු, මූල්‍ය බුද්ධි ඒකකයට ඇත්තා වූ අවස්ථාවක-

(i) ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීම පිළිබඳව අවශ්‍ය විමසීම් කිසිවක් කිරීමට; සහ

(ii) විමසීම්වල දී, අදාළ නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනය විමසීම හෝ ඊට උපදෙස් දීම උචිත යයි මූල්‍ය බුද්ධි ඒකකයට හැඟෙන්නේ නම්, එසේ කිරීමට,

මූල්‍ය බුද්ධි ඒකකයට අවසරදීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිශ්චය කරනු ලැබිය හැකි දින හතකට වැඩි නොවන යම් කාලපරිච්ඡේදයක් සඳහා, ඒ ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීම හෝ ඒ ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට බලපාන අරමුදල් සම්බන්ධයෙන් වූ වෙනත් යම් ගනුදෙනුවක් කරගෙන යාම නොකළ යුතු බවට ලියවිල්ලකින් හෝ දුරකථන මගින්, පැය විසිහතරක් ඇතුළත තහවුරු කළ යුතු බවට එය විසින් ආයතනයට විධාන කරනු ලැබිය හැකි ය.

(3) මූල්‍ය බුද්ධි ඒකකය විසින්, (2) වන උපවගන්තියේ නියම කර ඇති පරිදි, කාලසීමාවේ දීර්ඝ කිරීමක් සඳහා වූ ඒකපාක්ෂික ඉල්ලීමක්, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් හේතු දක්වමින් කොළඹ දී පවත්වන්නා වූ බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

16. මූල්‍ය බුද්ධි ඒකකය විසින්, විදේශ රාජ්‍යයක හෝ ජාත්‍යන්තර සංවිධානයක් හෝ මණ්ඩලයක්, නැතහොත් මූල්‍ය බුද්ධි ඒකකයේ බලතල හා කාර්යවලට සමාන බලතල හා කාර්ය ඇති විදේශ රාජ්‍යවල ආණ්ඩුව විසින් පිහිටුවන ලද වෙනත් ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් වෙත යම් වාර්තාවක් හෝ තොරතුරක් හෙළිදරව් කිරීම 17 වන වගන්තිය යටතේ ඒ තොරතුරු හුවමාරු කරගැනීම පිළිබඳව, මූල්‍ය බුද්ධි ඒකකය හා ආයතනයක්, නියෝජ්‍යායතනයක්, සංවිධානයක් හෝ අධිකාරියක් අතර වන ගිවිසුමේ හෝ වැඩපිළිවෙලේ දක්වා ඇති යම් නියම හා කොන්දේසි, මත කරනු ලැබිය හැකි ය.

17. (1) මූල්‍ය බුද්ධි ඒකකය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව-

(අ) විදේශ රාජ්‍යයක හෝ විදේශ රාජ්‍යවල ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් නැතහොත්, මූල්‍ය බුද්ධි ඒකකයේ බලතල හා කාර්ය ඇත්තා වූ විදේශ රාජ්‍යවල ආණ්ඩු විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධානයක්; සහ

(ආ) විදේශ නීති බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් හෝ විදේශ අධීක්ෂණ අධිකාරියක්,

සමග, මූල්‍ය බුද්ධි ඒකකය හා ආයතනය, අධිකාරිය හෝ නියෝජ්‍යායතනය අතර තොරතුරු හුවමාරු කරගැනීම සම්බන්ධයෙන් ලියවිල්ලකින් වූ ගිවිසුමකට හෝ වැඩපිළිවෙලකට ඇතුළත් විය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ හුවමාරු කරගත් තොරතුරු, නීති විරෝධී කටයුත්තක් සංස්ථාපනය කෙරෙන වරදක් හෝ ඒ වරදට සාරානුකූලව සමාන වූ වරදක් විමර්ශනය කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමට අදාළ වේ යයි සැක කිරීමට තරම් සාධාරණ හේතු, මූල්‍ය බුද්ධි ඒකකයට, ආයතනයට හෝ නියෝජ්‍යායතනයට ඇත්තා වූ තොරතුරක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුම්වලට හෝ වැඩපිළිවෙලවලට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු යː-

(අ) නීතිවිරෝධී කටයුත්තක් සංස්ථාපනය කෙරෙන යම් ක්‍රියාවක් හෝ ඒ වරදට සාරානුකූලව සමාන වූ වරදක් විමර්ශනය කිරීම කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමට අදාළ කාර්යවලට තොරතුරු භාවිත කිරීම පිළිබඳ වූ සීමාකිරීම්; සහ

(ආ) තොරතුරු රහසිගත ආකාරයෙන් සැලකිය යුතු බවට හා මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රකාශිත අනුමතය නොමැතිව, වැඩිදුරටත් හෙළිදරව් නොකළ යුතු බවට වූ නියමය.

18. (1) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ නියමවලට යටත්ව, මූල්‍ය බුද්ධි ඒකකය හෝ ඒ සඳහා එය විසින් බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින්, මේ පනත හෝ පනත යටතේ නිකුත් කරන ලද විධාන, නියම, රීති හෝ නියෝග කිසිවකට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමේ කාර්යය සඳහා ආයතනයක වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, එහි ව්‍යාපාරික කටයුතු පිළිබඳව විමසීම් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ කාර්යය සඳහා-

(අ) මේ පනතේ I වන, II වන හා III වන කොටස්වල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම වගබලා ගැනීමට අදාළ වූ වාර්තා ඇති බව සාධාරණ හේතු මත මූල්‍ය බුද්ධි ඒකකය බලය දී ඇති තැනැත්තා විශ්වාස කරයි නම්, යම් යුක්තිසහගත වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුල්විය හැකි ය;

(ආ) පරිශ්‍රයේ හමු වූ යම් පරිගණක පද්ධතියක ඇතුළත් වූ හෝ ඇත්තා වූ දත්ත කිසිවක් පරීක්ෂා කිරීම සඳහා, යම් පරිගණක පද්ධතියක් හෝ දත්ත සැකසුම් පද්ධතියක් යෙදවීම හෝ යෙදවීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය;

(ඇ) මුද්‍රිතයක හෝ වෙනත් පැහැදිලි නිමැවුමක ආකාරයෙන් දත්තවලින් යම් වාර්තාවක් පිටපත් කර ගැනීම හෝ පිටපත් කරගැනීමට සැලැස්වීම හා මුද්‍රිතය හෝ වෙනත් නිමැවුම පරීක්ෂා කිරීම හා පිටපත්කර ගැනීම සඳහා ඉවත්කර ගැනීම කරනු ලැබිය හැකි ය; තව ද,

(ඈ) යම් වාර්තාවක පිටපත් ගැනීම සඳහා පරිශ්‍රයේ දී යම් පිටපත් කිරීමේ උපකරණයක් පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිශ්‍රය සම්බන්ධයෙන් වගකිවයුතු අයිතිකරු හෝ තැනැත්තා සහ, එහි සිටින සෑම තැනැත්තකු විසින් ම, මූල්‍ය බුද්ධි ඒකකය හෝ යම් බලයලත් තැනැත්තකු වෙත, ඔවුන්ගේ වගකීම් ඉටුකරලීමට හැකිවන පරිදි සියලු යුක්තිසහගත සහාය දිය යුතු අතර, මේ පනතේ I වන, II වන හා III වන කොටස්වල හෝ පනත යටතේ සාදන ලද නියෝගවල දැක්වෙන පරිපාලක කටයුතු සම්බන්ධයෙන් යුක්තිසහගත ලෙස අවශ්‍ය වන්නා වූ තොරතුරු කිසිවක් ඔවුනට සපයනු ලැබිය යුතු ය.

(3) මූල්‍ය බුද්ධි ඒකකය, ඒ පරීක්ෂණයෙන් ලැබුණු හෝ ලබාගත් තොරතුරු කිසිවක්, ඒ තොරතුරු සැකකටයුතු බවට හෝ මේ පනතට අනුකූලව කටයුතු නොකිරීම හෝ නීතිවිරෝධී ක්‍රියාවලියක් සංස්ථාපනය කිරීමට තුඩු දෙන වරදකට සම්බන්ධ බවට සැකකිරීමට තරම් සාධාරණ හේතු මූල්‍ය බුද්ධි ඒකකය සතුව ඇත්නම්, උචිත දේශීය හෝ විදේශීය නීතිය බලාත්මක කිරීමේ අධිකාරි හෝ අධීක්ෂණ අධිකාරී වෙත යවනු ලැබිය හැකි ය.

19. (1) මේ පනතේ I වන හා II වන කොටස මගින් හෝ ඒ යටතේ නියමිත නියමයකට අනුකූලව කටයුතු කිරීමට නියමිත සහ එසේ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වන තැනැත්තකු, අදාළ අනනුකූලව කටයුතු කිරීමේ ස්වභාවය හා බැරෑරුම්කම සැලකිල්ලට ගනිමින් නියම කරනු ලැබිය හැකි දණ්ඩනයකට යටත් කළ යුතු ය. එසේ වුව ද, යම් නියමිත නඩුවක දී, ඒ දණ්ඩනය රුපියල් මිලියන එකකට වැඩි නොවිය යුතු ය. තැනැත්තකු කලින් අවස්ථාවක දී දණ්ඩනයකට යටත් වී ඇති විටෙක යම් තදනන්තර අවස්ථාවක දී නියමයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති අවස්ථාවක, පළමු අවස්ථාවට පසුව, අනුකූලව කටයුතු නොකළ එක් එක් අවස්ථාව වෙනුවෙන් පළමු අවස්ථාවේ දී දණ්ඩනයක් වශයෙන් පනවන ලද දෙගුණයක මුදලක් ඇතුළත් වූ මුදලට අතිරේක දඩමුදලක් ගෙවීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) මේ වගන්තිය මගින් නියම කරන ලද දඩ මුදලක් එකතු කිරීම සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය වගකිව යුතු අතර, එසේ එකතු කරන ලද මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාර දඩ මුදලකට යටත්වන තැනැත්තකු ඒ දඩ මුදල ගෙවීමට අපොහොසත් වේ නම්, දඩ මුදල ගෙවීමේ ආඥාවක් සඳහා ඒකකය විසින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණය වෙත ඒකපාර්ශ්වික ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාව කරනු ලැබූ විට, ඒ මුදල, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අයකර ගනු ලබන ආකාරයටම අයකරගනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ දඩ මුදලක් පැනවීමෙන්, ආයතනයක අධීක්ෂණ අධිකාරියක් හෝ නියාමන හෝ ස්වයං නියාමන අධිකාරියක් විසින් ඒ ආයතනයේ ව්‍යාපාරික හෝ වෘත්තීය කරගෙන යාම අත්හිටුවීම හෝ ඒ ආයතනය නියාමනය හෝ අධීක්ෂණය සඳහා අදාළ වන යම් ලිඛිත නීතියක් හෝ රීති ප්‍රකාර අවසර දෙනු ලැබිය හැකි ව්‍යාපාරයක් හෝ වෘත්තියක් කරගෙන යාම සඳහා දෙන ලද බලපත්‍රයක් හෝ බලයක් වලංගු කිරීම ඇතුළු යම් නියාමන හෝ විනයානුකූල පියවරක් ගැනීමෙන් වළක්වාලීම කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ දඩ මුදලක් පුද්ගල මණ්ඩලයක් වෙත පනවනු ලැබ ඇති අවස්ථාවක-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, (1) වන උපවගන්තිය යටතේ වූ නියමයන් පනවනු ලබන අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, ලේකම් හෝ වෙනත් සමාන නිලධරයකු වී සිටි සෑම තැනැත්තකු ම; නැතහොත්,

(ආ) ඒ මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නොවේ නම්, ඒ නියමයන් පනවනු ලබන අවස්ථාවේ දී, ඒ මණ්ඩලයේ සභාපති, කළමනාකරු, ලේකම් හෝ වෙනත් සමාන නිලධාරයකු වී සිටි සෑම තැනැත්තකුම,

නියමයට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම පිළිබඳව තමාට දැනීමක් නොතිබූ බව හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට වගබලාගැනීම සඳහා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියාකළ බව ඔහු ඔප්පු කරන්නේ නම් මිස, ඒ දඩමුදල ගෙවීමට යටත් විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව මූල්‍ය බුද්ධි ඒකකය විසින් සාධාරණ හේතුවක් නොමැතිව, මේ පනතේ I වන, II වන හා III වන කොටස්වල බැඳීම්, එනම්, රීති යටතේ වූ බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගැනීම සඳහා යම් විධානයක සඳහන් කාර්ය සැලැස්මක් ක්‍රියාත්මක කරනු පිණිස යම් මූල්‍ය ආයතනයක් වෙත විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කිරීම ආයතනයක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක මූල්‍ය බුද්ධි ඒකකය විසින් කොළඹ දී පවත්වන්නා වූ බස්නාහිර පළාත් මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමෙන් යුක්තිසහගත හේතුවක් නොමැතිව ආයතනයක් විසින් (6) වන උපවගන්තිය යටතේ එය විසින් නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කිරීම සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් පැහැර හරිනු ලැබ ඇති බව අධිකරණය සෑහීමකට පත් කිරීමෙන් ආයතනයට එරෙහිව ආඥාවක් ලබාගත හැකි අතර, ඒ ආයතනයේ නිලධරයක් හෝ සේවා

නියුක්තයන් කිසිවකු හෝ සියලු දෙනාම ලවා අවශ්‍ය යයි අධිකරණය සලකන යම් නියම මත ඒ බැඳීමට අනුකූලව කටයුතු කිරීම බලාත්මක කරනු ලැබිය හැකි ය.

20. (1) මේ වගන්තියේ විධිවිධාන මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තකයකු හෝ අනුයෝජිතයකු වන හෝ වූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් මේ පනත යටතේ ඔහුගේ හෝ ඇයගේ කාර්යය ඉටුකිරීමේ හෝ ඔහුගේ හෝ ඇයගේ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නැතහොත් එසේ කිරීමට යම් අධිකරණයක් විසින් නීත්‍යානුකූල ලෙස නියම කරනු ලැබූ විට, එසේ කිරීමේ කාර්යය සඳහා හැර, ඔහුගේ හෝ ඇයගේ කාර්යය ඉටුකිරීමේ දී, නැතහොත් ඔහුට හෝ ඇයට දැනීමක් ඇත්තා වූ මේ පනත යටතේ වූ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ දී ඔහු හෝ ඇය විසින් ලබාගත් යම් තොරතුරක් හෝ කාරණයක් පහත දැක්වෙන කාර්ය එකක් හෝ වැඩි ගණනක් සඳහා හැර, හෙළිදරව් කරනු නොලැබිය යුතු යː-

(අ) මේ පනතේ හෝ ඊට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක ඇතුළත් යම් නියමයකට අනුකූලව කටයුතු කරවා ගැනීම හෝ යම් නියමයක් මඟහැරීම අනාවරණය කර ගැනීම සඳහා;

(ආ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත ක්‍රියාත්මක කිරීම සඳහා හෝ;

(ඇ) (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 50අ වගන්තියේ කාර්යය සඳහා.

21. මූල්‍ය බුද්ධි ඒකකයේ යම් සේවා නියුක්තයකු හෝ එහි ව්‍යවස්ථාපිත කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් පත් කරන ලද යම් බලයලත් නිලධරයකු, අනුයෝජිතයකු හෝ තැනැත්තකු මේ පනත යටතේ එහි ව්‍යවස්ථාපිත කර්තව්‍ය කිසිවක් ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අරමුණු කර ගැනීමේ දී වූ යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන්, ඒ ක්‍රියාව හෝ නොකර හැරීමේ වූයේ අසද්භාවයෙන් බව පෙන්වන ලද්දේ නම් මිස, අලාභවලට යටත් නොවිය යුතු ය.

## IV වන කොටස

## ආයතනයක අධීක්ෂණ අධිකාරියේ හා විගණකවරුන්ගේ කර්තව්‍යය

22. (1) ආයතනයක අධීක්ෂණ අධිකාරියට හෝ විගණකවරයකුට, යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීමක් පිළිබඳ එය සතු තොරතුරු-

(අ) යම් නීති විරෝධී ක්‍රියාවලියක් සම්බන්ධයෙන් වූ විමර්ශනයකට හෝ නඩු පැවරීමකට අදාළ වේ යයි;

(ආ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ හා 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ දී සහාය වේ යයි;

(ඇ) නීති විරෝධී ක්‍රියාවක් සංස්ථාපනය කෙරෙන යම් ක්‍රියාවක් කිරීමට සම්බන්ධවී ඇතැයි; හෝ

(ඈ) ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ වරදට සූදානම් යයි,

සැකකිරීමට තරම් සාධාරණ හේතු ඇති අවස්ථාවක ආයතනයේ අධීක්ෂණ අධිකාරිය හෝ විගණකවරයා විසින්, ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීම පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) මූල්‍ය බුද්ධි ඒකකයේ ඉල්ලීම මත, අධීක්ෂණ අධිකාරිය විසින්, ආයතනයට අදාළ යම් ගනුදෙනුවක් හෝ වෙනත් කාරණයක් පිළිබඳව යම් පරීක්ෂණයක් කරගෙන යායුතු අතර, ඒ පරීක්ෂණය පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(3) යම් අධීක්ෂණ අධිකාරියක් විසින් නියාමනය කරනු ලබන ආයතනයක් වෙත මාර්ගෝපදේශ, විධාන හෝ නියෝග නිකුත් කිරීම සම්බන්ධයෙන්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඒ අධීක්ෂණ අධිකාරිය විමසා බැලිය යුතු අතර, ඒ ආයතනය වෙත නිකුත්කරන ලද සියලු මාර්ගෝපදේශවල, නියෝගවල හෝ විධානවල පිටපත් අධීක්ෂණ අධිකාරිය වෙත සපයනු ලැබිය යුතු ය.

23. ආයතනයක අදාළ අධීක්ෂණ අධිකාරිය විසින්-

(අ) ක්‍රමානුකූල පරීක්ෂණ මගින්, ආයතනයක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන්නේදැයි සත්‍යායනය කළ යුතු අතර, යම් අනනුකූලව කටයුතු කිරීමක් පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(ආ) නීති විරෝධී කටයුත්තක් සංස්ථාපනය කෙරෙන යම් වරදකට අදාළ යම් විමර්ශනයක දී, නඩු පැවරීමක දී, හෝ නීති කෘත්‍යවල දී, නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන හා මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගයෙන් ක්‍රියාකරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## දේශ සීමාවේ දී මුදල් පිළිබඳව වාර්තා කිරීම

24. (1) තැනැත්තකු-

(අ) ශ්‍රී ලංකාවෙන් බැහැරවීමට සූදානම් වූ හෝ ශ්‍රී ලංකාවට පැමිණියා වූ; නැතහොත්,

(ආ) යම් නැවකින් හෝ ගුවන් නැවකින් යාමට හෝ බැහැරවීමට යන හෝ ගියාවූ හෝ බැහැරවූ,

අවස්ථාවක දී, බලයලත් නිලධරයකු විසින්, සාධාරණව සහ අවශ්‍ය වූ යම් සහායක් හා අවශ්‍ය පරිදි බලය යොදාගනිමින්, තැනැත්තා සතුව ඔහුගේ හෝ ඇයගේ සන්තකයේ යම් මුදලක් හෝ (5) වන උප වගන්තිය යටතේ වාර්තාවක් අවශ්‍ය වන්නාවූ ධාරක සාධන පත්‍ර කිසිවක් ඇද්දැයි නිශ්චය කිරීමේ කාර්යය සඳහා-

(i) තැනැත්තකු සතුව, ඔහුගේ හෝ ඇයගේ භාරයේ ඇත්තාවූ, නැතහොත් ඔහුගේ හෝ ඇයගේ මාර්ගෝපකරණ කට්ටලයේ ඇත්තාවූ යම් භාණ්ඩයක් පරීක්ෂාකිරීම; සහ

(ii) මේ පනතේ 27 වන වගන්තිය යටතේ වූ වරදක් කරනු ලැබ ඇතැයි හෝ කරනු ලබන්නේදැයි සැකකිරීමට තරම් සාධාරණ හේතු නිලධරයා සතුව ඇත්නම්, තැනැත්තා සෝදිසි කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) තැනැත්තකු, එම ස්ත්‍රීපුරුෂ භාවයේම තැනැත්තකු විසින් හැර, සෝදිසි කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති මගින් පවරණ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා යම් නැවක්, ගුවන් නැවක් හෝ වාහනයක් නතර කිරීම, ඊට ඇතුල්වීම හා සෝදිසි කිරීම බලයලත් නිලධරයකු විසින් හා ඒ නිලධරයාට සහායවන යම් තැනැත්තකු විසින් කරනු ලැබිය හැකි ය.

(4) ඉහත සඳහන් (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ පරීක්ෂණයක් කරගෙන යාමේ දී කරන ලද සෝදිසියක දී සොයාගනු ලැබූ මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර, නීති විරෝධී ක්‍රියාවලියක් කිරීම පිළිබඳ සාක්ෂි විය හැකි යයි විශ්වාසකිරීමට තරම් සාධාරණ හේතු, බලයලත් නිලධරයකුට ඇති අවස්ථාවක, ඒ සෝදිසි කිරීමෙන් පැය විසිහතරක් ඇතුළත, නිලධරයා විසින් මුදල හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර තහනමට ගනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ මුදල් හා ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍රයක් තහනමට ගනු ලැබූ බලයලත් නිලධරයකු විසින්, ඒ තහනමට ගැනීම පිළිබඳව ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

25. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නා වූ හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන්නා වූ, යම් ආකෘතියක හෝ ආකාරයක මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර කිසිවක්, මේ කොටසේ විධිවිධානවලට අනුකූලව බලයලත් නිලධරයකු විසින් තහනමට ගැනීම හා රඳවා තැබීම, එය-

(අ) යම් නීති විරෝධී ක්‍රියාවලියක් කිරීමෙන් ලබාගත්; හෝ

(ආ) නීති විරෝධී ක්‍රියාවලියක් කිරීමෙහිලා පාවිච්චි කිරීම සඳහා යම් තැනැත්තකු විසින් අදහස් කරන ලද; හෝ

(ඇ) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත ප්‍රකාර, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හා සම්බන්ධ යම් වරදක් සඳහා යොදා ගැනීමට අදහස් කරන ලද,

ඒවා යයි සැකකිරීමට තරම් සාධාරණ හේතු ඔහු හෝ ඇය සතුව ඇත්නම්, කරනු ලැබිය හැකි ය.

26. (1) 24 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 25 වන වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ මුදල් හා ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර තහනමට ගැනීමෙන් පසු වැඩ කරන දින හතරකට වැඩියෙන් රඳවා තැබීම-

(අ) යම් නීති විරෝධී ක්‍රියාවලියක් කිරීමෙන් හෝ එවැනි වරදක් කිරීමේ දී පාවිච්චි කිරීම සඳහා හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත යටතේ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හා සම්බන්ධ යම් වරදක් කිරීම සඳහා ලබාගත් බවට සැකකිරීමට තරම් තුඩුදෙන සාධාරණ හේතු ඇති බවට; සහ

(ආ) එහි මූලාරම්භය හෝ ප්‍රභවය වැඩිදුර විමර්ශනය කිරීමේ දී නොකඩවා රඳවා තැබීම සාධාරණ බවට,

සෑහීමට පත්වූ විට, තහනමට ගනු ලැබූ දින පටන් මාස තුනකට නොවැඩි කාල පරිච්ඡේදයක් සඳහා නොකඩවා රඳවා තැබීමේ ආඥාවක් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණය විසින් එයට කරනු ලබන ඉල්ලීමක් මත කරනු ලබන්නේ නම්, මිස එම මුදල් හා ගනුදෙනු කළහැකි සාධන පත්‍ර තහනමට ගැනීමෙන් පසු වැඩ කරන දින හතරකට වැඩියෙන් රඳවා තැබීම නොකළ යුතු ය.

(2) අධිකරණය විසින්, අදාළ යයි එය නිශ්චය කරන පාර්ශ්වකරුවන් වෙත දැනුම් දීමෙන්, (1) වන උපවගන්තියේ සඳහන් කාරණා පිළිබඳව සෑහීමට පත්වන්නේ නම්, මුදල් හා ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර නොකඩවා රඳවා තැබිය යුතු යයි, විභාග කිරීමෙන් පසුව, තදනන්තරව ආඥා කරනු ලැබිය හැකි නමුත්, රඳවා තැබීමේ මුළු කාලපරිච්ඡේදය ආඥාවේ දින සිට අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.

(3) (4) වන උපවගන්තියට යටත්ව, මේ වගන්තිය යටතේ රඳවාගත් මුදල් හා ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර, ඒවා තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන්ද ඒ තැනැත්තා වෙත හෝ-

(අ) එය නොකඩවා රඳවා තබාගැනීම තව දුරටත් සාධාරණ නොවන බවට වූ අධිකරණයක ආඥාවක් මගින් හා ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් කළ ඉල්ලීමක් මත;

(ආ) එය නොකඩවා රඳවා තබාගැනීම තව දුරටත් සාධාරණ නොවන බවට සෑහීමට පත් වේ නම්, බලයලත් නිලධරයකු විසින්,

ඊට හිමිකම් පෑමක් තහවුරු කරන යම් තැනැත්තකු වෙත සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් මුදාහරිනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ රඳවා තබාගත් කිසියම් මුදලක් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත යටතේ වූ විමර්ශනයකට, නඩු පැවරීමකට හෝ නීති කෘත්‍යයකට අදාළවන අවස්ථාවක, මුදාහරිනු නොලැබිය යුතු ය.

(5) මුදල් හෝ ගනුදෙනු කළහැකි ධාරක සාධන පත්‍ර තහනමකට ගැනීමෙන් හෝ රඳවා තබාගැනීමෙන් අවුරුදු එකක කාලයක් ඇතුළත යම් තැනැත්තකු විසින් හිමිකම් පෑමක් නොකරනු ලැබූ අවස්ථාවක, ඒ මුදලේ හෝ ගනුදෙනු කළහැකි සාධන පත්‍ර හෝ අවස්ථාවෝචිත පරිදි, ඒවා මහ බැංකුවට විකිණීමෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ලත් එහි සමාන මුදල ඒකාබද්ධ අරමුදලට රාජසන්තක කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## වැරදි

27. යම් තැනැත්තකුගේ සන්තකයේ, නැතහොත්, ඔහුගේ හෝ ඇයගේ මාර්ගෝපකරණවල නියමිත ගණනට වඩා මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර සහිතව, ශ්‍රී ලංකාවෙන් ඉවත්ව යන හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන යම් තැනැත්තකු ප්‍රථමයෙන් එම කරුණ අදාළ බලධරයාට වාර්තා නොකරන යම් තැනැත්තෙක් වරදකට වරදකරුවන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම දඬුවම් කරනු ලැබිය යුතු ය.

28. (1) 6 වන, 7 වන, 8 වන හෝ 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් ඉදිරිපත් කිරීමේ දී, යම් විශේෂ කරුණක දී වැරදි යයි හෝ නොමගයවන සුළු යයි තමා දන්නා යම් ප්‍රකාශයක් කරන, නැතහොත්, ප්‍රකාශය වැරදි බව දැනගෙන යම් ප්‍රකාශයකින් යම් කාරණයක් හෝ දෙයක් ඉවත් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකින් හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට, හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය හැකි ය.

(2) නීති විරෝධී කටයුත්තක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් හෝ මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ වරදක් විමර්ශනය කිරීමට අගතියක් කිරීමේ චේතනාවෙන් හෝ ඔහුට හෝ ඇයට නැතහොත්, වෙනත් යම් තැනැත්තකුට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ප්‍රයෝජනයක් හෝ මුදල් ලාභයක් ලබාගැනීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුට අලාභයක් හෝ අවාසියක් කිරීමේ කාර්යය සඳහා, තැනැත්තකු 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය කඩකරන්නේ නම්, ඒ තැනැත්තා වරදකට වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට, නැතහොත්, ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් වන්නේ ය.

(3) 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ බලතල නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමේ දී, මූල්‍ය බුද්ධි ඒකකයට හෝ යම් බලයලත් තැනැත්තකුට යම් තැනැත්තකු ඕනෑ කමින්ම බාධාකරන්නේ නම් හෝ අවහිර කරන්නේ නම්, නැතහොත්, සහයෝගයෙන් කටයුතු කිරීම පැහැර හරින්නේ නම්, හෝ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව කටයුතු නොකරන්නේ නම්, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(4) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වළක්වාලීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීමකට යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් අදාළ වේ යයි විශ්වාස කිරීමකට තරම් හේතු දැන දැනම හෝ තිබිය දී ඒ ලේඛනයේ හෝ ද්‍රව්‍යයේ සත්‍යතාව හෝ සම්පූර්ණත්වය කෙරෙහි බලපාන ව්‍යාජ ලේඛනයක් යම් තැනැත්තකු සාදන්නේ නම්; එසේ කරන්නේ නම් හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන්නේ නම්, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමටකට, හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම දඬුවම් කළ හැකි වරදකට වරදකරු වන්නේ ය.

(5) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන් වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීමකට යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් අදාළ වේ යයි යම් තැනැත්තකු දන්නේ නම් හෝ එසේ විශ්වාස කිරීමට තරම් හේතු ඔහු සතුව ඇත්තේ නම්, ඒ ලේඛනය හෝ ද්‍රව්‍යය විනාශ කරන හෝ අන්‍යාකාරයකින් බැහැර කරන ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකින්ම දඬුවම් කළ හැකි වරදකට වරදකරු වන්නේ ය.

(6) ව්‍යාජ හෝ බොරු නමකින් ආයතනයක් සමග ගිණුමක් විවෘත කරන, ක්‍රියාත්මක කරන හෝ විවෘත කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට බලය දෙන තැනැත්තකු වරදකට වරදකරුවන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත්කර දඬුවම් කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## විවිධ විධිවිධාන

29. (1) බලය දිය යුතු යයි හෝ සැදිය යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සඳහා හෝ මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කරුණක් පිළිබඳව නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) මුදල් කාර්ය බලකායේ නිර්දේශවලට අනුකූලව, උචිත අන්තරාය කළමනාකරණ පද්ධති හඳුනාගැනීම;

(ආ) ව්‍යාපාරික සම්බන්ධතාවයන් පිළිබඳ පවත්නා සමීක්ෂණය, ආයතන විසින් කරගෙන යා යුතු ආකාරය; සහ

(ඇ) අන්තරාය කළමනාකරණයට අදාළ මුදල් කාර්ය බලකායේ නිර්දේශ අදාළ කිරීමේ කාර්යය සඳහා-

(i) අන්තරාය කළමනාකරණ කාර්ය සඳහා ගනුදෙනුකරුවන් වර්ගීකරණය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා අදාළ කරනු ලැබිය යුතු මාර්ගෝපදේශ;

(ii) අති අන්තරාය ගනුදෙනුකරුවන් වශයෙන් වර්ගකරනු ලැබ ඇති ගනුදෙනුකරුවන් සමග ව්‍යාපාරික සම්බන්ධතා ඇති කරගැනීමට පෙරාතුව, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ අනුමතය ලබාගත යුතු ආකාරය,

නිශ්චිත වශයෙන් සඳහන් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු, හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් අනනුමතයේ දින පටන්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්නවූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

30. (1) මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, මේ පනතේ විධිවිධාන අදාළවන සියලු ආයතනවල ගනුදෙනු සම්බන්ධයෙන් පමණක් මේ පනත අදාළ විය යුතු ය.

(2) තත් කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත අදාළවන සියලු තැනැත්තන් විසින්ම, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු යයි නියම කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන, මෙහි දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක් අභිබවා යා යුතු ය.

31. රහස්‍ය භාවය පිළිබඳ යම් බැඳීමක් හෝ තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවන ලද වෙනත් සීමාකිරීමක් තිබුන ද එය නොතකා ආයතනයක් විසින්, මේ පනතේ නියමවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

32. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

මේ පනතෙහි, ''ගිණුම'' යන්නෙන්, පහත දැක්වෙන දේවල් අතුරින් ආයතනයක් විසින් කරනු ලබන යම් පහසුකමක් හෝ වැඩ පිළිවෙලක් අදහස් වේ:-

(අ) මුදල් තැන්පතු පිළිගනී;

(ආ) මුදල් ආපසු ගැනීමට අවසර දෙයි; නැතහොත්,

(ඇ) ආයතනය වෙනුවෙන් චෙක්පත් හෝ ගෙවීම් ඇණවුම් ගෙවනු ලබයි; නැතහොත් මූල්‍ය ආයතනය නොවන තැනැත්තකු වෙනුවෙන් චෙක්පත් හෝ ගෙවීම් ඇණවුම් එකතු කරයි;

තවද, ආරක්ෂක තැන්පතු පෙට්ටියක් සඳහා හෝ වෙනත් යම් ආකෘතියක වූ ආරක්ෂක තැන්පතු සඳහා වූ යම් පහසුකමක් හෝ වැඩ පිළිවෙළක් ද ඇතුළත් වේ;

''බලයලත් නිලධරයා''යන්නෙන්-

(අ) සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට ඉහළ පොලිස් නිලධරයෙක්; හෝ

(ආ) රේගු අධිකාරීවරයාගේ නිලයට ඉහළ රේගු නිලධරයෙක්

අදහස් වේ;

''මුදල්'' යන්නෙන් රටේ වලංගු මුදල් වශයෙන් නම්කරනු ලැබ ඇති යම් කාසියක් හෝ මුදල් නෝට්ටුවක් අදහස් වන අතර, ධාරක බැඳුම්කර,සංචාරක චෙක්පත්, තැපැල් නෝට්ටු හා මුදල් ඇණවුම් ද ඊට ඇතුළත් වේ;

''ව්‍යවහාර මුදල්'' යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක වලංගු මුදල් වශයෙන් නම් කරනු ලැබ ඇත්තා වූ හා නිකුත් කරන ලද රටෙහි හුවමාරු මාධ්‍යයක් වශයෙන් ව්‍යවහාරිකව පාවිච්චි කරනු ලබන්නා වූ හා පිළිගනු ලැබ ඇත්තා වූ ද ව්‍යවහාර මුදල අදහස් වේ;

''ගනුදෙනුකරු'' යන්නට, ගනුදෙනුවක් හෝ ගිණුමක් සම්බන්ධයෙන් වන විට-

(අ) ගනුදෙනුවක් හෝ ගිණුමක් පිළියෙල කරනු ලැබ ඇත්තේ, විවෘත කරනු ලැබ ඇත්තේ හෝ භාරගෙන ඇත්තේ යම් තැනැත්තකුගේ නමින් ද ඒ තැනැත්තා;

(ආ) ගනුදෙනුවක හෝ ගිණුමක අත්සන්කරු;

(ඇ) ගනුදෙනුවක් පවරනු ලැබ ඇත්තේ හෝ මාරුකරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා;

(ඈ) ගනුදෙනුවක් පවත්වාගෙන යාමට බලයලත් තැනැත්තෙක්; හෝ

(ඉ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තෙක්,

ඇතුළත් වේ;

"නාමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාර" යන්නට-

(අ) පෞද්ගලික හා සාමූහික ලිපිකෝෂ කළමනාකරණය කිරීම;

(ආ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදල් ආයෝජනය කිරීම, පරිපාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ඇ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් මුදල් හෝ ද්‍රවශීල ඇප සුරැකිව තබාගැනීම හා පරිපාලනය කිරීම;

(ඈ) මනා රැකවරණ සේවා;

(ඉ) අනුයෝජිතයන් හා තැරැව්කරුවන් විසින් රක්ෂණයට මැදිහත්වීම මෙන්ම ප්‍රාරක්ෂණය හා රක්ෂණයේ තැබීම;

(ඊ) භාරකාර පරිපාලනය හෝ ආයෝජන කළමනාකරණය හෝ අධිවෘද්ධක්ව යෝජනා ක්‍රමයක්;

(උ) කැසිනෝ, සූදු ගෙවල් හෝ තම ගනුදෙනුකරුවන් නියමිත සීමාවට සමානව හෝ එය ඉක්මවා, මූල්‍යමය ගනුදෙනුවල යෙදී සිටින විට, අන්තර් ජාලය මගින් එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙකු ද ඇතුලුව ලොතරැයියක් පවත්වාගෙන යාම;

(ඌ) නිශ්චල දේපළ මිලට ගැනීම හා විකිණීමට අදාළව, තම සේවාදායකයන් සඳහා ගනුදෙනුවල යෙදුණු නිශ්චල දේපළ අනුයෝජිතයන්;

(එ) නියමිත සීමාවට සමානව හෝ එය ඉක්මවා, ගනුදෙනුකරුවකු, සමග මුදල් ගනුදෙනුවල නිරතවන විට, 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ පනතින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ, වටිනා ලෝහ වෙළෙඳුන් සහ මැණික් ගල් හා අඩ මැණික් ගල් වෙළෙඳුන්;

(ඒ) පහත දැක්වෙන කටයුතු අතුරෙන් කිසිවකට අදාළව, තම සේවාදායකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සූදානම් වනවිට හෝ ඒවා කරගෙන යන විට, නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හා ගණකාධිකාරීවරුන්:-

(i) නිශ්චල දේපළ මිලට ගැනීම හා විකිණීම;

(ii) සේවාදායක මුදල්, ඇප හෝ වෙනත් වත්කම් කළමනාකරණය;

(iii) බැංකුවේ ඉතිරිකරගත් මුදල් හෝ ඇප ගිණුම් කළමනාකරණය කිරීම;

(iv) සමාගම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා දායක මුදල සංවිධානය කිරීම; සහ

(v) නෛතික පුද්ගලයින් ඇතිකිරීම, මෙහෙයවීම හෝ කළමනාකරණය කිරීම හෝ ව්‍යාපාර අස්තිත්ව පිළියෙළ කිරීම, මිලට ගැනීම හා විකිණීම;

(ඔ) මේ අර්ථකථනයෙන් අන්‍යාකාරයකින් ආවරණය නොවන්නාවූ, ව්‍යාපාරයක් වශයෙන් තුන්වන පාර්ශ්වයන්ට පහත දැක්වෙන සේවාවන් එකක් හෝ වැඩි ගණනක් සපයන්නා වූ භාරයක් හෝ සමාගම් සේවා සපයන්නෙක් :-

(i) නෛතික පුද්ගල සැකසුම හෝ කළමනාකරණය;

(ii) සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු, කොටස්කරුවකු හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ වෙනත් නෛතික පුද්ගලයින්ට අදාළව සමාන තත්ත්වයකින් ක්‍රියාකිරීම හෝ ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තකු වෙනුවෙන් කටයුතු පිළියෙල කිරීම;

(iii) සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් නෛතික පුද්ගලයෙක් හෝ නියමිත ස්ථානයක් සඳහා ලියාපදිංචි කරන ලද කාර්යාලයක්, ව්‍යාපාරික ලිපිනයක් හෝ ඉඩකඩ, තැපැල් මාර්ගික හෝ පරිපාලනමය ලිපිනයක් ලබාදීම;

(iv) ප්‍රකාශිත භාරයක භාරකරුවකු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු සූදානම් කිරීම;

(v) වෙනත් තැනැත්තකු වෙනුවෙන් නාමික කොටස්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු සූදානම් කිරීම;

(ඕ) වෙනත් ලිඛිත නීතිවල අක් වෙරළ ඒකක සඳහා දී ඇති අර්ථකථනවලට අනුකූලව ඒවා ඇතිකිරීම; සහ

(ක) ජාතික ආර්ථික සම්බන්ධතා සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින් කලින් කල නියමකරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාර,

ඇතුළත් විය යුතු ය.

''ලේඛනය'' යන්නෙන්, තොරතුරු පිළිබඳ යම් වාර්තාවක් අදහස් වන අතර, එයට-

(අ) ලිවීමක් ඇති යම් දෙයක්;

(ආ) අර්ථයක් ඇත්තා වූ ලකුණු, ඉලක්කම්, සලකුණු හෝ සිදුරු අර්ථකථනය කිරීමේ සුදුසුකම්ලත් තැනැත්තන්ට, එවැනි දේ ඇති යම් දෙයක්;

(ඇ) වෙනත් යම් දෙයක ආධාරයක් ඇතිව හෝ නැතිව ශබ්ද, ප්‍රතිරූප හෝ ලියවිලි නිපදවිය හැකි යම් දෙයක්;

(ඈ) සිතියමක්, සැලැස්මක්, සිත්තමක්, ඡායාරූපයක් හෝ සමාන දෙයක්; සහ

(ඉ) විද්‍යුත් ආකෘතියකින් තබා ඇති හෝ පවත්වාගනු ලබන, ඉහත සඳහන් යම් දෙයක්,

ඇතුළත් වේ.

''මූල්‍ය ව්‍යාපාරය'' යන්නට; පහත දැක්වෙන ව්‍යාපාර හෝ කටයුතු අතුරෙන් යමක් ඇතුළත් වේ :-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතෙහි අර්ථ නිරූපණය කර ඇති පරිදි බැංකු ව්‍යාපාරය;

(ආ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතෙහි අර්ථ නිරූපණය කර ඇති පරිදි මුදල් ව්‍යාපාරය (පනත යටතේ තැනැත්තා බලපත්‍රලාභියකු ද නැතහොත්, ලියාපදිංචි වූ අයෙකු ද යන බව නොසැලකිය යුතු ය);

(ඇ) පාරිභෝගික ණය, උකස් ණය වගකීමක් ඇතිව හෝ නැතිව, සාධකවලට බෙදීම ඇතුලු ණය දීම සහ වෙළෙඳ ගනුදෙනුවලට මුදල් සැපයීම;

(ඈ) පාරිභෝගික නිෂ්පාදනවලට අදාළ ගනුදෙනු නොවන මුදල් බදු ගැනීම;

(ඉ) මුදල් හෝ මුදලේ අගය මාරු කිරීම;

(ඊ) මුදල් හා ව්‍යවහාර මුදල් මාරු කිරීමේ සේවා;

(උ) ගෙවීමේ විධි නිකුත්කිරීම හා කළමනාකරණය කිරීම (එනම් බැර පත්, සංචාරක චෙක්පත්, මුදල් ඇණවුම්, බැංකු අයිරා හා විද්‍යුත් මුදල්);

(ඌ) පාරිභෝගික බැර, වගකීමක් ඇතිව හෝ නැතිව සාධනවලට බෙදීම් ඇතුලුව, එහෙත් ඒවාට සීමා නොවී මුදල් ඇපවීම් හා වැයකිරීම් නිකුත් කිරීම හා අභිමිකිරීම් ද ඇතුළත්ව වාණිජ ගනුදෙනුවලට මුදල් සැපයීම;

(එ) මුදල් වෙළඳපොළ සාධන පත්‍ර (එනම් චෙක්පත්, බිල්පත්, තැන්පතු සහතික සහ ව්‍යුත්පන්න) මගින්, විදේශ විනිමය, විනිමය, පොලී අනුපාතය හා සුචි සාධන පත්‍ර, අනාගත වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳාම සහ පැවරිය හැකි ඇප මගින් තමා වෙනුවෙන් හෝ ගනුදෙනුකරුවන් වෙනුවෙන් වෙළෙඳාම් කිරීම;

(ඒ) ඇප ප්‍රශ්න හා ඒ ප්‍රශ්නවලට අදාළ මූල්‍ය සේවා සැපයීම; සහ

(ඔ) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින් කලින්කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාර

''මූල්‍ය බුද්ධි ඒකකය'' යන්නෙන්, මේ පනතේ විධිවිධාන පිළිබඳ පරිපාලනය භාරකරනු ලැබිය යුතු, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, ආයතනයක් හෝ අධිකාරියක් හෝ ඒ දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ, ආයතනයේ හෝ අධිකාරියේ යම් දෙපාර්තමේන්තුවක් හෝ ඒකකයක් අදහස් වේ. අමාත්‍යවරයා විසින් නියමය කිරීමේ දී එහි කර්තව්‍යවලට අදාළව නම්කරනු ලැබිය යුතු ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය සංස්ථාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ අධිකාරියේ හැකියාව හා මිනිස් ශ්‍රමය සහ මේ පනත යටතේ කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා කාර්යක්ෂම ලෙස ක්‍රියාකිරීමේ පූර්ණ හැකියාව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

''ආයතනය'' යන්නෙන්, මේ පනතේ අර්ථානුකූලව, යම් මූල්‍ය ව්‍යාපාරයක හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක නිරත වූ හෝ ඒවා කරගෙන යනු ලබන යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

''මුදල් මාරු කිරීමේ සේවා'' යන්නෙන්-

(අ) මුදල් හෝ මුදලේ අගය හුවමාරු කිරීමේ,

(ආ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදලේ අගය එකතුකිරීමේ, දැරීමේ, හුවමාරු කිරීමේ හෝ ප්‍රේෂණය කිරීමේ හෝ අන්‍යාකාරයෙන් අරමුදල් මාරුකිරීමේ;

(ඇ) අරමුදල් සැපයීමේ; හෝ

(ඈ) සංචාරක චෙක්පත්, මුදල් ඇණවුම් හෝ සමාන සාධන පත්‍ර නිකුත් කිරීමේ, විකිණීමේ හෝ බේරුම් කිරීමේ,

ව්‍යාපාරය කරගෙන යන (මහ බැංකුව විසින් බලපත්‍ර දී ඇති බැංකුවක් නොවන) තැනැත්තෙක් අදහස් වේ;

''ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍රය'' යන්නෙන්, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු හෝ තැන්පතු සහතික ඒවා දරන්නාට ගෙවිය යුතු වුවද නොවුව ද ඒවාද ඇතුළුව ණය හෝ බැඳීම් පිළිබඳ අයිති නියෝජනය කෙරෙන ලේඛනයක් අදහස් වේ;

''අක්වෙරළ ඒකකය'' යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ IV වන කොටසේ විධිවිධානවලට යටත්ව, අක්වෙරළ බැංකු කටයුතු පිළිබඳව බැංකු ව්‍යාපාරය කරගෙන යන බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍රලත් විශේෂ බැංකුවක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ;

''තැනැත්තා'' යන්නෙන්, නීත්‍යානුකූල පෞරුෂයක් ඇත්තේ වුව ද නොවුව ද පුද්ගල මණ්ඩලයක් ද ඇතුළුව යම් ස්වාභාවික හෝ නීත්‍යානුකූල තැනැත්තෙක් අදහස් වන අතර, ඒ තැනැත්තාගේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ඒ තැනැත්තාගේ පුද්ගල මණ්ඩලයේ ශාඛාවක් ද ඊට ඇතුළත්වේ;

''නියමිත'' යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ;

''මුදල් විශුද්ධිකරණ වරද'' යන්නෙන්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 4 වන වගන්තියේ කර ඇති පරිදි වූ වරදක් වේ;

''ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ වරද යන්නෙන්'' 2005 අංක 25 දරන ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත ප්‍රකාර වරදක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් අදහස් වේ;

''දේපළ'' යන්නෙන්, යම් ව්‍යවහාර මුදලක් අදහස් වන අතර, එයට ද්‍රව්‍යමය හෝ අද්‍රව්‍යමය, චංචල හෝ නිශ්චල ස්පර්ශ කළ හැකි හෝ නොහැකි, ශ්‍රී ලංකාවේ හෝ අන්තැනක පිහිටි යම් වත්කමක් සහ නීත්‍යානුකූල ලේඛන හෝ ඒ වත්කම්වලට සාක්ෂි වශයෙන් වූ හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ කවර වූ හෝ යම් ආකෘතියක සාධන පත් ඇතුළත් වේ. එහෙත්, ඒවා බැංකු බැර, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, ඇප, බැඳුම්කර, අණකර, ණයවර ලිපිවලට සීමා නොවන අතර එවැනි යම් දේපළක යම් නීත්‍යානුකූල හා සාධාරණ පොලියක් ද එයට ඇතුළත් වේ;

''වාර්තාව'' යන්නෙන්, දත්ත සටහන් කරනු ලැබ ඇත්තා වූ හෝ ලකුණු කරනු ලැබ ඇත්තා වූ සහ යම් තැනැත්තකු විසින්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් උපක්‍රමයක් මගින් කියවීමේ හා තේරුම් ගැනීමේ හැකියාව ඇත්තා වූ ද යම් උපකරණයක් අදහස් වේ;

''සැක කටයුතු ගනුදෙනු වාර්තාව'' යන්නෙන්, 6 වන වගන්තිය යටතේ කිරීමට නියමිත වාර්තාවක් අදහස් වේ;

''නිශ්චිත අස්ථිත්වය'' යන්නෙන්-

(අ) ශ්‍රී ලංකාව තුළ ත්‍රස්තවාදයට අදාළව තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් ප්‍රකාර වරදක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවකට සම්බන්ධ යම් ක්‍රියාවක් දැන දැනම-

(i) කළා වූ;

(ii) කිරීමට තැත්කළා වූ;

(iii) කිරීමේ දී සහභාගි වූ හෝ

(iv) කිරීමට පහසුකම් සැලසුවා වූ

අස්ථිත්වයක්, හෝ

(ආ) 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත යටතේ සාදන ලද නියෝග ප්‍රකාර, විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නියම කරන ලද අස්ථිත්වයක් අදහස් වේ;

''ත්‍රස්තවාදී ක්‍රියාව'' යන්නෙන් ශ්‍රී ලංකාව තුළ ත්‍රස්තවාදයට අදාළව තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් ප්‍රකාර වරදක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් අදහස් වේ;

''ත්‍රස්තවාදී දේපළ'' යන්නෙන්-

(අ) ත්‍රස්තවාදී ක්‍රියාවක් කිරීමෙන් ලත් මුදල්;

(ආ) ත්‍රස්තවාදී ක්‍රියාවක් කිරීමට යොදාගනු ලැබූ, යොදාගනු ලබන්නා වූ හෝ යොදාගත හැකි දේපළ;

(ඇ) ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් යොදා ගනු ලැබූ, යොදාගනු ලබන්නා වූ හෝ යොදාගත හැකි දේපළක්;

(ඈ) ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් හෝ ඒ වෙනුවෙන් අයත් කරගෙන ඇත්තා වූ හෝ පාලනය කරනු ලබන්නා වූ දේපළක්; හෝ

(ඉ) ත්‍රස්තවාදී කණ්ඩායමකට සහාය දීමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවකට අරමුදල් සැපයීමේ කාර්යය සඳහා එකතු කරන ලද දේපළක්

අදහස් වේ;

''ගනුදෙනුව'' යන්නෙන්, මුදල් ව්‍යාපාරය හෝ නම් කරන ලද මුදල් නොවන ව්‍යාපාරයකට සම්බන්ධ යම් කටයුත්තක් අදහස් වේ;

''දේපළකට'' අදාළවන විට

''ගනුදෙනුවකට''-

(අ) මිලට ගැනීමක්, විකිණීමක්, ණයක්, අයකිරීමක්, උකසක්, කැප අයිතියක්, ඔඩපනයක්, මාරුකිරීමක්, භාරදීමක්, පැවරීමක්, ප්‍රති නිවේදනයක්, සම්ප්‍රේෂණයක්, ත්‍යාගයක්, පරිත්‍යාගයක්, භාරයක්, ඇතිකිරීමක්, නිරවුල් කිරීමක්, යම් භාණ්ඩයක් තැන්පත් කිරීම ද, ඇතුලු තැන්පතුවක්, මුදල් ආපසු ගැනීමක්, වත්කම් අතර මාරුවක්, බැර දිගු කිරීමක්;

(ආ) ඇටෝර්නි බලය පිළිබඳ යම් නියෝජ්‍යත්වයක් හා ප්‍රදානයක්;

(ඇ) කවර ආකෘතියක හෝ කවර ආකාරයක විස්තරයක හෝ ස්වභාවයක, ඒ බව කෙසේ විස්තර කර ඇත්තේ වුව ද, වෙනත් යම් දේපළ බැහැර කිරීමක් හෝ වෙළෙඳාමක්, ඒ දේපල සම්පූර්ණයෙන් හෝ එයින් යම් කොටසක් වර්තමානයේදී හෝ අනාගතයේ දී ප්‍රතිඵල වශයෙන් යම් අයිතියක්; හෝ හිමිකමක් සම්බන්ධතාවක් හෝ වරප්‍රසාදයක්

ලබා දෙන ඒ දේපළ සම්පූර්ණ වශයෙන් හෝ ඉන් යම් කොටසක්, එය පවරා ඇත්තේ හෝ එසේ කළ හැකි වුවද එම දේපළ

ඇතුළත්විය යුතු ය; තව ද

''නීති විරෝධී ක්‍රියාවලිය'' යන්නෙන්-

(අ) (218 වන අධිකාරය වූ) වස වර්ග, අබින් සහ අන්තරායදායක ඖෂධ ආඥාපනත;

(ආ) ත්‍රස්තවාදය වළක්වාලීම හා මැඩපැවැත්වීමට අදාළව තත්කාලයේ බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්;

(ඇ) (26 වන අධිකාරය වූ) අල්ලස් පනත;

(ඈ) (182 වන අධිකාරය වූ) තුවක්කු ආඥාපනත, (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත හෝ 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත;

(ඉ) (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත;

(ඊ) 1988 අංක 30 දරන බැංකු පනතේ 83ඇ වගන්තිය;

(උ) ජාතීන් අතර සංවිධානය කෙරුණු අපරාධයකට අදාළ, තත් කාලයේ බලපවත්නා යම් නීතියක්;

(ඌ) සයිබර් අපරාධවලට අදාළ තත්කාලයේ බලපවත්වන යම් නීතියක්;

(එ) ළමයින්ට එරෙහිවූ වැරදිවලට අදාළ, තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක්;

(ඒ) පුද්ගලයන් යානවාහන වලින් ගෙනයාම හා සම්බන්ධ වැරදිවලට අදාල, තත්කාලයෙහි බලපවත්නා යම් නීතියක්; සහ

(ඔ) මරණයෙන් හෝ අවුරුදු හතක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය හැකි, තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක්,

යටතේ වූ වරදක් සංස්ථාපනය කෙරෙන යම් ක්‍රියාවක් අදහස් වේ.

## 2006 අංක 9 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

1. මේ පනත 2006 අංක 9 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ VII කොටසේ ඇති ශීර්ෂය වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**"VII වන කොටස**

**බැංකු ආයතන වල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ණය**

**මෙහෙයුම් පිළිබඳ අතිරේක නියෝග."**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ VII වන කොටසේ, 99 වන වගන්තියට පෙරාතුවම පහත දැක්වෙන වගන්තිය ඇතුලත් කරනු ලබන අතර එය එකී ප්‍රඥප්තියේ 98ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

''VII කොටස් සඳහා අර්ථ නිරූපනය

98ආ. මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා ''බලපත්‍රලාභී විශේෂිත බැංකුව'' යන්නට 1988 අංක 30 ද දරන බැංකු පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.''

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තියේ ''වාණිජ බැංකු'' යන වචන වෙනුවට ''වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි-

(අ) එහි (අ) ඡේදයේ ''වාණිජ බැංකු'' යන වචන වෙනුවට ''වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු'' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ආ) ඡේදයෙහි අවසානයට ඇති ''නියම කරනු ලැබිය හැකිය'', යන වචන වෙනුවට ''නියම කරනු ලැබිය හැකිය; හෝ'' යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

''(ඇ) වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් ආර්ථිකයේ හඳුනාගත් යම් කොටස්වලට ලබා දෙන ණය ප්‍රමාණයේ අවම ප්‍රතිශතය නියම කළ හැකි ය'', සහ

(ඈ) එහි අතුරු විධානයේ ''යම් වාණිජ බැංකුවකට'' යන වචන වෙනුවට ''යම් වාණිජ බැංකුවකට හෝ යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි ''එක් එක් වාණිජ බැංකුවේ'' යන වචන වෙනුවට ''එක් එක් වාණිජ බැංකුවේ සහ එක් එක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ'' යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 102 වන වගන්තියෙහි ''වාණිජ බැංකුවල ප්‍රාග්ධනය සහ අතිරික්තය'' යන වචන වෙනුවට ''වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රාග්ධනය සහ අතිරික්තය'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 104 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියෙහි (1) උපවගන්තියෙහි (අ) සහ (ආ) ඡේදවල ''වාණිජ බැංකු විසින්'' යන වචන වෙනුවට ''වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ ''වාණිජ බැංකු විසින්'' යන වචන වෙනුවට ''වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්'' යන වචන ආදේශ කිරීමෙන්.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියෙහි ''බැංකු ආයතන විසින්'' සහ ''එම ආයතන විසින්'' යන වචන වෙනුවට පිළිවෙළින්, බැංකු ආයතන සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්, යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2006 අංක 11 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

**මෝටර් වාහන අනුග්‍රාහක බද්දක් සහ ටෙලි නාට්‍ය සහ චිත්‍රපට බද්දක් පැනවීම සඳහා ද; 2002 අංක 11 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත සහ 2004 අංක 11 දරන මුදල් පනත යන පනත් මගින් පනවන ලද ඇතැම් බදු සහ ගාස්තු සංශෝධනය කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

1. මේ පනත 2006 අංක 11 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස

### මෝටර් වාහන අනුග්‍රාහක බද්ද

2. (1) මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට සහ එදිනට පසුව, (මෙහි මින් මතු ''බද්ද'' යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන අනුග්‍රාහක බද්ද යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන බද්දක් පහත සඳහන් තැනැත්තන්ගෙන් පනවා අය කරනු ලැබිය යුතු ය :-

(අ) වාහනයක් ආනයනය කරන ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කරයක, එසේ සෑම ප්‍රාථමික දරන්නකුගෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පොදු ණය අධිකාරීවරයා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන නිර්දේශයක් මත සහ පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව, (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යන පනත් ප්‍රකාරව ඔහු විසින් ගෙවීමට නියමිත යම් බදු මුදලක් වෙනුවට, එම වාහනයේ පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තුවල වටිනාකම මත අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණයට වූ බද්දක් එම වාහනය ආනයනය කරන අවස්ථාවේදී ගෙවන ලෙස ඔහුට නියම කරනු ලැබිය යුතු ය. එම කොන්දේසි නම් :-

(i) ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර සඳහා යොදවා ඇති ආයෝජනවල මුළු එකතුව, ඉහත කී බැඳුම්කර මිලදී ගැනීම සඳහා පිළිගතහැකි බවට අමාත්‍යවරයා විසින් ඉහත කී නියමයෙන් නිශ්චය කරනු ලබන පරිදි වූ ඇමරිකන් ඩොලර් ප්‍රමාණයක් හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලක ඊට සමාන ප්‍රමාණයක් විය යුතු ය;

(ii) මෝටර් වාහනයේ පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තුවල වටිනාකම, ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කරවල වටිනාකමින්, අමාත්‍යවරයා විසින් ඉහත කී නියමය මගින් නිශ්චය කරනු ලබන පරිදි වූ ප්‍රතිශතයක් නොඉක්මවිය යුතු ය;

(ආ) 2000 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂයේ සිට ඊට ඉක්බිතිව ම එළඹුණු තක්සේරු වර්ෂ පහ ඇතුළත එක් එක් වර්ෂය වෙනුවෙන්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව එක් වර්ෂයකට රුපියල් දෙලක්ෂ පනස් දහසට නොඅඩු මුදලක් (රු. 2,50,000) බැගින් දිගටම ගෙවා ඇති සහ, ඒ බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කරනු ලැබුවා වූ වාහනයක් ආනයනය කරනු ලබන සෑම තැනැත්තකුම, එසේ ආනයනය කරන අවස්ථාවේදී (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යන පනත් ප්‍රකාරව එම තැනැත්තා ගෙවීමට යටත් වන යම් බද්දක් හෝ මූල්‍ය ගාස්තුවක් වෙනුවට, එම බදු සහ අයකිරීම්වල මුළු එකතුව මත අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ අනුප්‍රමාණයට බද්දක් ගෙවීමට යටත් විය යුතු ය;

(2) ඉහත (අ) සහ (ආ) ඡේද යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියමයක්ම තම අත්සන එකී නියමය මත තබන ලද දින සිට බලාත්මක විය යුතු ය.

3. අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ පොදු ණය අධිකාරීවරයා විසින් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2 වන වගන්තියේ (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන් සම්බන්ධයෙන් නියමිත සහතික කිරීම කරනු ලැබීමෙන් පසු, ආනයනය කරන අවස්ථාවේ දී එම තැනැත්තා විසින් ගෙවිය යුතු බදු අයකර ගෙන එම බදු මුදල් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය වන්නේ ය.

4. මේ පනතේ මේ කොටස ප්‍රකාරව බද්ද ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාමාන්‍ය හෝ විශේෂ විධාන, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි ය.

5. 2006 මාර්තු මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, එසේ වාහනයක් ආනයනය කරන, 2 වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් යම් තැනැත්තකුගෙන් මේ පනතේ මේ කොටස ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 2 වන වගන්තිය යටතේ වූ නියමයේ නිශ්චිතව සඳහන්කර ඇති ප්‍රමාණයක බද්දක් අය කරනු ලබන අවස්ථාවක දී, එම අයකර ගැනීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස අයකර ගනු ලැබූ ලෙස සහ අයකර ගනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර එම අය කිරීම සම්බන්ධයෙන් සියලු අපරාධ හෝ සිවිල් නඩුවලට එරෙහිව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

## II වන කොටස

## ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ රූපවාහිනී වාණිජ වැඩ සටහන් සඳහා බද්දක් පැනවීම

6. (1) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වානිජ වැඩ සටහන්වල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීමේ සහ පාලනය කිරීමේ අදහසින් සහ එමගින් එම ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩ සටහන් හරහා ශ්‍රී ලාංකීය ගති සිරිත් වර්ධනය කිරීමේ අදහසින් එකී ටෙලි නාට්‍ය, චිත්‍රපට හෝ වාණිජ වැඩ සටහන් වල විකාශන කාලයට අදාල වූ රූපවාහිනී මධ්‍යස්ථානවලට බලපත්‍ර නිකුත් කිරීමේ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව, ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදනු ලැබ හෝ චිත්‍රපට ගත කරනු ලැබ විකාශනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබූ හෝ ආනයනය කරනු ලැබූ සෑම ටෙලි නාට්‍යයක්, චිත්‍රපටියක් හෝ වානිජ වැඩසටහනක් මතම (මෙහි මින් මතු 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩ සටහන් බද්ද නම් වූ බද්දක්, 1982 අංක 6 කරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ හෝ කලින් කල හඳුනාගනු ලබන පරිදි වූ වෙනත් බලපත්‍ර අධිකාරියක් යටතේ හෝ බලපත්‍රදෙනු ලබන සෑම ආයතනයකින්ම පනවා අයකර ගත යුතු ය :

එසේ වුව ද ඉහත සඳහන් බද්ද-

(අ) ශ්‍රී ලංකාවෙහි විකාශනය කරනු ලබන යම් වාර්තා වැඩ සටහනක් සම්බන්ධයෙන්; හෝ

(ආ) (i) අධ්‍යාපනික අගයන් ලබාදීමට අපේක්ෂිත; හෝ

(ii) ළමයින්ට විනෝදය සැපයීමේ කාර්ය සඳහා පමණක් නිෂ්පාදනය කරනු ලැබූ,

යම් චිත්‍රපටයක් හෝ ටෙලි නාට්‍යයක් සම්බන්ධයෙන්; හෝ

(ඇ) මගින් නියමකරනු ලබන පරිදි වූ වෙනත් යම් වර්ගයක ටෙලි නාට්‍ය, චිත්‍රපට හෝ වානිජ වැඩසටහන් සම්බන්ධයෙන්

අයකරනු නොලැබිය යුතු ය.

(2) බද්ද ගෙවීමේ ආකාරය සහ ක්‍රමය, ගෙවීමේ වේලාව සහ එම ගෙවීම් එකතු කිරීමේ කාර්ය පටිපාටිය සහ මෙම බද්දේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය විය හැකි වෙනත් නියම සහ කොන්දේසි තත්කාර්ය සඳහා සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබේ.

(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම එම නියමය මත අමාත්‍යවරයා සිය අත්සන තබා ඇති දිනයේ සිට බලාත්මක විය යුතු ය.

7\. (1) නියෝග මගින් නියමකරනු ලබන ආකාරයට සහ එහි සඳහන් කාලය තුළ ඉහත කී බද්ද ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ගෙවීම පැහැර හරින සෑම තැනැත්තකුම, රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම පවරනු ලැබ ඇති අමාත්‍යාංශයෙන් ලේකම්වරයා වෙත, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති බදු ප්‍රමාණයට අමතරව පහත දැක්වෙන ආකාරයට ගණන් බලනු ලබන අධිභාරයක් ගෙවීමට යටත් වන්නේ ය:-

(අ) බද්ද ගෙවිය යුතු දින සිට ගණනය කරන ලද, එදිනට පසුව වූ එක් මාසයක කාල පරිච්ඡේදයක් හෝ එහි යම් කොටසක් සඳහා අයවිය යුතු, පැහැර හැර ඇති එකී බදු මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක් බැගින්;

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් බද්ද ගෙවිය යුතු දින සිට ගණනය කරන ලද, එදිනට පසුව එළඹෙන එක් එක් මාසය හෝ එහි යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හැර ඇති බදු මුදලින් සියයට දෙක බැගින්.

(3) මාස තුනකට වැඩි කාල පරිච්ඡේදයක් ගෙවීම පැහැර හැර ඇති බද්ද හෝ පැහැර හැර ඇති බද්දේ ඒ කොටස සහ ඒ මත උපචිත වී ඇති අධිභාරය, පහත දැක්වෙන ආකාරයට අයකර ගැනීමට රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ක්‍රියා කළ යුතු ය.

(4) ගෙවීම පැහැර හැර ඇති බද්ද සහ ඒ මත උපචිත වී ඇති අධිභාරය අයකර ගැනීම සඳහා යම් පියවරක් ගැනීමට සති තුනකට පෙරාතුව මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගෙවීම පැහැර හැර ඇති බද්ද සහ ඒ මත උපචිත වූ අධිභාරය අයකර ගැනීම සඳහා නඩු පැවරීමට අදහස් කරන බව දැනුම් දෙමින් රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා වෙත දැන්වීමක් නිකුත් කිරීම සඳහා සැලැස්විය යුතු ය.

(5) රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට බලය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් (4) වන උපවගන්තිය ප්‍රකාරව පැහැර හැර ඇති තැනැත්තා වෙත දැන්වීමක් නිකුත් කරනු ලැබ, ඒ දැන්වීමේ සඳහන් සති තුනක කාල පරිච්ඡේදය ඉකුත් වී ඇති නමුත්, පැහැර හැර ඇති මුදල සහ ඒ මත සංචිත වී ඇති භාරය නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ හෝ ව්‍යාපාරය කරගෙන යන්නා වූ හෝ කොට්ඨාශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත පැහැර හරින්නාගේ නම සහ ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් සහතිකයක් මේ වගන්තිය මගින් නියමිත ගෙවීම් කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර හැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමග රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට බලය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කළ යුතු ය. ගෙවීම පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාගේද, සෑම අධ්‍යක්ෂවරයකුගේ ම සහ ප්‍රධාන නිලධරයාගේ ද නම් සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) (5) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුන විට, නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් දිනයක තමා ඉදිරියේ පෙනී සිට පැහැර හරින ලද, බද්ද හෝ බද්දේ කොටස සහ ඒ මත උපචිත වූ අධිභාරය ද අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීමට හේතුව පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව පැහැර හරින ලද බද්ද සහ ඒ මත උපචිත වූ අධිභාරය ද මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා පැහැර හරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලබන මුදල් රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම භාරව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ප්‍රේෂණය කරමින් එකී මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

8. (1) මේ පනත යටතේ නියම කරනු ලැබිය යුතු බවට නියමිත කාරණා, සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ සැදීම සඳහා නියම කර ඇති හෝ බලය දී ඇති නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එම නියෝගය, එසේ පළ කරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝග යක් ම එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

9. මේ කොටසේ කාර්ය සඳහා-

"චිත්‍රපටිය" යන්නෙන්, අයිතිකරුවන් විසින් සිනමාශාලාවක තිරයක් මත ප්‍රදර්ශනය කිරීම සඳහා මූලිකව අදහස් කරන ලද්දා වූ ද, කවර හෝ හැඩයක් හෝ ආකෘතියක් මත ප්‍රක්ෂේපණය කරනු ලබන්නාවූ ද, චලනය වන්නාවූ ප්‍රතිබිම්බයක ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීමක් අදහස් වේ.

"ටෙලි නාට්‍ය" යන්නෙන්, රූපවාහිනී නාලිකා හරහා විසුරාවා හරිනු ලබන නාට්‍යයක් අදහස් වේ.

## III වන කොටස

## 2005 අංක 5 දරන මුදල් පනත සංශෝධනය කිරීම

10. (මේ කොටසෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 5 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) සියළු බදු අයකිරීම් මත, සියයට 0.25 අනුප්‍රමාණයට 2005 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සිට, යන වචන වෙනුවෙට, පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"සියලු බදු අයකිරීම් මත-

(අ) සියයට 0.25 අනුප්‍රමාණයකට 2005 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භ වී 2005 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ද;

(ආ) සියයට 1ක අනුප්‍රමාණයකට 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාවේ සිට ඉන්පසු",

(2) වන වගන්තියේ අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"එසේම තව දුරටත්" මේ පනතේ මේ කොටසේ නියමයන් ප්‍රකාර, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ, ආදායම් බද්ද මත අයවිය යුතු සමාජ වගකීම් බද්ද-

(අ) 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, 2006 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා සියයට 0.25 ක අනුප්‍රමාණයට ගණනය කොට අයකල යුතු ය;

(ආ) 2006 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන කාලසීමාව සඳහා සියයට 1 ක අනුප්‍රමාණයට ගණනය කොට අයකල යුතු ය.

11. මේ පනතේ මේ කොටසේ විධිවිධාන 2006 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

12. 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයෙන් අවසන්වන කාලය ඇතුළත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ප්‍රඥප්ති පරිපාලනය කිරීමේ අදාළ අධිකාරිය විසින් මේ පනතේ මේ කොටස ප්‍රකාරව සමාජ වගකීම් බදු වශයෙන් අයකරගනු ලබන යම් මුදලක් අය කර ගනු ලැබ ඇති අවස්ථාවක දී, එම මුදල අයකර ගැනීම වලංගු ලෙස අය කර ගනු ලැබ ඇති ලෙස සහ වලංගු ලෙස අය කර ගනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර එසේ අයකර ගන්නා අදාළ බලධාරීන් ඉහත කී බද්ද අයකිරීම් සම්බන්ධයෙන්, සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

## IV වන කොටස

## 2003 අංක 25 දරන මුදල් පනත සංශෝධනය කිරීම

13. 2004 අංක 11 දරන පනත මගින් සංශෝධිත 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටසේ (සංචාරක සංවර්ධන බද්ද) 11 වන වගන්තියේ අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''එසේ වුවද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති සාමාන්‍ය අලෙවි නියෝජිතයන් ඇතුළු සංචාරක නියෝජිතයන්ට ගුවන් ටිකට්පත් විකිණීම මත ලැබෙන කොමිස් මුදලින් එම බදු ද අයකරනු නොලැබිය යුතු ය''.

## V වන කොටස

## 2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම

14. 2005 අංක 5 දරන පනතින් අවසන් වරට සංශෝධිත 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ (වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද) 2 වන වගන්තිය පහත දැක්වෙන ලෙස තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි පළමුවන අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''එසේ වුව ද, ඉහත සඳහන් යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණ වටිනාකම සහ නැව් බඩු වටිනාකම සම්බන්ධයෙන් :-

(අ) 2004 නොවැම්බර් 19 වන දිනයෙන් ආරම්භව 2005 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා සියයට 1.5 ක අනුප්‍රමාණයක් මත බද්දක් පනවා අය කළ යුතු ය; සහ

(ආ) 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාල සීමාව සඳහා සියයට 2.5 ක අනුප්‍රමාණයක් මත බද්දක් පනවා අයකළ යුතු ය;

(2) එහි දෙවන අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:

''එසේම තවදුරටත්, 2006 ජනවාරි මස 01 වන දින සිට බලපවත්වන පරිදි, පිරි සැකසුම් කොට නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා හෝ අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා හෝ භාවිත කිරීම පිණිස ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් කිසිදු බද්දක් අය කරනු නොලැබිය යුතු ය.;''

15. මේ කොටසේ විධිවිධාන 2006 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

16. 2006 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයෙන් අවසන් වන කාලය තුළ, 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ සඳහන් යම් භාණ්ඩයක් ආනයනය කළ යම් තැනැත්තකුගෙන් මේ පනතේ මේ කොටස ප්‍රකාරව වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද වශයෙන් යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණ ගාස්තුව සහ නැව් ගාස්තුවෙන් සියයට 2.5 කට සමාන මුදලක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කර ගනු ලැබූ අවස්ථාවක දී, එම අය කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කරනු ලැබ ඇති ලෙස සහ කරනු ලබන බවට සලකනු ලැබිය යුතු අතර එසේ එකතු කර ගැනීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්.ඩී. - ඕ.14/2006

1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 30 දරන බැංකු පනතේ 19 වගන්තිය, එහි (3) (අ) උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පතු වගකීම් හෝ ආපනික වගකීම් ඇතුළු මුළු වගකීම් හෝ මුළු වත්කම් හෝ යම් නිශ්චිත වත්කම් වර්ගයක්; නැතහොත්

(ii) බැංකු ක්‍රමයේ ශක්තිමත් භාවය සහ ස්ථාවර භාවය සහ ජාතික ආර්ථිකයේ යහපත,

සැළකිල්ලට ගෙන මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ප්‍රමාණය වශයෙන් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණයන් මුදල් මණ්ඩලය විසින් කලින් කළ වෙනස් කරනු ලැබිය හැකිය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ (ඇ) වාක්‍යාංශය වෙනුවට පහත දැක්වෙන අලුත් වාක්‍යාංශය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඈ)අවස්ථාවෝචිත පරිදි පුද්ගලයකු හෝ සමාගමක්, කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් හෝ ප්‍රතිලාභ වශයෙන් යම් එක් එක් සමාගම්වල සැහෙන සම්බන්ධතාවයක් හෝ වැදගත් කළමණාකරන සම්බන්ධතාවයක් දරන්නේ ද, එවැනි සමාගම් විසින්,";

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 උ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය පවත්වාගෙන යා යුතු බව.

76 උ.(1) (3) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ම, රුපියල් මිලියන පනහකට නොඅඩු හෝ මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව, බැංකු ක්‍රමයේ ශක්තිමත් භාවය සහ ස්ථාවර භාවයත්; ජාතික ආර්ථිකයේ යහපතත් සැලකිල්ලට ගෙන කලින් කළ නිශ්චය කරනු ලැබිය හැකි යම් වෙනත් ප්‍රමාණයක හෝ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයක් සෑම කල්හි ම පවත්වාගෙන යා යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා ,කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය, යන්නට 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

(3) (අ) (i) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තැන්පතු වගකීම් හෝ ආපනික වගකීම් ඇතුළු මුළු වගකීම් හෝ මුළු වත්කම් හෝ යම් නිශ්චිත වත්කම් වර්ගයක්; නැතහොත්

(ii) බැංකු ක්‍රමයේ ශක්තිමත්භාවය සහ ස්ථාවරභාවය සහ ජාතික ආර්ථිකයේ යහපත,

සැලකිල්ලට ගෙන මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වශයෙන් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ප්‍රමාණය වශයෙන් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණයන් මුදල් මණ්ඩලය විසින් කලින් කළ වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) අවම නියමිත කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වගකීම්වලට හා වත්කම්වලට අදාළ වන සේ නියම කරනු ලබන කල්හි, එය ගණන් බැලීමේ කාර්ය සඳහා ප්‍රාග්ධනය සහ වගකීම් යන දෙකම හෝ වත්කම්, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන, මුදල් මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරන පරිදි වූ වර්ගයක සහ ගණන් බැලීමේ ආකාරයක විය යුතුය;

(ඇ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් සිදු කරන ලද යම් වෙනසක් පිළිබඳව මුදල් මණ්ඩලය විසින් ලිඛිතව සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට දැනුම් දිය යුතු ය;

(ඈ) එම වෙනස් කිරීම මගින් ස්වකීය කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කිරීමට යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට නියම කරනු ලබන අවස්ථාවක එම බැංකුව විසින් මුදල් මණ්ඩලය වෙත කරනු ලබන ඉල්ලීමක් මත ඉහත කී නියමයට අනුකූලව ක්‍රියා කිරීම සඳහා මාස දොළහක කාලයක් හෝ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලබන වඩා දීර්ඝ කාලයක් ලබා දිය යුතු ය.

(4) යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් වන විට එම බැංකුවේ ප්‍රාග්ධනයේ විදේශීය සහභාගීත්වයේ සීමාව කිසිදු අවස්ථාවක දී මුදල් මණ්ඩලය විසින් කලින් කල ස්ථාපනය කරනු ලබන සීමාව නොඉක්මවිය යුතු ය.

(5) මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිය බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් එහි කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය අඩු නොකළ යුතු ය.

(6) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් එහි යම් නොගෙවූ ප්‍රාග්ධනය මත යම් අයභාරයක් ඇති නොකළ යුතු අතර, මේ විධිවිධාන කඩ කරමින් ඇති කරන ලද යම් අයභාරයක් ශුන්‍ය සහ බල රහිත වේ.

(7) (අ) සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්ම සෑම කල්හිම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් පවත්වාගෙන යා යුතු අතර එසේ පවත්වාගෙන යා යුතු අනුපාතය තීරණය කිරීමේ දී මුදල් මණ්ඩලය විසින් ප්‍රායෝගිකව සිදු කල හැකිතාක් දුරට බාසල් හි 'බැන්ක් ෆො ඉන්ටර් නැෂනල් වෙටල්මන්ට්ස්' බැංකුව විසින් දක්වා ඇති ප්‍රාග්ධන ප්‍රමාණවත් බව සඳහා වූ නියමු උපදෙස් පිළිපැදිය යුතු ය;

(ආ) (අ) ඡේදයේ සඳහන් ප්‍රාග්ධන ප්‍රමාණවක් අනුපාතයෙහි යම් වෙනස්කමක් පිළිබඳව මුදල් මණ්ඩලය විසින් සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙතම ලිඛිතව දැනුම් දිය යුතු ය;

එසේ වුවද, එම වෙනස් කිරීම මගින් ස්වකීය ප්‍රාග්ධනය වැඩි කිරීමට නියමව ඇති සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවකටම එම නියමයට අනුකූලවීම සඳහා මාස 12 කාලයක් හෝ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලබන වඩා දීර්ඝ කාලයක් ලබා දිය යුතු ය.

(8) ඉහතින් වූ උපවගන්තිවල විධිවිධාන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධන අරමුදල් අඩු වී ඇති අවස්ථාවක ඒ අඩුවීම නිවැරදි කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් සාධාරණ කාලසීමාවක් ලබා දිය යුතු ය.''

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වගන්තියේ අන්තර්ගත කිසිවක් 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවකට අදාළ වන බවට තේරුම් නොගත යුතු ය.

එසේ වුවද, ප්‍රදේශීය සංවර්ධන බැංකුවට අදාළව ප්‍රාග්ධන අවශ්‍යතාවල අදාළ සීමාවන් මුදල් මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරනු ලැබිය හැකි ය.

6. 2005 අංක 2 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඒ වගන්තිය, එහි (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 'ට' ඡේදයේ (II) (ආ) (ඌඌ) උපඡේදය ඉවත් කිරීමෙන්;

(1) එහි 'ට' ඡේදයේ (II) වන උපඡේදයේ, (ආ) වාක්‍යාංශයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''(ඇ) අවස්ථාවෝචිත පරිදි පුද්ගලයකු හෝ සමාගමක් කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් හෝ ප්‍රතිලාභ වශයෙන් හෝ යම් එක් එක් සමාගම්වල සැහෙන සම්බන්ධතාවයක් හෝ වැදගත් කළමණාකරන සම්බන්ධතාවයක් දරන්නේ ද, එවැනි සමාගම්:''.

7. මේ පනත ක්‍රියාත්මක වීමට පෙර කවර හෝ අවස්ථාවක දී ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය හෝ 76උ වන වගන්තිය යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නිශ්චයක් කිරීමක්, තීරණයක් හෝ විධානයක්, පිළිවෙලින් මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය හෝ 76උ වගන්තිය ප්‍රකාරව වලංගු ලෙස සාදනු ලැබ හෝ නිකුත් කරනු ලැබූලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, එම නිශ්චය කිරීම, තීරණය හෝ විධානය යටතේ ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයක් ඒ අනුව වලංගු ලෙස සළකනු ලැබිය යුතු ය.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 29 වන දින]

**ජාතික රක්ෂණ භාර අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

**රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් මුහුණ දෙන සෞඛ්‍ය, පෞද්ගලික හදිසි අනතුරු සහ දේපළ හානි පිළිබඳව වූ අනපේක්ෂිත අවදානම් වෙනුවෙන්, වෙනත් දේ අතර, වාණිජ්‍ය රක්ෂණ සංවිධාන විසින් මෙහෙයවනු ලබන දායක රක්ෂණ යෝජනා ක්‍රම සහ තත් කාර්ය සඳහා සංස්ථාපිත වෙනත් අරමුදල් මගින් ආණ්ඩුව විසින් ප්‍රතිලාභ සහ ආරක්ෂණ සපයා ඇති හෙයින් ද:**

**සමාජයේ වඩා වැඩි අවදානම්වලට මුහුණ පාන්නා වූ සමෘද්ධි සහනලාභීන්, ගොවීන්, ධීවර කාර්මිකයන් හා ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් ඇතුළුව වෙනත් කණ්ඩායම්වලට අයත් තැනැත්තන්ගේ ප්‍රතිලාභය සඳහා ආණ්ඩුව විසින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රම සහ රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන හෙයින් ද:**

**එම රක්ෂණ හා වෙනත් ප්‍රතිලාභදායි යෝජනා ක්‍රම සුසංවිහිත කිරීම ආණ්ඩුවේ අභිලාෂය වන හෙයින් සහ ඒ අරමුණ පෙරදැරිව, මේ පනතට අනුව, ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් සහිත සියලු තැනැත්තන් සඳහා උපරිම ප්‍රතිලාභ ලැබෙන බවට සහතික වන අතරම ඉහත සඳහන් පහසුකම් වඩාත් ඵලදායි හා සමායෝජනීය අයුරින් සැපයිය හැකිවනු පිණිස ජාතික රක්ෂණ භාර අරමුදලක් පිහිටුවීමට ආණ්ඩුව අපේක්ෂා කරන හෙයින් ද :**

1. මේ පනත 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ පනතේ විධිවිධාන-

(අ) රජයේ නිලධරයන්;

(ආ) රජයේ සේවයෙන් විශ්‍රාම ලැබ ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන්;

(ඇ) පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්;

(ඈ) පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබ පළාත් සභාවෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන්;

(ඉ) පළාත් පාලන සේවයේ සාමාජිකයන්;

(ඊ) පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ලැබ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන්;

(උ) 1995 අංක 30 දරන සමෘද්ධි අධිකාරි පනත යටතේ ප්‍රතිලාභ ලබන තැනැත්තන්;

(ඌ) ගොවීන්, ධීවරයන් සහ ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන්;

(එ) මෙහි අන්තර්ගත සීමාකිරීම්වලට යටත්ව, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කලින්කල හඳුන්වා ගනු ලැබිය හැකි, අවශ්‍යතාවයක් ඇති තැනැත්තන් හෝ කණ්ඩායම්; සහ

(ඒ) අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් හඳුනාගනු ලැබිය හැකි ආණ්ඩුවේ යම් දෙපලක්,

සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

## I වන කොටස

## ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවීම

3. (මෙහි මින් මතු, "අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රක්ෂණ භාර අරමුදලක් පිහිටුවනු ලබන අතර, මේ පනත අදාළ වන තැනැත්තන්ට එම අරමුදලින් ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ ය. පනතේ 18 වන වගන්තියෙන් නිශ්චය කොට දැක්වෙන මුදල් එම අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

4. (1) පනතේ 6 වන වගන්තිය නිශ්චිතව සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින්මතු, "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයක් පිහිටුවනු ලබන්නේ ය.

(2) මණ්ඩලය (1) වන උප වගන්තිය මගින් ඊට පවරා දෙන ලද නාමයෙන්, අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරීම ද මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය. තව ද, නීතිය අනුව ඉටු කරනු ලැබිය හැකි කටයුතු ඉටු කිරීම ද මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

5. (1) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ සභාපතිවරයා සහ මණ්ඩලයේ තවත් එක් සාමාජිකයෙකු ඉදිරිපිටදී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින්ම එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය :

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මණ්ඩලයේ මුද්‍රාව තබන අවස්ථාවේදී පැමිණ සිටීමට සභාපතිවරයාට නොහැකි වන අවස්ථාවක, මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව, එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් බලය පවරන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට බලය ඇත්තේ ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර හෝ ලේඛන රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

6. (1) මණ්ඩලය, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:-

(අ) මුදල් විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්;

(ආ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා;

(ඇ) සෞඛ්‍ය විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්;

(ඈ) රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්;

(ඉ) මූල්‍ය, බැංකු, රක්ෂණ කළමණාකරණය හෝ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ සුදුසුකම් හෝ විශේෂඥ දැනීමක් සහිත තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙක්.

(2) මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

7. (1) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කළහොත් මිස මණ්ඩලයේ සෑම නම් කළ සාමාජිකයෙකු ම අවුරුදු පහක කාල සීමාවක් ධුරය දරන්නේ ය.

(2) මණ්ඩලයේ නම් කරන ලැබූ සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා වෙත යවන ලිඛිත සංදේශනයක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් යම් නම් කළ සාමාජිකයෙකු වෙත යවන ලිඛිත සංදේශනයක් මගින් ඒ සාමාජිකයා හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උප වගන්තිය යටතේ සංදේශනයක් එවනු ලැබුයේ යම් සාමාජිකයකු වෙත ද ඒ සාමාජිකයා ඒ සංදේශනයේ නිශ්චිතව නියම කරනු ලැබිය හැකි දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ධුරය දැරීම අවසන් කළ යුතු ය.

(5) ධුරයෙන් ඉවත් කරනු ලැබූ නම් කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට හෝ වෙනත් යම් තරාතිරමකින් මණ්ඩලයේ සේවය කිරීමට හෝ සුදුසු නොවිය යුතු ය.

(6) මණ්ඩලයේ යම් නම් කළ සාමාජිකයකු ධුරය දැරීම නතර වූ විට ඒ පුරප්පාඩුව සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා අනුප්‍රාප්ත වන්නේ නම් යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාල සීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(7) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට යම් සාමාජිකයෙකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

8. යම් තැනැත්තෙක්-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත්වූවකු ලෙස ප්‍රකාශිතව නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත්වූවකු හෝ බංකොලොත්වූවකු වන තැනැත්තෙක් නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටී නම් හෝ යටත්ව සිටියේ නම්,

ඒ තැනැත්තා සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ එලෙස තවදුරටත් කටයුතු කිරීම සඳහා හෝ සුදුස්සෙක් නොවිය යුතුය.

9. මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතුය.

10. මුදල් විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, එසේ තීරණය කරනු ලබන සේවා නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ඔවුන්ගේ කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

11. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සහ එම රැස්වීම්වල දී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරගනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් තුන්දෙනෙකු සිටිය යුතු ය.

12. (අ) මණ්ඩලයේ අරමුණු වන්නේ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, අනපේක්ෂිත සෞඛ්‍ය අවදානම, පෞද්ගලික හදිසි අනතුරු හා දේපළ හානි සම්බන්ධයෙන් -

(i) රාජ්‍ය නිලධරයන්, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්, පළාත් පාලන සේවයේ නිලධරයන් සහ රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් සහ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ලැබ අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් හෝ පලාත් පාලන සේවයෙන් දැනට විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන් සඳහා;

(ii) 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි පනතට අනුකූලව සමෘද්ධි ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පවුල් සඳහා;

(iii) ගොවීන්, ධීවරයන් සහ ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් සඳහා;

(iv) මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කල හඳුනාගනු ලැබිය හැකි අවශ්‍යතාවයන් ඇති තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම් සඳහා,

ප්‍රතිලාභ සහ ආරක්ෂණ සැපයීමය. විවිධ ප්‍රභේදවල ප්‍රතිලාභීන් සඳහා විවිධ යෝජනා ක්‍රම අදාළ වේ. විවිධ යෝජනා ක්‍රමවලට අදාළ කාරණා නියම කර දක්වනු ලැබේ.

(ආ) උසස් සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහාම වෙන් වූ වාට්ටු ඉදිකිරීම හෝ එවැනි පහසුකම් සපයන පවත්නා යම් වාට්ටුවල තත්ත්වය උසස් කිරීම මූලික අරමුණ ඇති යම් සංස්ථාගත සමාගමක ස්කන්ධ හා කොටස් අයිතිවාසිකම් අත්කර ගැනීම මගින්, කොටස් අත්පත් කර ගැනීමෙහි අර්ථලාභී දායකත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) මේ පනත යටතේ ප්‍රතිලාභ හා ආරක්ෂණ සඳහා හිමිකම ඇති තැනැත්තන්ගේ ණය මුදල් සඳහා ඇපවීම;

(ඈ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් කලින් කල හඳුනාගනු ලැබිය හැකි ආණ්ඩුවේ යම් දේපළක් හෝ යම් ප්‍රභේදයක හෝ පන්තියක දේපළක් වෙනුවෙන් ඇප සැපයීම; සහ

(ඉ) ඉහත අරමුණු මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය හෝ උපකාරී වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීමත් ය.

13. මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ දී, මණ්ඩලය විසින් -

(අ) ආණ්ඩුව, රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් සහ රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයන්, සමෘද්ධි ප්‍රතිලාභීන්, ගොවීන්, ධීවරයන් සහ ස්වයං රැකියාලාභීන් සහ වෙනත් අවශ්‍යතාවයන් ඇති තැනැත්තන් හෝ තැනැත්තන්ගේ කණ්ඩායම් විසින් ගෙවනු ලබන සියලු මුදල් ද අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන යම් ආදායමක් ද අයකර ලබා ගත යුතු අතර එම මුදල් අරමුදලට බැර කිරීමට කටයුතු සැලැස්විය යුතු ය;

(ආ) අරමුදලේ මුදල්වල භාරකාරත්වය දැරිය යුතු ය;

(ඇ) මේ පනත යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති තැනැත්තන්ට නියමිත යම් යෝජනා ක්‍රමයක් ප්‍රකාර අයවීමට ඇති එවැනි මුදල් ගෙවනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනතේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලේ මුදල්, ආණ්ඩුවේ බැඳුම්කරවල හෝ රජයේ සුරැකුම්පත්වල හෝ මෙය ප්‍රකාරව අපේක්ෂිත පහසුකම් සැලසීම සඳහා වූ වාට්ටු ඉදිකිරීම හෝ තත්ත්වයෙන් උසස් කිරීම සඳහා මූලික වශයෙන් සංස්ථාගත කරන ලද යම් සමාගමක කොටස් සඳහා ආයෝජනය කරනු ලැබිය හැකි ය;

(ඉ) අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර අරමුදලේ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙන් වශයෙන් වූ පුද්ගල ගිණුම් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 වන දින අරමුදලට අදාළ ගිණුම් පොත් තුලනය කිරීමට කටයුතු සැලැස්විය යුතු ය;

(උ) සෑම මුදල් වර්ෂයක් සඳහා ම අරමුදල සම්බන්ධයෙන් ලැබීම් සහ ගෙවීම් පෙන්වන ප්‍රකාශයක්, ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශයක්, වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක්, එක් එක් ආයෝජනයේ බැලූ බැල්මට පෙනෙන වටිනාකම, මිලදී ගත් මිල හා වෙළෙඳපොළ අගය පෙන්නුම් කරන ආයෝජන ප්‍රකාශයක් ද සකස් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය;

(ඌ) යම් වර්ෂයක් සම්බන්ධයෙන් එක් එක් වර්ෂය සම්බන්ධයෙන් (උ) ඡේදය යටතේ පිළියෙල කරන ලද එක් එක් ප්‍රකාශයේ පිටපතක් පසුව එළඹෙන වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දිනට පෙර අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය;

(එ) එක් එක් වර්ෂය සම්බන්ධයෙන් අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී එම වර්ෂයේ දී මණ්ඩලය විසින් දරන ලද වියදම් අඩු කර ගත යුතුය;

(ඒ) ඉහත දෑ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ ද මේ පනතට අනුකූල නොවන්නා වූ ද අරමුදල සම්බන්ධයෙන් වූ වෙනත් බලතල හා කාර්ය තිබිය යුතු ය.

14. (i) රාජ්‍ය නිලධරයකු, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකු සහ පළාත් පාලන සේවයේ නිලධරයකු වූ ද; සහ

(ii) අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවකින් හෝ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තකු වූ ද; සහ

(iii) සමෘධි යෝජනා ක්‍රමයක්, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ හෝ ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයකු හෝ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු වූ ද,

මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇත්තා වූ ද සෑම තැනැත්තකුම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක දායක මුදලක්, එසේ නියම කරනු ලබන යම් වේලාවන්හි දී අරමුදලට ගෙවිය යුතු ය.

15. අරමුදලෙහි ඇති යම් මුදල්, මේ පනතේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් -

(අ) ප්‍රධාන වශයෙන් මේ පනතින් අපේක්ෂිත පහසුකම් සැපයීම සඳහා වෙන් වූ වාට්ටු ඉදිකිරීම හෝ තත්ත්වයෙන් උසස් කිරීම පිණිස සංස්ථාගත කළ යම් සමාගමක කොටස්වල ආයෝජනය කිරීමෙන්; හෝ

(ආ) මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ආණ්ඩුවේ බැඳුම්කර හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමෙන්,

උපයෝජනය කරනු ලැබිය හැකි ය.

16. (1) මණ්ඩලයේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් එක් එක් වර්ෂයේ දී විගණනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද මණ්ඩලයේ ගිණුම් විගණනය සඳහා අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ විගණකාධිපතිවරයා විමසා සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් පත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් එවැනි පත් කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, මණ්ඩලයට අදාළව විගණකාධිපතිවරයාගේ කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා එම විගණකවරයාගේ හෝ විගණකවරුන්ගේ සේවය ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව විගණකාධිපතිවරයා විසින් එකී විගණකවරයාට හෝ විගණකවරයන්ට ලියවිල්ලක් මගින් දැනුම් දෙනු ලැබිය හැකි අතර, එසේ දැනුම් දෙනු ලැබූ විට එම විගණකවරයා හෝ විගණකවරයන්, විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (අ) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමේ කාර්යයේ දී තමාට සහාය වීම පිණිස, විගණකාධිපතිවරයා විසින් සුදුසුකම්ලත් යම් විගණකවරයකුගේ හෝ විගණකවරුන්ගේ සේවය යොදාගනු ලැබිය හැකි ය;

(ආ) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමේ දී ඊට අදාළ යම් තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටළුවක් පරීක්ෂා කිරීම පිණිස සහාය ලබාගත යුතු බව විගණකාධිපතිවරයාගේ මතය වේ නම්, ඔහු විසින් -

(i) මණ්ඩලයේ සේවා නියුක්තයකු නොවන තැනැත්තකුගේ සේවය; හෝ

(ii) මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කෙරෙහි කිසිදු සම්බන්ධතාවක් නොමැති ආයතනයක් වන යම් තාක්ෂණික හෝ වෘත්තීය හෝ විද්‍යා ආයතනයක සේවය ලබාගත හැකි අතර, ඒ තැනැත්තා හෝ ආයතනය ඔහුගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(4) (අ) විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමේදී ඔහුට-

(i) මණ්ඩලයේ සියලු පොත්පත්, වාර්තා, වාරවාර්තා සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඒවා ලබා ගැනීමට ;

(ii) මණ්ඩලයේ ගබඩාවලට සහ වෙනත් දේපළවලට ප්‍රවේශය ලබා ගැනීමට; සහ

(iii) මණ්ඩලයේ ගිණුම් විගණනය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු සහ පැහැදිලි කිරීම් මණ්ඩලය විසින් හෝ එහි නිලධරයන් විසින් සපයනු ලැබීමට,

හිමිකම ඇත්තේ ය.

(ආ) මණ්ඩලයේ ගිණුම් විගණනය සඳහා පත් කරනු ලබන සුදුසුකම්ලත් සෑම විගණකවරයකුට හෝ ඒ විගණකවරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට, මණ්ඩලයට අදාළ ඉහත සඳහන් පරිදි වූ ප්‍රවේශය, තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගැනීමට ඒ හා සමාන හිමිකම් තිබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරනු ලැබූ සුදුසුකම් ලත් සෑම විගණකවරයකු ම ඔහුගේ වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය

(6) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තීයේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ,

අදහස් වේ.

(7) විගණකාධිපතිවරයා ඔහුගේ වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

17. මණ්ඩලය විසින් මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පිළියෙල කර ඒ වාර්තාව, විගණකාධිපතිවරයාගේ වාර්තාවද සමග ඒ වාර්තාවට අදාළ වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත් වීමට ප්‍රථම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් ඒ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

18. (1) අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු යඃ-

(අ) (i) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් ආරම්භ වන දොළොස් මාසයක කාලසීමාව ඇතුළත මේ පනතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම පිණිස මණ්ඩලය විසින් දරනු ලබන ප්‍රාග්ධන වියදම් ඇතුළු සියලු වියදම්; සහ

(ii) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කාලසීමාව අවසන් වන දිනයට පසුව එළඹෙන දිනයෙන් ආරම්භ වන මාස විසිහතරක කාලසීමාව ඇතුළත, මේ පනතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම සඳහා මණ්ඩලය විසින් දරනු ලබන සියලු ප්‍රාග්ධන වියදම්, පියවීම සඳහා ඒකාබද්ධ අරමුදලින් ලබාදීමට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණ;

(ආ) 2005 ඔක්තෝබර් 19 වන දින අංක 1538 දරන භාර ඔප්පුව මගින් ඇති කරනු ලැබූ සමෘද්ධි සමාජ සංවර්ධන භාර අරමුදලේ බැරට ඇති සියලු මුදල් ප්‍රමාණ;

(ඇ) 1987 නොවැම්බර් 18 වන දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවන ලද වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී අවස්ථා සඳහා පිහිටුවන ලද අරමුදලේ බැරට මහජන බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ අංක 014-1-001-1-1 194790 දරන ගිණුමේ සහ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 0000001829 දරන ගිණුමේ බැරට ඇති සියලු මුදල් ප්‍රමාණ;

(ඈ) 1997 ජනවාරි මස 31 වන දින හා අංක 5/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් පිහිටුවන ලද අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රජයේ සේවකයන්ගේ වැටුපෙන් දැනට අඩු කරගනු ලැබ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, "ශ්‍රී ලංකා මහ බැංකුවේ අංක 4225 දරන ආණ්ඩුවේ සේවා නියුක්තයන්ගේ රක්ෂණ ගිණුම" නමින් හැඳින්වෙන, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ ගිණුමේ තැන්පත් කරන සියලු මුදල් ප්‍රමාණ;

(ඉ) පනතේ 14 වන වගන්තිය සහ 20 වන වගන්තියට අනුකූලව-

(i) අවස්ථාවෝචිත පරිදි රජයේ නිලධරයකුගෙන්, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකුගෙන් සහ පළාත් පාලන සේවයේ සෑම නිලධරයකුගෙන්ම ලැබෙන දායක මුදල්;

(ii) අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් හෝ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම වැටුපක් ලබන සෑම තැනැත්තකුගෙන් ම ලැබෙන දායක මුදල්;

(iii) සමෘධි යෝජනා ක්‍රමයේ, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයේ සහ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සෑම සාමාජිකයකුගෙන් සහ ස්වයං රැකියාවක නියුක්ත සෑම තැනැත්තකුගෙන්ම ලැබෙන දායක මුදල්;

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවන සෑම මුදල් ප්‍රමාණයකින් ම ආණ්ඩුවෙන් මණ්ඩලයට සපයන ලද ණය මුදලක් සංයුක්ත විය යුතු අතර, අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

19. පහත සඳහන් මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු යː-

(අ) රෝහල්වල වෙන්කළ වාට්ටුවල ප්‍රතිකාර ලබන, මේ පනත යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති තැනැත්තන් වෙනුවෙන් වියදම් පියවීම පිණිස අවශ්‍ය මුදල්;

(ආ) අසාධ්‍ය රෝග සඳහා ප්‍රතිකාර ලබාගත හැකි රෝහලක, මේ පනත යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති තැනැත්තන්ට අසාධ්‍ය රෝග සඳහා ප්‍රතිකාර වෙනුවෙන්, නියම කරනු ලබන යම් අනුප්‍රමාණයන්ට අනුකූලව දරන ලද වියදම්;

(ඇ) මේ පනත යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම තිබෙන තැනැත්තකුගේ රැකියාව හා සම්බන්ධ හදිසි අනතුරක් හේතුවෙන් මරණය සිදු වූ විටක දී, නියම කරනු ලැබිය යුතු යම් ගෙවීම් ප්‍රමාණවලට අනුකූලව වියදම් ගෙවීම් : එසේ වුව ද එම මරණය, විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර සිදු වී තිබිය යුතු යː

එසේම තවදුරටත්, විශ්‍රාම ගැනීමේ දිනට පසුව මරණය සිදු වූ අවස්ථාවක දී යැපෙන්නන්ට කිසිදු ප්‍රතිලාභ ගෙවීමක් නොකළ යුතු ය.

20. පනත අදාළ වන්නා වූ ද මෙම පනතට අනුව ප්‍රතිලාභ ලැබීමට හිමිකම ඇත්තා වූ ද සියලු තැනැත්තන්, මේ පනතට අනුව ඔවුන්ට ලැබීමට හිමිකම් තිබෙන ප්‍රතිලාභ වෙනුවෙන්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයන් මගින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි අරමුදලට බැර කරනු ලැබිය යුතු යම් මුදල් ප්‍රමාණයක මාසික දායක මුදලක් ගෙවිය යුතු ය. එම දායක මුදල, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් හෝ වෙනත් ප්‍රභවයකින් හෝ ලැබීමට හිමිකම තිබෙන වැටුපෙන්, විශ්‍රාම වැටුපෙන්, සමෘද්ධි ප්‍රතිලාභයෙන් හෝ වෙනත් ප්‍රතිලාභයකින් අඩුකර ගනු ලැබිය හැකි ය.

## II වන කොටස

## මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

21. (1) මණ්ඩලයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන නිලධරයන්ට හා සේවකයන්ට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට හා අනුප්‍රමාණ අනුව හා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත්ව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී ඒ තැනැත්තා මණ්ඩලයේ සේවය කරන යම් කාලසීමාවක්, ආණ්ඩුවට සේවය කළ කාලයක් ලෙස එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(7) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, සහ අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනයේ ද කැමැත්ත ඇතිව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල සීමාවකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියමයන් හා කොන්දේසි ඇතුළුව මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ එකී පළාත් පාලන ආයතනය එකඟවන නියමයන් හා කොන්දේසි මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව, තීරණය කරනු ලබන කාලීමාවකට මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියමයන් හා කොන්දේසි ඇතුළුව, මණ්ඩලය සහ එකී රාජ්‍ය සංස්ථාව එකඟවන නියමයන් හා කොන්දේසි මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයට (7) වන උපවගන්තියේ හෝ (8) වන උප වගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ඔහු යටත් විය යුතු ය.

## III වන කොටස

## විවිධ විධිවිධාන

22. මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් විධානයක් මගින්, ඒ විධානයේ නිශ්චිතව සඳහන් දිනයකට පෙර,

(අ) යම් සේවා යෝජකයකුගේ සේවා නියුක්තකයන් සියලුදෙනා හෝ ඔවුන් අතරින් යම් සේවා නියුක්තයකු පිළිබඳව ඒ විධානයේ නිශ්චිතව සඳහන් යම් තොරතුරු ඇතුළත් වාර වාර්තාවක් සපයන ලෙස;

(ආ) ඒ සේවායෝජක විසින් සපයන ලද යම් වාර වාර්තාවක ප්‍රකාශිත යම් විස්තරයක් පිළිබඳව ඒ විධානයේ නිශ්චය කොට දැක්වෙන යම් තොරතුරු හෝ පැහැදිලි කිරීමක් සපයන ලෙස; සහ

(ඇ) ඒ සේවායෝජක විසින් පවත්වා ගෙන යා යුතු යයි මේ පනතින් නියමිත රෙජිස්ටරයක හෝ රෙජිස්ටරයකින් යම් කොටසක සත්‍ය පිටපතක් සපයන ලෙස,

විධාන කළ හැකි ය.

23. මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලක් මගින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් -

(අ) යම් සේවායෝජකයකුගේ ඉපයීම් සම්බන්ධ යම් රෙජිස්ටරයක් හෝ වාර්තා පරීක්ෂා කිරීම සඳහා යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට, දිවා හෝ රාත්‍රී කාලයේ කවර හෝ යුක්ති සහගත වේලාවක දී ඇතුළුවීම හා ඒවා පරීක්ෂා කිරීම;

(ආ) ඒ යම් රෙජිස්ටරයක හෝ වාර්තාවක හෝ එහි කොටසක පිටපත් ලබා ගැනීම;

(ඇ) යම් සේවා නියුක්තකයකුගේ සේවා යෝජකයකු බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම; සහ

(ඈ) යම් අර්ථසාධක අරමුදලක ආයක මුදල් පිළිබඳ වාර්තා හෝ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම,

කරනු ලැබිය හැකි ය.

24. (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින; හෝ

(ආ) මේ පනත යටතේ කරන ලද යම් විධානයක් හෝ නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින; හෝ

(ඇ) මේ පනත යටතේ සැපයීමට නියමිත වාර වාර්තාවක් හෝ තොරතුරු සැපයීමේ දී දැන දැනම යම් අසත්‍ය වාර වාර්තාවක් හෝ තොරතුරක් සපයන හෝ සැපයීමට සලස්වන, සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

25. මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලයක් නම් ඒ පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකුම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එහි සෑම හවුල්කරුවකුම; හෝ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය වෘත්තීය සංගමයක් නම් ඒ වෘත්තීය සංගමයේ සෑම නිලධරයකුම; හෝ

(ඈ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් නම් එහි සභාපති, කළමනාකරු, ලේකම් සහ එම සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ වෙනත් සෑම නිලධරයකුම,

ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය.

එසේ වුවද ඒ වරද සිදු කර ඇත්තේ තමාගේ අනුදැනුමකින් තොරව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත්, ඒ කිසිම තැනැත්තකු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

26. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු පැවරීමක්, මණ්ඩලයේ ලිඛිත අනුමැතිය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

27. මේ පනත යටතට ගැනෙන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව මේ පනත යටතේ කරනු ලැබූ නඩු පැවරීමක්, මේ පනතින් උද්ගත වන යම් කාරණයක් සම්බන්ධව ඒ තැනැත්තාට විරුද්ධව සිවිල් නඩුවක් පැවරීමට බාධකයක් නොවිය යුතු ය.

28. (1) නියම කළ යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝගය සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මෙහි පහත දැක්වෙන සියලු කාරණා සම්බන්ධයෙන් හෝ ඉන් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි යः-

(අ) මේ පනත යටතේ ආයක මුදල් සහ වෙනත් ගෙවීම් අයකර ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා;

(ආ) මේ පනත යටතේ අර්ථලාභීන් වන විවිධ තැනැත්තන්ගේ ප්‍රභේද නිශ්චය කිරීමේ දී පිළිපැදිය යුතු උපමාන නිශ්චය කොට දැක්වීම;

(ඇ) මේ පනත යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති විවිධ ප්‍රභේදවල තැනැත්තන්ට අදාළ යෝජනා ක්‍රම වර්ග සහ මේ පනතට අනුව ප්‍රතිලාභ වශයෙන් ඒ තැනැත්තන්ට ගෙවීම් කළ යුතු විවිධ ගෙවීම් ප්‍රමාණයන් නිශ්චය කොට දැක්වීම ;

(ඈ) අරමුදල පරිපාලනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ආකෘතිපත්‍ර සහ වෙනත් ලේඛන නිශ්චය කොට දැක්වීම;

(ඉ) වැරදීමෙන් අරමුදලට ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණයක් ආපසු ලබා ගන්නා ආකාරය;

(ඊ) මේ පනත යටතේ යම් ප්‍රතිලාභයකට හිමිකම් පාන්නකු වන දරුවකු වෙනුවෙන් හෝ මේ පනත යටතේ තමාට හිමිකම තිබිය හැකි යම් අයිතිවාසිකමක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට තත්කාලීනව නොහැකිව සිටින යම් හිමිකම් පාන්නකු වෙනුවෙන් අන් තැනැත්තකු පත් කළ හැකි ආකාරය ගෙනහැර දැක්වෙන සහ එසේ පත් කරනු ලැබූ තැනැත්තකුට

එකී හිමිකම් පාන්නාට හිමිකම තිබෙන ප්‍රතිලාභ ලබා ගත හැකි සහ ඒ පිළිබඳ කටයුතු කළ හැකි ආකාරය ගෙන හැර දැක්වෙන විධිවිධාන සැලසීම;

(ඩ) මේ පනත යටතේ යම් ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීම පිළිබඳ හිමිකම් පෑමක් සම්බන්ධ තීරණය අභියාචනාධිකරණය විසින් සමාලෝචනය කරන තෙක් හෝ මේ පනත යටතේ යම් අභියාචනයක තීරණයක් ලැබෙන තෙක් යම් ප්‍රතිලාභ ප්‍රදානයක් අත්හිටුවීම පිළිබඳ දැනුම්දීම කළ යුතු ආකාරය;

(ඪ) මේ පනත යටතේ දෙන ලද තීරණයක් යටතේ හෝ යම් නියෝගයක විධිවිධාන ප්‍රකාරව හෝ යම් තැනැත්තකුට මුලින් ගෙවන ලදුව, යම් මුදලක් අවස්ථාගත කරුණු අනුව-

(i) එම මුදල නිසියාකාරයෙන් ගෙවනු ලැබ තිබිය දී, එම මුදල නොගෙවිය යුතුව තිබුණු මුදලක් බව පසුව තීරණය කරනු ලැබ ඇති අවස්ථාවකදී;

(ii) එම මුදල නිසි නොවන යම් ආකාරයකින් ගෙවනු ලැබ ඇති බවට පසුව තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී,

එම තැනැත්තාගෙන් හෝ අරමුදලින් අවස්ථාවෝචිත පරිදි එම මුදල ආපසු අයකර ගැනීම සඳහා මාර්ගෝපදේශ ගෙනහැර දැක්වීම;

(ණ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු දීමනා සහ එම දීමනා ආගණනය කළයුතු ආකාරය නිශ්චය කොට දැක්වීම.

(3) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් (1) වන උප වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ දින පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

29. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

30. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස-

"වෙන්කළ වාට්ටු" යන්නෙන්, මේ පනත යටතේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම ඇති තැනැත්තන්ට සෞඛ්‍ය රැකවරණය සහ සාත්තු සේවා සැපයීමේ කාර්යය සඳහා, විශේෂිත රෝහල්වල හඳුනාගත් හෝ පිහිටුවා තිබෙන වාට්ටු අදහස් වේ;

"ගොවියා" යන්නෙන්, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතට අනුව ප්‍රතිලාභ යෝජනාක්‍රමයට බැඳී සිටින ගොවියකු අදහස් වේ;

"ධීවරයා" යන්නෙන්, ජීවනෝපායක් වශයෙන් මසුන් ඇල්ලීමෙහි යෙදෙන තැනැත්තෙක් අදහස් වේ;

"පළාත් පාලන සේවයේ සාමාජිකයා" යන්නෙන්, 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ සංස්ථාපිත පළාත් පාලන සේවයේ සාමාජිකයකු වන හෝ එම සේවයේ සාමාජිකයකු ලෙස සැලකෙන තැනැත්තෙක් අදහස් වේ;

"පළාත් පාලන සේවයෙන් විශ්‍රාමික" යන්නෙන්, පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ලැබ, එම සේවයෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තෙක් අදහස් වේ;

"පළාත් රාජ්‍ය සේවයේ නිලධරයා" යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව යම් පළාතක පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තැනැත්තෙක් අදහස් වේ;

"පළාත් රාජ්‍ය සේවා විශ්‍රාමික" යන්නෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබ පළාත් සභාවකින් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තෙක් අදහස් වේ;

"රජයේ නිලධරයා" යන්නෙන්, සේවයේ නියුක්තව සිටින්නා වූ ද වයස අවුරුදු හැටට අඩු වූ ද රජයේ නිලධරයකු අදහස් වේ;

"රාජ්‍ය සේවා විශ්‍රාමික" යන්නෙන්, රජයේ සේවයෙන් විශ්‍රාම ලැබ ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබන රජයේ නිලධරයෙක් අදහස් වේ;

"සමෘද්ධි අර්ථලාභී" යන්නෙන්, 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘධි අධිකාරිය පනතට අනුව ප්‍රතිලාභ ලැබීමට හිමිකම තිබෙන තැනැත්තෙක් අදහස් වන අතර, එම අර්ථලාභියාගේ පවුලේ සාමාජිකයන් ද ඊට ඇතුළත් වේ;

"ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තා" යන්නෙන්, තමාම තම ජීවනෝපාය සඳහා ජීවිකා වෘත්තියක යෙදී සිටින තැනැත්තෙක් අදහස් වේ.

# 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 2006 සැප්තැම්බර් මස 12 වන දින]

අනවසර හෝ ව්‍යාජ ගෙවීම් උපක්‍රම සන්තකයෙහි තබා ගැනීම සහ භාවිතය වැළැක්වීම සඳහා ද; අනවසර හෝ ව්‍යාජ ගෙවීම් උපක්‍රම සන්තකයෙහි තබා ගැනීම හෝ ඒවා භාවිතය සම්බන්ධ වැරදි ඇති කිරීම සඳහා ද; යම් තැනැත්තන් විසින් එවැනි ගෙවීම් උපක්‍රම නීත්‍යානුකූලව නිකුත් කිරීම සහ භාවිත කිරීම ආරක්ෂා කිරීම සඳහා ද; වැරදිකරුවන් පිළිබඳව විමර්ශනය කිරීම, නඩු පැවරීම, ඔවුන්ට දඬුවම් දීම සඳහා විධිවිධාන සැළැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැළැස්වීම සඳහා වූ පනතකි.

1. මේ පනත 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නිකුත් කරන ආයතනයක් විසින් නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන සියලුම ගෙවීම් උපක්‍රම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතුය.

3. (1) (අ) එම්බෝස් කිරීමේ සහ දත්ත යෙදීමේ හෝ දත්ත කියවීමේ උපක්‍රම ඇතුළු ගෙවීම් උපක්‍රම සෑදීම හෝ වෙනස් කිරීම සඳහා භාවිත කරනු ලබන උපකරණ නීත්‍යානුකූල බලයක් නොමැතිව තම සන්තකයේ තබාගෙන සිටින හෝ තම පාලනය යටතේ හෝ භාරකාරත්වය යටතේ තබාගෙන සිටින;

(ආ) නීත්‍යානුකූල බලයක් නොමැතව යම් ගෙවීම් උපක්‍රමයක් හෝ කාඩ් පතක් සෑදීම හෝ වෙනස්කම් සිදු කිරීම හෝ ගෙවීම් උපක්‍රම භාරගැනීම හෝ පිරිසැකසුම් කිරීම සඳහා භාවිත කරන යම් උපකරණයක් වෙනස් කරන හෝ ගනුදෙනු කිරිමේ දත්තයන් ග්‍රහණය කිරීම සඳහා චිප්ස් හෝ දත්ත හෝ හඬ වාර්තාගත කිරීමේ උපක්‍රම ඇතුළු බාහිර ද්‍රව්‍ය සවි කරන;

(ඇ) අත්කර ගන්නා ආයතනයේ අලෙවි මධ්‍යස්ථානගත ජාලය හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය හරහා ගමන් කරන බලය පැවරීමේ යන්ත්‍ර දත්තයන් ලබාගැනීමේ කාර්ය සඳහා යම් හඬක් හෝ දත්ත වාර්තාගත කිරිමේ උපක්‍රම ඇතුළු දුරකථන වලට සවත් දීමේ උපක්‍රම හෝ වෙනත් සමාන උපක්‍රම නීත්‍යානුකූල බලයක් නොමැතිව භාවිතා කරන;

(ඈ) නිකුත් කරන ආයතනයේ එහි සැකසුම්කරුවන්ගේ හෝ සේවා නියුක්තයකුව සිටිමින්, හෝ සේවා සපයන්නකුව සිටිමින් ගෙවීම් උපක්‍රම දරන්නාගේ බලය පැවරීමක් හෝ අවසරයක් නොමැතිව අනවසර පුද්ගලයන්ට, කණ්ඩායම්වලට, සම්මේලනවලට කාඩ්පත් හිමියන්ගේ තොරතුරු හෝ සම්පූර්ණ සටහන් පථයේ දත්ත සපයන;

(ඉ) යම් අනවසර හෝ ව්‍යාජ ගෙවීම් උපක්‍රම තම සන්තකයේ තබාගෙන සිටින හෝ තම පාලනය හෝ භාරකාරත්වය යටතේ තබාගෙන සිටින;

(ඊ) ගෙවීම් උපක්‍රමයක් සඳහා වූ වංචනික ඉල්ලීමක් හෝ වෙළෙන්දකු වශයෙන් පත්කරගනු ලැබීම සඳහා වංචා සහගත වෙළෙඳ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන;

(උ) අනවසර හෝ ව්‍යාජ ගෙවීම් උපක්‍රම එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාවිතා කරන, නිෂ්පාදනය කරන හෝ ජාවාරම් කරන;

(ඌ) ගෙවීම් උපක්‍රමයක් නිකුත් කරන තැනැත්තාගේ හෝ එවැනි උපක්‍රමයක් දරන්නකුගේ අවසරය ලබා නොගෙන ගෙවීම් උපක්‍රමයක් හෝ අනවසර ගෙවීම් උපක්‍රමයක් භාවිතා කරන;

(එ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ වරදක් සිදු කිරීම සඳහා ගිණුම් අංක භාවිත කිරිමේ කාර්යය සඳහා ගිණුම් උත්පාදන මෘදුකාංග භාවිත කරමින් වලංගු ගෙවීම් උපක්‍රම ගිණුම් අංක උත්පාදනය කරන;

(ඒ) ගෙවීම් උපක්‍රමය දරන්නාගේ බලය පැවරීමක් හෝ අවසරයක් නොමැතිව දුරකථන මගින්, ෆැක්ස් මගින්, විද්‍යුත් ලිපි මගින්, අන්තර්ජාලය මගින් හෝ වෙනත් සංනිවේදන මාර්ගයක් මගින් හඬ මගින් හෝ තැපැල් සේවය මගින් යම් ගෙවීම් උපක්‍රමයක අන්තර්ගත තොරතුරු, භාණ්ඩ හෝ සේවා ලබාගැනීමේ කාර්යය සඳහා ඉදිරිපත් කරමින් භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා තොරතුරු ලබන තැනැත්තාට එම තොරතුරු පිළිගන්නා ලෙස ඔහු පොළඹවන;

(ඔ) ගෙවීම් උපක්‍රම දරන්නා විසින් නීත්‍යානුකූලව එළඹ ඇති ගනුදෙනු හැර, එම උපක්‍රම දරන්නා විසින් වෙනත් ගනුදෙනු වලට ඇතුළත් වී ඇති බවට පෙනී යන පරිදි ගනුදෙනු වාර්තාවක, විකුණුම් ඉන්වොයිස් පත්‍රයක හෝ සමාන ලේඛනයක බහුවිධ මුද්‍රණ කරන;

(ඕ) යම් ගෙවීම් උපක්‍රමයක් අනවසර හෝ ව්‍යාජ බවට දැන දැනම, භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීම් ක්‍රමයක් වශයෙන් එම අනවසර හෝ ව්‍යාජ ගෙවීම් උපක්‍රමය භාර ගන්නා;

(ක) අනුබද්ධිත වෙළෙන්දකු නොවී ගනුදෙනු වාර්තාවක්, විකුණුම් ඉන්වොයිස් පත්‍රයක් හෝ සමාන ලේඛනයක ඉදිරිපත් කිරීම සඳහා වංක සහයෝගයෙන් කටයුතු කරන අනුබද්ධිත වෙළෙන්දකු හරහා ගනුදෙනු කිරීමේ වාර්තාවක්, විකුණුම් ඉන්වොයිස් පත්‍රයක් හෝ සමාන ලේඛනයක් ගෙවීම් උපක්‍රමය නිකුත් කරන ආයතනයෙන් ලබාගැනීම සඳහා අණකරයක් නිකුත් කරන හෝ අනුබද්ධිත වෙළෙන්දකු ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටිමින් ගනුදෙනු කිරීමේ වාර්තාවක්, විකුණුම් ඉන්වොයිස් පත්‍රයක් හෝ සමාන ලේඛනයක් ගෙවීම් සඳහා ඉදිරිපත් කරන;

(ග) විකුණුම් ඉන්වොයිස් පත්‍රයේ ඇති යම් මුදලක් හෝ වෙනත් තොරතුරු, ගෙවීම් උපක්‍රම දරන්නාගේ බලය පැවරීමක් හෝ අවසරයක් නොමැතිව, වෙනස් කරන හෝ වෙනත් තැනැත්තකු ලවා වෙනස් කරවීමට සලස්වන;

(ච) වංක ලෙස මූල්‍ය වාසියක් ලබාගැනීමේ කාර්ය සඳහා මුදල් ගෙවීමේ ක්‍රමයක් වශයෙන් ගෙවීම් උපක්‍රමයක් හෝ ගෙවීම් උපක්‍රමයක මුද්‍රිත තොරතුරු භාරගන්නා;

(ජ) කිසිදු අනුමතියක් ලබා දී නැති අවස්ථාවක, අනුමත කිරීමේ සාක්ෂියක් වශයෙන් ගෙවීම් උපක්‍රමය නිකුත් කළ ආයතනයෙන් ලබා දී ඇති අනුමත කිරීමේ අංක විකුණුම් ඉන්වොයිස් පත්‍රවල ලියන හෝ ලිවීමට සලස්වන නැතහොත් ඇත්ත වශයෙන් අනුමැතිය ලබා දී ඇති අවස්ථාවක ඕනෑකමින් ම අනුමත අංක වලට වඩා වෙනත් අංක ලියා ඇති;

(ට) ගෙවීම් උපක්‍රමය දරන්නාගේ හෝ එය නිකුත් කළ ආයතනයේ අවසරයක් නොමැතිව, ගෙවීමේ උපක්‍රමය ලියා ඇති, මුද්‍රණය කර ඇති, එම්බෝස් කර ඇති හෝ අන්‍යාකාරයකට සඳහන් කර ඇති ඉන්වොයිස් පත්‍ර, කාබන් කොළ හෝ වෙනත් යම් මාධ්‍යයක් වැනි ද්‍රව්‍යයක් තම සන්තකයේ තබා ගන්නා;

(ඩ) වංචා කිරීමේ අදහසින් ගෙවීමේ උපක්‍රමයක් භාවිත කරමින් මුදල් හෝ භාණ්ඩ ලබා ගන්නා;

(ණ) මේ වගන්තියේ ඉහතින් ම වූ ඡේදවල සඳහන් ක්‍රියා වලින් යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ එහි නියැලීමට යම් ප්‍රතිඡ්ඨාවක් සඳහා හෝ අන්‍යාකාරයකට වෙනත් තැනැත්තකු පොළඹවන, කැමති කරවා ගනු ලබන, අවසර දෙන හෝ යම් ආකාරයකින් වෙනත් තැනැත්තකුට ඉඩ දෙන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) මහාධිකරණයක් ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන යම් තැනැත්තෙක්-

(i) (අ),(ආ),(ඇ), (ඈ), (ඉ), (උ), (ඌ),(එ), (ඒ) හෝ (ඩ) යන ඡේද යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්ලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය;

(ii) (ඔ) හෝ (ට) ඡේද යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දෙලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය;

(iii) (ඊ), (ඕ), (ක), (ග), (ච), හෝ (ජ) ඡේද යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වරද සංයුක්ත වන ක්‍රියාව සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලබාගත් මුදලේ වටිනාකමේ පස් ගුණය හෝ වරද සංයුක්ත වන ක්‍රියාව සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලබාගත් මූල්‍ය වාසියේ පස්ගුණයක් යන දෙකෙන් වඩා වැඩි මුදලට සමාන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය;

(iv) (ණ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වනවිට, වරදකරු විසින් වෙනත් තැනැත්තකු පොළඹවන්නේ, කැමතිකරවා ගනු ලබන්නේ, අවසර දෙන්නේ හෝ ඉඩ දෙනු ලබන්නේ යම් වරදක් සිදු කිරීම සඳහා ද එම වරද සඳහා නියම කර ඇති දඬුවම මෙන් එකහමාරක් වූ දඩයකට ඔහු යටත් විය යුතු ය.

4. මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීමට තැත්කරන හෝ එවැනි වරදක් සිදු කිරීමට කටයුතු සළස්වන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී එම වරද හෝ වැරදි සඳහා නියමිත උපරිම දඩයෙන් හරි අඩකට වැඩි නොවන දඩයකට හෝ එකී එක් එක් වරද සඳහා නියමිත උපරිම කාල සීමාවේ හරි අඩකට වැඩි නොවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

5. (1) මේ පනත යටතේ වූ වරදක් සිදුකිරීමෙහි ලා අනුබල දෙන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේදී-

(අ) අනුබල දෙනු ලැබූ වරද සිදු කරනු ලැබුවේ අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් නම්, එම වරද සඳහා විධිවිධාන සලසා ඇති දඬුවමට ම ඔහු යටත් විය යුතු ය ; සහ

(ආ) වරද සිදු කරනු නොලැබුවේ අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් නම්-

(i) උපරිම දඩයක් හෝ බන්ධනාගාර ගත කිරීමේ කාලයක් නිමකර ඇති අවස්ථාවක, එම වරද සඳහා විධිවිධාන සලසා ඇති උපරිම දඩයේ හතරෙන් එකකට වැඩි නොවන දඩයකට හෝ එම වරද සඳහා විධිවිධාන සළසා ඇති උපරිම බන්ධානාගාරගත කිරීමේ කාලයේ හතරෙන් එකකට වැඩි නොවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන්

එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය;

(ii) උපරිම දඩය හෝ බන්ධනාගාරගත කිරීම නියමකර නොමැති අවස්ථාවක, රුපියල් දෙලක්ෂ පනස්දාහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) ''අනුබලදීම'' යන යෙදුමට (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 100 සහ 101 යන වගන්තිවල ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු අතර, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීමට අනුබල දීමට අදාළව දණ්ඩ නීති සංග්‍රහයේ 101අ,103, 104,105, 106 සහ 107 යන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

6\. (1) මේ පනත යටතේ වරදක් සිදුකිරීමට කුමන්ත්‍රණය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහාධිකරණය ඉදිරියේ වූ නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට, ඔහු වරද සිදු කිරීමට අනුබලදීම සම්බන්ධයෙන් නියමිත දඬුවම සඳහා යටත් විය යුතු ය.

(2) ''කුමන්ත්‍රණය කිරීම'' යන යෙදුමට (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 113අ (2) වන වගන්තියේ දී ඇති අර්ථ ය ම තිබිය යුතු අතර, ඒ වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමට අදාළ විය යුතු ය.

## II කොටස

## විමර්ශනය

7\. මේ පනතේ අන්‍යාකාරයකට විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනත යටතේ වූ සියලු වැරදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව විමර්ශනය කිරීම, විභාග කිරීම හෝ ඒවා සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් ක්‍රියා කිරීම සිදු කළ යුතු ය.

8\. (1) මේ පනත යටතේ වූ වරදක් පිළිබඳ සියළු විමර්ශන වල දී පොලීසියට සහායවීම සඳහා (මෙහි මින් මතු ''විශේෂඥයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යුත් ඉංජිනේරු ශිල්පයේ හෝ මෘදුකාංග ඉංජිනේරු ශිල්පයේ හෝ අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන වෙනත් විශේෂඥ ක්ෂේත්‍රවල නියමිත සුදුසුකම් ඇති තැනැත්තන් අතුරින් තෝරාගනු ලබන විශේෂඥ මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (විද්‍යුත් ඉංජිනේරු ශිල්පයේ හෝ මෘදුකාංග ඉංජිනේරු ශිල්පයේ නිශ්චිත විශේෂඥ ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන) විශේෂඥයන් වශයෙන් සේවය කරන තැනැත්තන් වෙත තිබිය යුතු සුදුසුකම්, ඔවුන්ගේ පත් කිරීමේ ක්‍රමය සහ ආකාරය සහ එම විශේෂඥයන්ගේ පත්වීම් කොන්දේසි නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා ''විශේෂඥයා'' යන යෙදුමට යම් තැනැත්තකු, ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු බව සැකදුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(4) මේ පනත යටතේ වූ විමර්ශනයක කාර්ය සඳහා, යම් විමර්ශනයක දී පොලීසියට සහාය වීමට කැඳවනු ලැබූ විශේෂඥයකුට-

(අ) උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක පොලිස් නිලධරයකු සමඟ යම් පරිශ්‍රයකට ඇතුළුවීම සඳහා;

(ආ) යම් තොරතුරු පද්ධතියකට, පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට හෝ එවැනි පරිගණකයක ඇති යම් වැඩ සටහනකට, දත්ත වලට හෝ තොරතුරුවලට ප්‍රවේශ වී වංචාව සිදු කිරීම සඳහා භාවිත කළ යම් පරිගණකයක් හෝ වෙනත් යම් උපකරණයක් මගින් තත් කාර්ය සඳහා අවශ්‍ය ආකාරයට යම් කර්තව්‍යයක් ඉටු කිරීමට;

(ඇ) එම විමර්ශනයේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් ලේඛනයක්, තොරතුරු, උපක්‍රමයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට;

(ඈ) හුවමාරු කරනු ලැබූ යම් දත්තයන් හෙළිකරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට;

(ඉ) යම් තැනැත්තකුගෙන් වාචිකව ප්‍රශ්න කිරීමට; සහ

(ඊ) මේ පනතේ කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන සියළු ක්‍රියා ඉටුකිරීමට, බලය තිබිය යුතු ය.

(5) විශේෂඥයකුට, මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් පරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීමේ දී යම් පොලිස් නිලධරයකුට සහායවීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරන ලද විශේෂඥයකු කැඳවනු ලැබිය හැකි අතර, එම විමර්ශනයේ කාර්ය සඳහා අවශ්‍ය වන සියලු සහාය ලබාදීම එම විශේෂඥයාගේ කාර්යය වන්නේ ය. යම් විමර්ශනයක දී සොයාගත් කරුණු වල ප්‍රතිඵලයක් වශයෙන්, යම් නීති කෘත්‍ය ආරම්භ වී ඇති අවස්ථාවක, එම විමර්ශනය අතරතුරදී ඔහු විසින් සොයා ගෙන ඇති යම් තොරතුරු, දත්ත, කරුණු හෝ වෙනත් කාරණා එම නීති කෘත්‍යයේ කාර්ය සඳහා ලබා දීම ද එම නීති කෘත්‍යයේ දී සාක්ෂිදීම සඳහා කැඳවනු ලැබූ විට එසේ සාක්ෂි දීම ද එම විශේෂඥයාගේ කාර්යය වන්නේ ය.

9. (1) යම් විමර්ශනයක් අතරතුර දී යම් සෝදිසි කිරිමක්, පරීක්ෂා කිරීමක් හෝ වෙනත් යම් දෙයක් සිදු කරන සෑම පොලිස් නිලධරයකු සහ සෑම විශේෂඥයකු විසින් ම එම සෝදිසි කිරීම, පරීක්ෂණය හෝ විමර්ශනය මගින් අත්කර ගන්නා ආයතනයේ අළෙවි මධ්‍යස්ථාන ජාලය හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය මගින් සිදු කරනු ලබන සාමාන්‍ය නීත්‍යානුකූල ව්‍යාපාර කටයුතුවලට බාධාවක් නොවන බවට වගබලා ගැනීම සඳහා ඒ පොලිස් නිලධරයා සහ විශේෂඥයා සෑම උත්සාහයක් ම දැරිය යුතු අතර -

(අ) එම ජාලය හෝ එහි කොටසක් පිහිටා ඇති පරිශ්‍රයේ දී පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි නම් මිස; හෝ

(ආ) වරද සිදු කිරීම හෝ දිගට ම සිදු කිරීම වැළැක්වීම සඳහා එම ජාලය හෝ එහි කොටසක් තහනමට ගැනීම අත්‍යවශ්‍ය වන්නේ නම් මිස හෝ අන්‍යාකාරයකට නැතිවිය හැකි, විනාශ කළ හැකි, වෙනස් කළ හැකි හෝ ප්‍රවේශය ලබා ගත නොහැකි විය හැකි යම් තොරතුරුවල භාරකාරත්වය ලබා ගැනීම සඳහා මිස,

එම ජාලය භාවිතා කරනු ලබන්නේ යම් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ද එම ව්‍යාපාර කටයුතුවලට එම තහනම මගින් අගතියක් සිදු වන්නේ නම්, අත්කරගන්නා ආයතනයේ එම අළෙවි මධ්‍යස්ථානය හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය තහනමට නොගත යුතු ය.

(2) මේ පනත යටතේ විමර්ශනයක් සිදු කරන යම් පොලිස් නිලධරයකු හෝ විශේෂඥයකු විසින් අවස්ථානුගත කරුණු අනුව ඉඩ ලැබෙන පරිදි හැකිතාක් ඉක්මණින් එම විමර්ශනය පවත්වා අවසන් කළ යුතු ය.

10. (1) මේ පනත යටතේ වූ විමර්ශනයක් අතරතුර දී, යම් පොලිස් නිලධරයකු විසින් නීතිය මගින් විධිවිධාන සළසා ඇති ආකාරයට සිරභාරයට ගැනිමේ, සෝදිසි කිරීමේ හෝ තහනමට ගැනීමේ බලතල ක්‍රියාත්මක කළ යුතු ය:

එසේ වුවද, මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීම පිළිබඳව සැකකරන තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගන්නා පොලිස් නිලධරයකු විසින්, එම තැනැත්තා සිරභාරයට ගත් ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවීම දක්වා වූ ගමනට ගතවන කාලය හැර, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ එසේ සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත, සැකකරු සිරභාරයට ගනු ලැබූ ස්ථානයට ආසන්නතම මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වෙත එම සැකකරු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) යම් පොලිස් නිලධරයකුට තොරතුරු සංනිවේදන තාක්ෂණය හෝ විද්‍යුත් ඉංජිනේරු ශිල්පය හෝ මෘදුකාංග ඉංජිනේරු ශිල්පය හෝ යන ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ දක්ෂතා ඇති බවටත් යම් පරිගණකයකට හෝ අත්කර ගන්නා ආයතනයේ අළෙවි මධ්‍යස්ථාන ජාලයකට හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයකට ප්‍රවේශවීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම ඇති බවට පොලිස්පතිවරයා විසින් ලිඛිතව සහතික කර ඇත්නම් මිස, යම් විමර්ශනයක කාර්ය සඳහා කිසිම පොලිස් නිලධරයකු විසින් ගෙවීම් උපක්‍රමයකට, පරිගණකයකට අත්කරගන්නා ආයතනයේ අළෙවි මධ්‍යස්ථාන ජාලයට හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයකට ප්‍රවේශ නොවිය යුතු ය.

11. (1) මේ පනත යටතේ වූ යම් විමර්ශනයක දී යම් කරුණු හෙළිකිරීමක් සිදු කිරීමට හෝ සහාය වීමට විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින් නියම කරනු ලබන යම් තැනැත්තකු විසින් එම නියමයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(2) යම් විමර්ශනයක් අතරතුර දී, විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු වෙත පවරන ලද බලතල නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට බාධා කරන හෝ එම විශේෂඥයා හෝ පොලිස් නිලධරයා විසින් කරනු ලබන යුක්ති සහගත ඉල්ලීමකට අනුකූලව ක්‍රියා කිරිම පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ අවරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

12. (1) මේ පනත යටතේ වූ විමර්ශනයක යෙදී සිටින සෑම තැනැත්තකු විසින් ම, එම විමර්ශනය අතරතුර දී තමාට දැන ගැනීමට ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් සම්පූර්ණ රහස්‍යභාවය පවත්වා ගෙන යා යුතු අතර, මේ පනත යටතේ සිය කාර්ය ඉටු කිරීමේ දී හැර, එම තැනැත්තා විසින් එසේ ලබාගත් යම් තොරතුරක් කවර හෝ කාර්යයක් සඳහා භාවිත කිරිම හෝ වෙනත් තැනැත්තකුට හෙළි කිරීම නොකළ යුතු ය.

(2) යම් තොරතුරක් ඉල්ලා ඇත්තේ හෝ ලබාගෙන ඇත්තේ යම් තැනැත්තකුගෙන් ද එවැනි සෑම තැනැත්තකු ම සහ යම් තොරතුරක් ආරක්ෂා කිරිම සඳහා ලිඛිත දැන්වීමක් නිකුත් කර ඇති සෑම තැනැත්තෙක් ම එම තොරතුරුවලට අදාළව සහ එම තොරතුරු ඉල්ලා ඇති බව, ලබා ගෙන ඇති බව සහ ආරක්ෂා කිරීමට නියම කර ඇති බව පිළිබඳව තදින් ම රහස්‍යභාවය රැකිය යුතු අතර, යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව නියම කළ විට හැර එම කරුණු කිසිම තැනැත්තකුට හෙළි නොකළ යුතු ය.

(3) මේ පනත යටතේ වූ විමර්ශනයක කාර්ය සඳහා යම් දත්තයන් හෝ වෙනත් තොරතුරු හෙළිකිරීම සඳහා මේ වගන්තියේ සඳහන් තැනැත්තකු සිවිල් හෝ අපරාධ නීතිය යටතේ වගකිව යුතු නොවන්නේ ය.

(4) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් තුන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

13. මේ පනත යටතේ වූ වරදක් සඳහා වූ යම් නඩු විභාගයක් අතරතුර දී චූදිතයා විසින් ඇත්ත වශයෙන් සිදු කර ඇති වරද ඔහු වෙත චෝදනා කර ඇති වරදට වඩා වෙනස් වරදක් බව හෝ ඔහු වෙත චෝදනා කර ඇති වරදට වඩා අඩු වරදක් බව සාක්ෂි මගින් පෙනී යන අවස්ථාවක අධිකරණය විසින් සිය අභිමතය පරිදි අධිචෝදනා පත්‍රය වෙනස් කළ හැකි අතර, එසේ වෙනස් කිරීමෙන් පසු වෙනස් කළ අධිචෝදනා පත්‍රය මුල් අධිචෝදනා පත්‍රය ලෙස සලකා නඩු විභාගය පවත්වාගෙන යා හැකි ය.

14. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයෙක් සහ නිලධරයෙක් ම; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම, එම වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද එම වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ හෝ ඇයගේ අනුදැනුම නොමැතිව බවට හෝ ඔහු හෝ ඇය එම වරද සිදුවීම වැලැක්වීම සඳහා අවශ්‍ය නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු ඔප්පු කරන්නේ නම්, එම පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

15. මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් සඳහා අධිකරණය විසින් දඩයක් පනවනු ලබන අවස්ථාවක -

(අ) අයකරගනු ලැබූ සම්පූර්ණ දඩය හෝ එහි කොටසක්, අලාභ සිදු වූ ගෙවීම් උපක්‍රම නිකුත් කරන ආයතනයට හෝ අලාභ සිදු වූ වෙනත් යම් තැනැත්තකුට එම අලාභය සඳහා වූ වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු බවට; සහ

(ආ) අධිකරණය විසින් අන්‍යාකාරයකට විධාන කරන්නේ නම් මිස, විමර්ශනය අතරතුර දී පොලීසිය විසින් තහනමට ගනු ලැබූ සියලු මුදල්, අයිතම හෝ දේපල, ඒවායේ නීත්‍යානුකූල අයිකරු වශයෙන් ගෙවීම් උපක්‍රමය නිකුත් කළ ආයතනයට හෝ එම මුදල් අයිතම හෝ දේපලවල නීත්‍යානුකූල අයිතිය ඔප්පු කළ තැනැත්තාට ආපසු භාර දිය යුතු ය.

16. (1) ගෙවීම් උපක්‍රමයකට අදාළව ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඇති සහ නිකුත් කරන හෝ අත්කර ගන්නා ආයතනයක සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී එම නිකුත් කරන හෝ අත්කර ගන්නා ආයතනය විසින් ලිඛිතව හෝ විද්‍යුත්, චුම්බක, දෘෂ්‍ය හෝ වෙනත් යම් ආකාරයකට තොරතුරු පද්ධතියක හෝ පරිගණකයක හෝ ගෙවීම් උපක්‍රමයක ගබඩා කර තබා ඇති යම් සටහනක සහතික කළ පිටපතක්, මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමකට අදාළව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ යුතු අතර, එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතුය.

(2) සෑම ලේඛනයක්, සහතිකයක්, වාර්තාවක්, රෙජිස්ටරයක් හෝ එහි උධෘතයක්, ශ්‍රී ලංකාවේ හෝ පිටරට විශේෂඥයකු විසින් යථා පරිදි අත්සන් කර නිකුත් කර ඇත්නම් සහ එම ලේඛනය, සහතිකය, වාර්තාව, රෙජිස්ටරය හෝ එහි උධෘතය අදාළ වන්නේ යම් නිකුත් කරන ආයතනයක හෝ අත්කර ගන්නා ආයතනයක ගනුදෙනුවලට ද නැතහොත් සම්බන්ධතාවලට ද එම නිකුත් කළ ආයතනයේ හෝ අත්කර ගන්නා ආයතනයේ ජ්‍යෙෂ්ඨ විධායකයකු විසින් එම ලේඛනය, සහතිකය, වාර්තාව, රෙජිස්ටරය හෝ උධෘතය යථා පරිදි සත්‍යායනය කරනු ලැබ ඇත්නම් ඒවා ඒවායේ සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය.

(3) ඉහත (1) වන උපවගන්තියෙහි ''සහතික කළ පිටපතක්'' යන්නෙන් එය සත්‍ය පිටපතක් බවට සහතික කරමින් නිකුත් කරන හෝ අත්කර ගන්නා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ එහි යම් බලයලත් නියෝජිතයකු විසින් එම සටහනේ පිටපතේ අවසානයට ලියා ඇති සහතිකයක් සහිත පිටපතක් අදහස් වන අතර, එවැනි සටහනක් තොරතුරු පද්ධතියක හෝ පරිගණකයක ගබඩා කර ඇති අවස්ථාවක, අදාළ තොරතුරු පද්ධතියේ හෝ පරිගණකයේ ක්‍රියාකාරීත්වයට අදාලව, වගකිය යුතු තනතුරක් දරන නිලධරයකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද එම සටහනේ මුද්‍රිත පිටපතක් අදහස් වේ.

(4) සාක්ෂි ආඥා පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, 3 වන වගන්තිය යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීම්වලට ඒවා අදාල විය යුතු ය.

17. (අ) ව්‍යාජ හෝ අනවසර ගෙවීම් උපක්‍රමයක්;

(ආ) නීත්‍යානුකූල බලයක් නොමැතිව යම් කාඩ් සෑදීමේ උපකරණයක් හෝ කාඩ් වෙනස් කිරීමේ උපකරණයක්;

(ඇ) දරන්නාගේ හෝ නිකුත් කළ ආයතනයේ අනුමතය නොමැති ගෙවීම් උපක්‍රමයක්;

(ඈ) නීත්‍යානුකූල බලයක් නොමැතිව ගෙවීම් උපක්‍රමයක් භාර ගැනීම හෝ පිරිසැකසුම් කිරීම සඳහා භාවිත කරනු ලබන යම් උපකරණයක්,

තම සන්තකය, භාරකාරත්වය සහ පාලනය යටතේ ඇති යම් තැනැත්තෙක් ඊට පටහැනිව කරුණු ඔප්පු කරන තුරු, එම ගෙවීම් උපක්‍රමය හෝ උපකරණය තම සන්තකය, භාරය හෝ පාලනය යටතේ තබාගෙන සිටියේ මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමේ කාර්ය සඳහා බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

18. (අ) නිකුත් කළ ආයතනය විසින් අවසර දී ඇති කාලය තුළ එම ණයවර කාඩ්පත හෝ ගෙවීම් උපක්‍රමය නිකුත් කළ ආයතනයට අයවිය යුතු සම්පූර්ණ මුදල ගෙවීම පැහැර හැර ඇති; සහ

(ආ) ණයවර කාඩ්පත හෝ ගෙවීම් උපක්‍රමය නිකුත් කළ ආයතනයට දැනුම් නොදී එම ණයවර කාඩ්පත හෝ ගෙවීම් උපක්‍රමය ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තම වාසස්ථානය හෝ රැකියා ස්ථානය වෙනස් කරන,

ණයවර කාඩ් පතක් හෝ ගෙවීම් උපක්‍රමයක් දරන්නකු විසින්, එම කාඩ්පත හෝ උපක්‍රමය නිකුත් කළ ආයතනයට සිතාමතා වංචා කිරීමේ අදහසින් එසේ කර ඇති බවට පූර්ව නිගමනය කළ යුතු ය.

19. 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක් සම්බන්ධයෙන් ම නඩු විභාග ආඥාක්‍රම ව්‍යවස්ථාවේ 154, ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් විභාග කරනු ලැබිය යුතු ය.

20. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක් ම, එම පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

21. මේ පනත යටතේ යම් විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී එම විශේෂඥයාට හෝ පොලිස් නිලධරයාට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම විශේෂඥයාට හෝ පොලිස් නිලධරයාට ඇරීමට සිදු වූ යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බවට අධිකරණය තීරණය කරන්නේ නම්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම මුදල ඔහු විසින් අයකර ගනු ලැබුවේ නම් මිස, එම මුදල අවස්ථාවෝචිත පරිදි නිකුත් කරන ආයතනයේ හෝ අත්කර ගන්නා ආයතනයේ මුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

22. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ප්‍රපන පනතේ උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(48)2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පනතේ අර්ථානුකූලව වූ වරදක්."

23. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ප්‍රපන පනතේ කුමක් සඳහන් වුව ද, එම පනත යටතේ උද්ප්‍රපනය කිරීම සඳහා පමණක් මේ පනත ප්‍රකාර වූ වරදක් මූල්‍ය වරදක් ලෙස හෝ දේශපාලන ස්වභාවයේ වරදක් ලෙස හෝ දේශපාලන වරදකට සම්බන්ධ වරදක් ලෙස හෝ දේශපාලන අරමුණු වලින් පොළඹවන ලද වරදක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

24. මේ පනත යටතේ වූ වරදකට චෝදනා ලැබ සිටින හෝ වරදකරු වී සිටින යම් තැනැත්තකු උද්ප්‍රපනය කිරීම සඳහා වෙනත් රටක ආණ්ඩුවක් විසින් හෝ එය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, එම වරද සඳහා එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සඳහා හෝ ඔහු උද්ප්‍රපනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජිත පියවර පිළිබඳව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටි රාජ්‍යයේ ආණ්ඩුව වෙත වහාම දැනුම් දිය යුතු ය.

25. (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් විමර්ශනය කිරීම හා ඒ සඳහා නඩු පැවරීම සඳහා අවශ්‍ය වන කවර හෝ අවස්ථාවක දී, 2002 අංක 25 දරන අපරාධ කාරණාවල දී අන්‍යෝන්‍ය සහාය ලබාදීමේ පනතේ විධිවිධාන, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අතර හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ගිවිසුමකට එළඹ ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් නොවන රටවල් සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අතර ද සහාය ලබාදීම සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන්නා වූ හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගිවිසුමකට එළඹ ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය නොවන රටක් හෝ සම්බන්ධයෙන් වන විට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ වගකීම් ඉටු කිරීමේ කාර්ය සඳහා වනතාක් දුරට, 3 වන වගන්තිය යටතේ වූ වරදක් විමර්ශනය කිරීම සහ ඒ සඳහා නඩු පැවරීම සඳහා (සාක්ෂි සහ ප්‍රකාශ ලබා ගැනීම, සිතාසි භාරදීම සහ සෝදිසි මෙහෙයුම් කිරීමට අදාල සහාය ඇතුලු) සියලු සහාය ලබාදීම ද අමාත්‍යවරයා හරහා අවශ්‍ය සියලු ආධාර ඉල්ලා සිටීම ද ශ්‍රී ලංකා ආණ්ඩුවේ කාර්යය වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සුදුසු යයි සලකන නියම සහ කොන්දේසිවලට යටත්ව රාජ්‍යයකට සහාය ලබා දීම සිදු කළ හැකි ය.

26. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදක් සඳහා සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක එම තැනැත්තාට-

(අ) තමා පුරවැසියකු වන රාජ්‍යයේ හෝ අන්‍යාකාරයකට තමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හිමිකම් ඇති රාජ්‍යයේ නැතහොත් ඔහු රාජ්‍යයක් නොමැති පුද්ගලයකු නම් ඔහු නිතර පදිංචිව සිටින ප්‍රදේශය අයත් රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ ප්‍රමාදයකින් තොරව සංනිවේදනය කිරීමට; සහ

(ආ) එම රාජ්‍යයේ නියෝජිතයා තමන් වෙත ගෙන්වා ගැනීමට,

හිමිකමක් ඇත.

(2) එසේ වුව ද, නිසි පරිදි ඉටු කිරීමට එයට හැකිවන පරිදි එම විධිවිධානවලට ප්‍රමාණවත් පරිදි අනුකූලව ක්‍රියා කර ඇත්නම් 25 වන වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමේ හේතුවෙන් 24 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් නීති කෘත්‍යයක කාර්ය සඳහා අවලංගු වී ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

27. (1) මේ පනත යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක, එම තැනැත්තා සම්බන්ධයෙන් 24 වන සහ 25 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කර ඇති යම් රාජ්‍යයක අදාල බලධාරීන් වෙත, එම තැනැත්තාට නඩු පැවරීම සඳහා හෝ ඔහු උදර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලබන හෝ ගැනීමට යෝජිත පියවර පිළිබඳව දැනුම් දෙන ලෙස මේ පනතේ පරිපාලනය භාරව සිටින අමාත්‍යවරයා විසින් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදකට අනුරූප වරදක් සඳහා චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා යම් රාජ්‍යයක ආණ්ඩුවක් විසින් හෝ එය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සඳහා හෝ ඔහු උදර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගැනීමට යෝජිත පියවර පිළිබඳව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් ඉල්ලා සිටින රාජ්‍යයේ ආණ්ඩුව වෙත වහාම දැනුම් දිය යුතු ය.

(3) උදර්පන පනත යටතේ උදර්පනය කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව මේ පනත යටතේ වූ වරදකට අනුරූප වරදක් සඳහා චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තෙක් උදර්පනය කිරීම සඳහා 1977 අංක 8 දරන උදර්පන පනත යටතේ කිසිදු නියමයක් නොකළ යුතු බවට තීරණය කරනු ලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වරද සඳහා නඩු පැවරීම හෝ වෙනත් උචිත ක්‍රියා මාර්ගයක් සලකා බැලීම සඳහා නීති බලාත්මක කිරීමේ බලධාරීන් වෙත මෙම කරුණ ඉදිරිපත් කළ යුතු ය.

28. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුව අතර උදර්පන වැඩ පිළිවෙලක් බලාත්මකව පවතින අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන නීතියේ කාර්ය සඳහා එම වැඩ පිළිවෙල මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සහ එම වරද සිදු කිරීමට තැත් කිරීම හෝ සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් හෝ එම වරද සිදු කිරීමට ආධාර අනුබල දීම ද උදර්පනය සඳහා විධිවිධාන ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

29. මේ පනත යටතේ වූ වරදකට අනුරූප වූ යම් විදේශ රාජ්‍යයක නීතිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව එම රාජ්‍යයේ පවරා ඇති අපරාධ නඩුවක් සම්බන්ධයෙන් එම විදේශ රාජ්‍යයේ අදාළ බලධාරීන්ට (ආණ්ඩුව වෙත ඇති අදාළ සාක්ෂි සැපයීම ඇතුළු) සහාය ලබා දිය යුතු ය.

30. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා සහ මේ පනත මගින් නියම කිරීමට නියම කර ඇති හෝ බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

31. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි :-

''අත්කර ගන්නා ආයතනය'' යන්නෙන්, වෙළෙඳුන් විසින් භාරගන්නා ලද ගෙවීම් උපක්‍රම සඳහා මුදල් නිෂ්කාශනය කර සහ ලබන මුදල අත්කර ගන්නා ආයතනය විසින් ආපසු ගෙවන්නා වූ ද ගෙවීම් උපක්‍රම ගනුදෙනු භාරගැනීමට වෙළෙඳුන් පත් කිරීමට බලය පැවරී ඇති හෝ ගෙවීම් උපක්‍රම දරන්නන්ට මුදල් බෙදා හැරීමේ සේවා සපයන්නා වූ ද, නැතහොත් එම සේවා දෙකම සපයන්නා වූ ද වෙළෙඳුන් පත් කරන බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් අදහස් වේ;

''බලය පැවරීම'' යන්නෙන්, ගෙවීම් උපක්‍රම ගණුදෙනුවක් සඳහා අත් කර ගන්නා ආයතනයක් විසින් නිකුත් කරන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය අදහස් වේ. බලය පැවරීමේ ක්‍රියාවලිය හඬ හඳුනා ගැනීමෙන් හෝ විද්‍යුත් මාර්ගයෙන් සිදුවිය හැක;

''කාඩ්පත් දරන්නා'' යන්නෙන්, නිකුත් කරන ආයතනය විසින් ගෙවීම් උපක්‍රම නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකු හෝ සංවිධානයක් වෙත ද නැතහොත් යම් තැනැත්තකුගේ හෝ සංවිධානයක ප්‍රතිලාභ උදෙසා ද එම ගෙවීම් උපක්‍රමයේ නම සඳහන් වන එම තැනැත්තා හෝ සංවිධානය අදහස් වේ.

'ව්‍යාජ ගෙවීම් උපක්‍රම' යන්නෙන්,ව්‍යාජ, සාවද්‍ය, වෙනස් කරන ලද හෝ ව්‍යාජ ලෙස සකස් කරන ලද ගෙවීම් උපක්‍රමයක් හෝ ගෙවීම් උපක්‍රමයක හඳුනාගත හැකි ව්‍යාජවන සංයෝජ්‍ය කොටසක් අදහස් වේ; ක්‍රමයක් අදහස් වේ;

''කාඩ් සෑදීමේ හෝ වෙනස් කිරීමේ උපකරණය'' යන්නෙන්, යම් ගෙවීම් උපක්‍රමයක් මත දත්ත එම්බෝස් කිරීම, දත්ත සටහන් කිරීම, දත්ත වාර්තා කිරීම හෝ ගබඩා කිරීම සඳහා භාවිතා කරනු ලබන අතින් ක්‍රියාකරවන හෝ විද්‍යුත් චුම්බක සහිත හෝ විද්‍යුත් ක්‍රමයට අනුව වූ සම්පූර්ණ උපකරණයක් හෝ යන්ත්‍රයක් හෝ එහි කොටසක් අදහස් වේ. තවද, එම උපකරණය ව්‍යාජ ගෙවීම් උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා ද භාවිතා කළ හැකිය;

''පරිගණකය'' යන්නෙන්, තොරතුරු පිරිසැකසුම් කිරීමේ හැකියාව ඇති විද්‍යුත් හෝ සමාන උපක්‍රමයක් අදහස් වේ;

''දත්ත'' යන්නෙන්, පරිගණකයක හෝ ගෙවීම් උපක්‍රමයක භාවිතය සඳහා සුදුසු ආකාරයට සකස් කරනු ලබන හෝ සකස් කර ඇති හෝ පරිගණකයක ගබඩා කර ඇති හෝ උත්පාදනය කරන හෝ තොරතුරු හෝ සංකල්පවල නියෝජනයක් අදහස් වේ;

''වංචනික ඉල්ලුම් පත්‍රය'' යන්නෙන්, අසත්‍ය ලේඛන, අසත්‍ය තොරතුරු, ව්‍යාජ හැඳුනුම්පත් සහ ලිපිනයන් හෝ වෙනත් අසත්‍ය කරුණු හෝ වැරදි නියෝජන ඇතුලත් වන්නා වූ ද ගෙවීම් උපක්‍රමයක් නිකුත් කිරීමට නිකුත් කරන ආයතනය පොළඹ වන්නා වූ ද ගෙවීම් උපක්‍රමයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් අදහස් වේ;

''වංචනික වෙළෙඳ ඉල්ලුම් පත්‍රය'' යන්නෙන් වෙළෙන්දා විසින් ගෙවීම් උපක්‍රමය භාර ගන්නා බවට විශ්වාස කිරීමට සලස්වමින් අත්කර ගන්නා ආයතනය නොමග යැවීම සඳහා අසත්‍ය, වැරදි සහගත සහ නොමග යවන සුළු තොරතුරු භාවිත කරමින් වෙළෙන්දකු ලෙස පෙනී සිටිමින් යම් තැනැත්තකු පුද්ගල මණ්ඩලයක්, අස්ථිත්වයක් හෝ සංවිධානයක් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් අදහස් වේ.

''සම්පූර්ණ සටහන් පථයේ ඇති දත්ත'' යන්නෙන්, ගෙවීම් උපක්‍රමයක චුම්බක තීරුවේ පළවන සහ දෙවන සටහන් පථය මත සටහන් කර ඇති අභිමතානුසාර දත්ත ඇතුළු දත්ත අදහස් වේ;

''දරන්නා'' යන්නෙන්, නිකුත් කරන ආයතනයක් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත ගෙවීම් උපක්‍රමයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු අදහස් වේ;

''තොරතුරු'' යන්නට දත්ත, සඳහන් කර ඇති කරුණු, රූප, ශබ්දය, සංකේත, පරිගණක වැඩ සටහන්, දත්ත මූලාශ්‍ර හෝ මයික්‍රොෆිල්ම් ඇතුළත් වේ;

''තොරතුරු පද්ධතිය'' යන්නට මහජනයා, යන්ත්‍ර, සහ ක්‍රමවේදවලින් සංයුක්ත වන්නා වූ ද හඬ හෝ දත්ත නැතහොත් ඒ දෙකම එකතු කිරීමට, පිරිසැකසුම් කිරීමට, ගබඩා කිරීමට ඊට අදාළව ක්‍රියා කිරීමට, කළමණාකරණය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, ප්‍රදර්ශනය කිරීමට, බෙදා හැරීමට, ක්‍රියාත්මක කිරීමට, හුවමාරු කිරීමට හෝ ලබා ගැනීමට භාවිත කරනු ලබන්නා වූ ද (විදුලි සංදේශ, පරිගණක හෝ පරිගණකවලට අදාළ හෝ අන්තර් සම්බන්ධතා ඇති පද්ධතියක් හෝ උප පද්ධතියක් හෝ ඒ පද්ධතිය හෝ උපපද්ධතිය යන දෙකම ඇතුළු) ස්වයංක්‍රීය හෝ අතින් ක්‍රියා කරන පද්ධතියක් ඇතුළත් වන අතර ඊට මෘදුකාංග, ෆර්ම් වෙයාර් සහ දෘඩකාංග ද ඇතුළත් වේ ;

''නිකුත් කරන ආයතනය'' හෝ ''නිකුත් කළ ආයතනය'' යන්නෙන්, ගෙවීම් උපක්‍රමයක් නිකුත් කිරීමට හා එමගින් ගෙවීම් උපක්‍රමය දරන්නා සමග ගිවිසුම් සම්බන්ධතාවයට ඇතුළත්වීමට නීත්‍යානුකූලව බලය පැවරී ඇති බැංකු ආයතනයක් හෝ වෙනත් මණ්ඩලයක්, අධිකාරියක් හෝ ආයතනයක් අදහස් වේ;

''වෙළෙන්දා'' යන්නෙන්, ගෙවීම් උපක්‍රමයක් පිළිගැනීම මත භාණ්ඩ හා සේවා විකිණීමට ද මුදල් ලබාදීමට ද නිකුත් කරන ආයතනයක් විසින් පිළිගන්නා ලද තැනැත්තකු හෝ සංවිධානයක් අදහස් වේ.

''ගෙවීම් උපකරණය'' යන්නෙන්-

(අ) ණයවර කාඩ් පතක් අදහස් වන අතර ඊට චුම්බක දත්ත යොදා ඇති යම් කාඩ්පතක්, තහඩුවක්, සංකේතයක්, ගිණුම් අංකයක්, මයික්‍රොචිප්ස්, දෘශ්‍ය උපකරණයක් හෝ ලේඛනයක් ද ඇතුළත් වේ; හෝ

(ආ) එම ගෙවීම් උපක්‍රමය දරන්නාට අදාළ ගිණුම් අංක සහ විධානාත්මක හෝ අභිමතානුසාර දත්ත හෝ තොරතුරු යාන්ත්‍රික, විද්‍යුත්, විද්‍යුත් චුම්භක, දෘශ්‍ය හෝ වෙනත් ආකාරයකට වාර්තාගතකර සහ ගබඩා කර ඇති වූ ද උපක්‍රමයක් අදහස් වන අතර එම කාඩ්පත හෝ උපක්‍රමය නිකුත් කළ ආයතනය විසින් පිළිගනු ලබන්නා වූ ද, එම කාඩ්පත හෝ උපක්‍රමය නිකුත් කළ ආයතනය විසින් එය නීත්‍යානුකූලව නිකුත් කර ඇති දරන්නා විසින් හෝ ඔහු වෙත-

(i) භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම සඳහා ණය පහසුකම් සලසා දෙන්නා වූ ද; හෝ

(ii) මුදල් ලබා ගැනීමේ පහසුකම් ඇත්තා වූ සහ බැංකු ගිණුමකට අදාළ වෙනත් කටයුතු සිදු කරන්නා වූ ද,

කාඩ්පතක් හෝ ගෙවීම් උපක්‍රමයක් අදහස් වේ;

''ගෙවීම් උපක්‍රම දරන්නා පිළිබඳ තොරතුරු'' යන්නට ගෙවීම් උපක්‍රමය දරන්නාගේ ගිණුම් අංකය හෝ නම හෝ ලිපිනය වැනි ගෙවීම් උපක්‍රමය මත මුද්‍රණය කර ඇති, සටහන් කර ඇති හෝ එම්බෝස් කර ඇති යම් තොරතුරක් ඇතුළත් වේ;

''අළෙවි මධ්‍යස්ථානගත යන්ත්‍ර ජාලය'' යන්නෙන්, අත්කර ගන්නා ආයතනය විසින් සේවයේ යොදවා ඇති අළෙවි මධ්‍යස්ථානගත යන්ත්‍ර ජාලයක් අදහස් වේ;

''නිෂ්පාදනය කිරීම'' යන්නෙන් නිර්මාණය කිරීම, වෙනස් කිරීම, සත්‍යායනය කිරීම, පිටපත් කිරීම හෝ එකලස් කිරීම අදහස් වේ;

''ස්කිමිං'' යන්නෙන්, එක් ගෙවීම් උපක්‍රමයක චුම්බක තීරුව මත ඇති සටහන් කරන ලද දත්තයන්, සුදු ප්ලාස්ටික් ඇතුළු වෙනත් අව්‍යාජ හෝ ව්‍යාජ උපක්‍රමයකට පිටපත් කිරීම අදහස් වේ;

''ජාවාරම් කිරීම'' යන්නට ව්‍යාජ හෝ අනවසර ගෙවීම් උපක්‍රම එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නීත්‍යානුකූල බලයක් හෝ සාධාරණ නිදහසට කරුණක් නොමැතිව නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, මාරු කිරීමේ අදහස ඇතිව ළඟ තබාගෙන සිටීම, සඟවා තැබීම, මිල දී ගැනීම, විකිණීම, ලබා දීම, ලබා ගැනීම, ගබඩා කිරීම, පාලනය කිරීම, ප්‍රවාහනය කිරීම, රැගෙනයාම, යැවීම, භාරදීම, ප්‍රසම්පාදනය කිරීම, සැපයීම හෝ බෙදාහැරීම අදහස් වේ;

''හුවමාරුවන දත්ත'' යන්නෙන්-

(අ) තොරතුරු පද්ධතියක් හෝ පරිගණක පද්ධතියක් මගින් සංනිවේදනයක ගුණාංගවලට අදාළ දත්ත අදහස් වේ;

(ආ) සේවා සපයන්නකුගේ කොටසක් වන තොරතුරු පද්ධතියක් හෝ පරිගණක පද්ධතියක් මගින් උත්පාදනය වන දත්ත අදහස් වේ;

(ඇ) සංනිවේදන ආරම්භය, සංනිවේදනයේ අවසාන ස්ථානය, ගමන්මග, වේලාව, දත්ත, ප්‍රමාණය, කාලසීමාව හෝ ගනුදෙනුකරුගේ තොරතුරු පිළිබඳ විස්තර පෙන්වන දත්තයන් අදහස් වේ;

(ඈ) සංනිවේදන පද්ධතියක් හරහා ගලායන යම් දත්තයන් අදහස් වේ;

''අනවසර ගෙවීම් උපක්‍රම'' යන්නෙන්, සොරකම් කරන ලද, නැති වූ, කාලය ඉකුත් වූ, ප්‍රත්‍යාදිෂ්ට කරන ලද අවලංගු කරන ලද, අත්හිටුවන ලද හෝ කරුණු වැරදි ලෙස ඉදිරිපත් කිරීම මගින් ලබාගත් හෝ භාවිතා කරනු ලබන යම් ගෙවීම් උපක්‍රමයක් අදහස් වේ.